# THE WHITE HACKLE

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY



JULY 1997

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

# 1997 05 09 දින රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රීලපාහ හි කෝප්‍රල් සමාජ ශාලාවේ පැවති සාදය



1 1997 06 09 දින පැවති කෝප්‍රල් සමාජ ශාලාවේදී පැවති සාදය ආරම්භ කිරීමට පෙර රෙජිමේන්තු ගීතය ගායනා කරන අවස්ථාව

2 කෝප්‍රල් සමාජ ශාලාවේදී පැවති සාදයේදී ආරාධිත අමුත්තා හා රෙජිමේන්තු සැරයන් මේජර් භෝජන සංග්‍රහයට සහභාගි වීම

3 ලුතිනන් කර්නල් ඒකේඩීජේපී සිරිවර්ධන ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ පැමිණ සිටි සියලුම නිලයින් ඇමතීම

4 කෝප්‍රල් සමාජ ශාලාවේදී පැවති සාදයේ එක් විශේෂ අවස්ථාවක්







# THE WHITE HACKLE

JULY 1997, VOLUME 04 NO. 03



"ජයසිකුරු ක්‍රියාත්විතයේ පෙරමුණගත් 3 ශ්‍රීලපාහ

පිටුව 03



රෙජිමේන්තු අධිපති සැම ඇමතීම

පිටුව 21



තල් අරඹ

පිටුව 34

## Headlines

ජයසිකුරු ක්‍රියාත්විතයේ පෙරමුණගත් 3 ශ්‍රීලපාහ 3

"වැලිකතරක" දා බිඳ හෙලූ සෝදිසි මෙහෙයුම 6

සතුරත් සොයා සැඩ සුලග හැමුවද 9

8 වන බලඇණිය ශ්‍රීලපාහි "ඒ" කණ්ඩායම අලිමංකඩ ස්ථානගත වීම 11

9 (සෙව්) ශ්‍රීලපාහි "බී" කණ්ඩායම තෙවන ඊලාම් යුද්ධයේ දායකත්වය 15

ශ්‍රීලපාහ 6 වන බලැඇණිය කයිට්ස් වැසියන් අතරේ 18

Whats New 24

ප්‍රීතිමත් ජීවිතයකට මාර්ගය 27

මනෝ විද්‍යාත්මක යුද ශිල්පය 30

උතුරේ හා නැගෙනහිර ඉපැරණි බෞද්ධ නටඹුන් 32

**FRONT COVER :**

1997.05.30 දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරී නිවස්නයේ පැවැති සාදයේ සමූහ ඡායාරූපය

PRINT WELL (PVT) LTD.

THE WHITE HACKLE

**SRI LANKA LIGHT INFANTRY MAGAZINE**

**Col of the Regt,**
Major General AK Jayawardene, RWP, RSP, rcds, psc

**Oftg. Centre Commandant**
Lieut. Col. JS Masakkara SLLI

*The White Hackle*, Staff

| | |
|---|---|
| **Editor-in Chief** | - Lieut. Col JS Masakkara SLLI |
| **Associate Editor** | - Major KJ Jayaweera SLLI<br>Major IGRG Bogodawatte SLLI<br>Major DM Wijeratne SLLI |
| **Chief Consultant** | - Maj. Gen. AK Jayawardene, RWP, RSP, rcds, psc |
| **Honorary Consultants** | - Maj. Gen. HV Athukorale VSV, psc - FBIM (Rtd) (Reg force)<br>Brigadier AER Abeysinghe KSV (Rtd) (vol force) |

| | |
|---|---|
| **Publisher** | - Regimental Centre<br>Sri Lanka Light Infantry. |

*The White Hackle* - is published quarterly under the Supervision of the Regimental Commander to provide the Regiment with information on people, policies, Operations, technical developments, views, opinions and ideas about the SriLanka Light Infantry. ◆ Manuscripts of interest to the Regiment are invited. ◆ Direct Communication is authorized to Editor, or Asst Editor The White Hackle, Regimental Centre, Army Cantonment Panagoda, Homagama, Phone 855204 or 437073 - 4 Extn 4340 or 4341. ◆ Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. ◆ Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94 ◆ Use of Funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conferance held at Welioya.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

# Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the seventh issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through "The White Hackle" the journal of the oldest and proudest Regiment of them all' If you have much to say about your Battalion's experience go ahead and write in to the "WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien", I Serve"/ Let "WHITE HACKLE" be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all a happy New Year '96 and Compliments of the Season.

*Editor in Chief*

## හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදවේ හඬ ඉතා උසස් ලෙස නංවන 'වයිට් හැකල් සඟරාවේ' හෙවන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක, තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල් සඟරාවේ' ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සඟරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සඟරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල් සඟරාව' ශ්‍රී ලංකා යුධ හමුදවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන පෞඪ නම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදව මගින් ත්‍රෛමාසිකව පල කරනු ලබයි.

මෙම පෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු හා සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාධිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල් සඟරාව' වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල් සඟරාවේ' පල කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සඟරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය යන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුද ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උද කර දෙමු.

ප්‍රධාන කර්තෘ

**THE WHITE HACKLE** is for Members of the SLLI, their Families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words - a post card will do - and include your name, rank and address. We'll withhold your name if you so desire and may condense your views because of space. We can't publish or answer every one, but we'll use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama

# ජයසිකුරු ක්‍රියාන්විතයේ පෙරමුණගත් 3 ශ්‍රීලපාහ



තුවාල වූ භටයන්ට කඩිනම් ප්‍රතිකාර ලබාදුන් අයුරු

යාපනයේ සිට කිලිනොච්චිය දක්වා බළය දැන් මුළුමනින්ම හමුදාව අතට නතු වී හමාරය. වව්නියාවේ සිට මන්නාරම දක්වා ගුවන් ගමන් කළ කාලය හමාරකර මන්නාරමට ගොඩබිම් මාර්ගයක් විවෘත කර ඇත. අනුරාධපුරයේ සිට වව්නියාව දක්වා ගමන්කල හැකි වුවත් තාන්ඩිකුලම් මුර පලින් එහාට ගමන් කිරිම අසීරු ය. උතුරේ රාජකාරී කරනු ලබන හමුදාවන්ට අවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනයට මෙන්ම උතුරේ ජීවත්වන ජනතාවට කරදරයකින් තොරව දකුණට ගමන් කිරීමටත්, පහසුවන්නේ වව්නියාවේ සිට කිලිනොච්චිය දක්වා ගොඩබිම් මාර්ගය විවෘත වූවහොත් පමණි. එමෙන්ම මෙ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා රජයට දැරීමට සිදුවන ප්‍රවාහන වියදම් ප්‍රමාණය ද විශාල වශයෙන් අවම කර ගත හැකි ය. වන්නි ප්‍රදේශයේ තවමත් එල්ටීටීඊ ග්‍රහනයෙන් පීඩා විඳින ද්‍රවිඩ ජනතාවට ද, නිදහසේ තමන්ගේ දිවි පෙවෙත ගෙන යාමට අවස්ථාව සැලසේ. මෙකී පරමාර්ථයන් අරමුණු කරගෙන වව්නියාව සිට කිලිනොච්චිය දක්වා වූ ගොඩබිම් මාර්ගය විවෘත කිරීම පිළිබඳ දැඩි උවමනාවක් හමුදාව තුළ බොහෝ කලක සිට තිබූ බව නොරහසකි. දේශපාලන මෙන්ම වාර්ගික සීමාවක් සේ විහිදී ඇති මෙම කඩඉම යා කිරිම මගින් ත්‍රස්තවාදීන් සැලකිය යුතු පරාජයක් ලබනවා මෙන්ම හමුද මෙතෙක් අත්පත් කර ගත් ජයග්‍රහණයන් අතර, මෙය ප්‍රබල විජයග්‍රහණයක් වන බව ද නිසැකය.

මෙකී අරමුණු මුදුන්පත් කර ගැනීමේ මූලික අඩිතාලම ලෙස 'ජයසිකුරු' ක්‍රියාන්විතය 1997 මැයි මස 13 වැනි දින වව්නියාව ප්‍රදේශයෙන් ආරම්භ කරන ලදි. ත්‍රස්තවාදීන්ගේ ප්‍රබලම නිජබිම හරහා හමුදාව ගමන් කිරීමේ දී මුහුණ දීමට සිදුවන දරුණු ගැටුම් පිළිබඳව පැහැදිලි අවබෝධයකින් ක්‍රියාන්විතය සැලසුම් කල යුද හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිළයින් වව්නියාව කේන්ද්‍ර කොටගත 55 වන සේනාංකය යටතේ බළඇණි කිහිපයක් ප්‍රධාන මාර්ගය අත්පත් කර ගනිමින් ඉදිරියට ගමන් කිරීමටත් 53 වන සේනාංකය යටතේ ගුවන් සංක්‍රමික බළසේනාව යටතේ පාබල ඒකක හා කමාන්ඩෝ බළසේනාව, විශේෂ කාර්ය බළසේනාව වැලිඔය ප්‍රදේශයේ සීමා වූවමනා අයුරින් මෙම බිම් ප්‍රදේශයතුළ හමුදාව සමග ගැටීම සඳහා අවශ්‍ය සියළුම බාධක ඉදිකර තිබීම නිසා භට පිරිස් වලට කල්පනාකාරීව ශිල්පීය ක්‍රම උපයෝගී කරගනිමින් ඉදිරි බිම් ප්‍රදේශය තුළ හමුදාව සමග ගැටීම සඳහා අවශ්‍ය සියළුම බාධක ඉදිකර තිබීම නිසා භට පිරිස් වලට කල්පනාකාරීව ශිල්පීය ක්‍රම උපයෝගී කරගනිමින් ඉදිරියට ගමන් කිරීමට සිදුවිය. මෙදින ගුවන් සංක්‍රමක බළසේනාව යටතේ 4 ශ්‍රීලංසිරෙ භට පිරිස් පළමුවෙන් ද 3 ශ්‍රීලපාහ ඒකකය ඉන් අනතුරුවද 1 ගරෙ භට පිරිස් පසුපසින් ද වනය තුළට ගමන්කර

ගම්මානය වන 'ගජබාපුර' ප්‍රදේශයෙන් ඉදිරියට ගමන් කරවීමටත් සැලසුම් කරන ලදී. ගජබා පුර ප්‍රදේශයෙන් ත්‍රස්තවාදීන්ගේ නිජබිමට ඇතුලත්වීමට තිබූ බළඇණි අතර, ගුවන් සංක්‍රමික බළසේනාව යටතේ 3 ශ්‍රීලපාහ, 4 ශ්‍රීලංසිරෙ හා 1 ගරෙ බළඇණිවලට ඉතාමත් වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට පැවරී තිබුණි. කමාන්ඩෝ හා විශේෂ ප්‍රහාරක බළඇණිය 'ඔට්ටයමලේ සහ පුලියම්කුලම් නැදුන්කේනි' මාර්ගයේ ත්‍රස්තවාදී ගමන අවහිර කිරීමේ කාර්යයට යොදවන ලදී.

1997 මැයි 14 වන දින මධ්‍යහනයේ ගජබා පුර ප්‍රදේශයෙන් ඉදිරි ආරක්ෂක වලල්ල බිඳ ත්‍රස්තවාදී බළ ප්‍රදේශය ආක්‍රමණය කිරිම වැලිඔය ප්‍රදේශයේ සිට ඇදෙන බළසේනා විසින් ආරම්භ කරන ලදි. අවුරුදු ගණනාවක් මිනිස් වාසයෙන් තොරව වල් බිහිවී තිබූ කුඩා මාර්ගයක් ඔස්සේ ඝණ කැලෑව තුළින් ඉදිරියට ඇදීම භට පිරිස් වලට ඉතාමත් අපහසු කරුණක් විය. ත්‍රස්තවාදීන් වසර ගණනාවක් සිය අණසක පතුරවමින් තමන්ට



*නැදුන්කේනි නගරය දැන් අපේ අතේ*

ලැගුම් ගන්නා ලදි. කඩිනමින් සිදුවූ මෙම හමුද ආක්‍රමණය නිසා කලබලයට පත් වූ ත්‍රස්තවාදීන් මේ වන විට ගජබාපුර ප්‍රදේශයේ ඉදිකර තිබූ ක්‍රියාත්විතයේ කේන්ද්‍රස්ථානය වෙත ද සිංහල ගම්මානය වෙත ද සිය ප්‍රබල ප්‍රතිරෝධය කාලතුවක්කු හා මෝටර් ප්‍රහාර එල්ල කරමින් දක්වන්නට විය. ත්‍රස්තවාදීන්ගේ උපාය මාර්ගය වූයේ සිංහල ගම්මානයට හා ක්‍රියාත්විතයේ කේන්ද්‍රස්ථානය වෙත විශාල මෝටාර් ප්‍රහාරයක් එල්ලකර ක්‍රියාත්විතයේ අරමුණ වෙනස් කිරීමටය.

1997.05.15 දින ගුවන් සංක්‍රමික බළසේනාවේ උපදෙස් පරිදි 1400 පැයට පමණ හට පිරිස් ඉදිරියට ගමන් කිරීම ආරම්භ කරන ලදි. 3 ශ්‍රීලපාහ 'සී' කන්ඩායම සහ 'ඩී' කණ්ඩායම ද 1 ගරෙ හට පිරිස් ඉදිරියෙන් ගමන් කරමින් සතුරු ප්‍රදේශය ආක්‍රමණය කළ අතර, වම්පස පැති ආරක්ෂාව 4 ශ්‍රීලංසිරෙ හට පිරිස් විසින් මෙම ඒකක 'ඒ' කණ්ඩායම විසින් ද සැපයීමේ නිරත වූ අතර, 'බී' කණ්ඩායම අමතර කණ්ඩායම ලෙස හදිසි කැඳවීමකට සූදනම්න් ඉදිරියට ගමන් කරන ලදි. ලඳු කැලෑවන්ගෙන් ග්‍රහන ප්‍රදේශයට දුංකොළ වගාවන්ගෙන් හා සුළු බෝග වගාවන්ගෙන් සමන්විත ඉදිරි භූමියේ දී සතුරා අනිවාර්යයෙන්ම තම ප්‍රහාරය දියත් කරන බව දැන සිටි අප හට පිරිස් උපක්‍රමශීලීව සතුරා සමග මුහුණට මුහුනලා දරුණු ගැටුමක නිරත වීය. ගැටුමේ ත්‍රස්තවාදීන් තම පිරිස් බලය හා අවි බළය උපරිම ලෙස යොදවමින් අප ගමන් මග අහුරාලීමට දැරූ උත්සාහය අපමණය. නිරතුරුවම ත්‍රස්තවාදීන් එල්ල කල මෝටාර් ප්‍රහාර හා .50 අවි ප්‍රහාරවල දෝංකාරය මුළු ප්‍රදේශය පුරාම නිරන්තරයෙන් රැව් දෙන්නට විය. මෙවැනි ප්‍රහාරයන්ට මුහුණදීම සඳහා මනා පුහුණුවක් ලබා සිටි අප බළඇණියේ හට පිරිස් සතුරා අභිබවා යමින් වේගවත්ව ඉදිරියට ගමන් කිරීම නිසා පසුපස සිට සිය නායකයින් ලබාදෙන අණට අකීකරුව ත්‍රස්තවාදීන් මියගිය සිය සගයන් හා තුවාලකරුවන් ද රැගෙන පසුබසින ලදි. මෙදින ගැටුමේ දී අප බළඇණියේ සෙනීන් 08 දෙදෙනකු සිය තුරුණු දිවිය මව්බිම වෙනුවෙන් කැපකල අතර, තවත් සෙනීන් 37 දෙනෙකු පමණ තුවාල ලබන ලදි.



*තුවාලකරුවන් රැගෙන යාමට බඟල් රථවල නොමඳ සහය*

ක්‍රියාත්විතයේ තෙවන දිනය වූ මැයි 16 වන දින 1300 පැයට පමණ නැවතත් ක්‍රියාත්විතය ආරම්භ කරන ලදි. 'බී' සහ 'ඩී' කණ්ඩායම හා 1 ගරෙ ඒකකයට අයත් හට පිරිස් ක්‍රියාත්විතයේ ඉදිරියෙන් ගමන් කරන ලදි. 4 ශ්‍රීලංසිරෙ හට පිරිස් වම්පස පැති ආරක්ෂාව සැපයීමේ නිරතවිය. මෙම ඒකක 'ඒ' කණ්ඩායම වම්පසින් පැති ආරක්ෂාව සපයමින් ද 'සී' කණ්ඩායම ලෙස සහභාගීවිය. මෙදින ත්‍රස්තවාදීන් අප හට පිරිස් ගමන් මග අහුරාලීම සඳහා ප්‍රබල ප්‍රයත්නයක නිරතවන ලදි. ක්‍රමවත්ව සටනට අප හට පිරිස් අවතීර්ණ වූ අතර, ඇල මාර්ගයක් අභියස දී සතුරා විසින් ප්‍රබල ප්‍රහාරයක් එල්ල කිරීම නිසා අප හට පිරිස් අපහසුතාවයන්ට ලක් වුව ද හට පිරිස් කඩිනමින් සතුරා අඩපන



*මියගිය ත්‍රස්තවාදියෙක් පරීක්ෂා කරමින්*

කර නියමිත ඉලක්කය කරා ආක්‍රමණය කිරීමට සමත්විය. ත්‍රස්තවාදීන්ගේ මළ සිරුරු ප්‍රදේශය පුරා විසිරී තිබූ අතර පලාගිය ත්‍රස්තවාදීන් අතහැරගිය ටී 56 අවියක්, එම මැගසීන් 04, එල්එම්ජී ඩ්‍රම්ස් 05 සහ අත් බෝම්බ 08 සොයා ගැනීමට හැකිවිය. මෙදින ගැටුමේ දී අප ඒකක 07 දෙනෙකු තුවාල ලබන ලදි.

මැයි 17 දින මෙම ක්‍රියාන්විතයේ වැදගත්ම දිනයක් ලෙස සඳහන් කළ හැකි මෙදින උදෑසන 1000 පැයට පමණ ක්‍රියාන්විතය ආරම්භ කරන ලද අතර, 'බී' සහ 'ඩී' කණ්ඩායම් ත්‍රස්තවාදීන්ගේ වැදගත් මන්සන්දියක් වූ නැදුම්කර්නි ප්‍රදේශය අල්ලා ගැනීම සඳහා ඉදිරියට ගමන් කරන ලද අතර, 1 ගරෙ හට පිරිස් දකුණු පසින් ඉදිරියට ගමන් කරන ලදී. වම් පස පැති ආරක්ෂාව 4 ශ්‍රීලංසිරෙ ඒකකය විසින් සපයන ලද අතර, මෙම ඒකක ඒ. කණ්ඩායම හා 'සී' කණ්ඩායම ද අමතර කණ්ඩායම ලෙස සහභාගී වන ලදි. පුරා දින දෙකක්තුළ ත්‍රස්තවාදීන්ගේ දැඩි ප්‍රහාරයන්ට මුහුණ දෙමින් ප්‍රදේශයේ දැඩි කටුක බව විඳදරා ගනිමින් ඉදිරියට ඇදුන අප හට පිරිස් අවසාන වශයෙන් අත්පත් කර ගැනීමට තිබූ ත්‍රස්තවාදීන්ගේ ප්‍රබල ඉලක්කය වන නැදුම්කර්නි ප්‍රදේශය තම ග්‍රහණයට ගැනීම සියළුම අපහසුතාවයන් අමතකකර පෙරට ඇදීම වැදගත් සිදුවීම ලෙස සටහන් කළ හැක. උතුරු දෙසින් ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයටත්, ඊසාන දෙසින් මුලතිව් දෙසටත්, දකුණු පසින් පුලියන්කුලම දෙසත් දිවෙන ත්‍රස්තවාදීන්ට අත්‍යවශ්‍ය මාර්ග පද්ධතිය අතහැරයාමට සතුරා එතරම්ම කැමැත්තක් නොදැක්වූ බව ඔවුන් විසින් හට පිරිස් නැදුම්කරනි ප්‍රදේශය වෙත ඇතුල්වීමේදී එල්ල කරන ලද ප්‍රහාරය දෙස බැලීමේ දී සිතා ගැනීමට අපහසු නොවේ. මේ වන විට දිගින් දිගටම අප හටපිරිස් වල ප්‍රහාර නිසා දුර්වල තත්ත්වයට පත්ව සිටි ත්‍රස්තවාදීන් කොන්ක්‍රිට් නිවාස ආශ්‍රිතව තනා තිබූ බංකර්වල සිට ප්‍රබල ප්‍රහාරයක් එල්ල කිරීමට අරමුණු කරගෙන සිටිය ද හට පිරිස්වල ප්‍රහාරයන් ඉදිරියේ ඔවුන්ගේ අරමුණ නිශ්ඵල විය. පසුව ඔවුන් හට පිරිස් සමග මුහුණට මුහුණලා සටනේ නියලීම අත්හරින ලදී. මෝටාර් කාලතුවක්කු උණ්ඩ හට පිරිස් ඉදිරියට ඇදෙන ප්‍රදේශයට නොකඩවා එල්ල කරමින් ත්‍රස්තවාදීන් පසුබසින ලදි. මෙදින සවස් භාගය වන විට නැදුම්කර්නි ප්‍රදේශය මුළුමනින්ම අප හට පිරිස් විසින් නතු කර ගන්නා ලදී. මෙදින ඇති වූ ගැටුම් වල දී සෙනීන් හතර දෙනෙකු මිය ගිය අතර, එක් නිලධාරියෙකු ඇතුළු සෙනීන් 10 දෙනෙකු පමණ තුවාල ලබන ලදි. මෙම ප්‍රදේශයේ තිබි ත්‍රස්තවාදීන්ගේ විශාල ආහාර ගබඩාවක් අප හට පිරිස් විසින් සොයා ගන්නා ලදි.

ගජබාපුර ප්‍රදේශයේ සිට නැදුම්කර්නි මන්සන්දියදක්වා කි.මී. 12 ක් පමණ ත්‍රස්තවාදීන්ගේ නිජබිමේ ඉදිරියට ගමන් කරමින් ත්‍රස්තවාදීන්ට දැඩි ප්‍රහාර එල්ල කර ඔවුන් ආපස්සට තල්ලුකර දැමීමට හැකිවීම අප බළඇණිය ගුවන් සංක්‍රමික බළඇණිය යටතේ ලබාගත් විශාල ජයග්‍රහනයකි. මෙහි දී ගුවන් හමුදාව හා කාලතුවක්කු හමුදාව විසින් ඉටුකළ කාර්යභාරය ඉමහත් ය. අණදෙන නිලධාරී තුමා සහ දෙවන අණදෙන නිලධාරීතුමාගේ බුද්ධිමය මග පෙන්වීම හා සියළු කණ්ඩායම් භාර නිලධාරීන්ගේ උපක්‍රමශීලී ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් පොදුවේ ඒකකයේ සියළුම නිළයින් තමන්ගේ කැපවීම හා ක්‍රියාශීලී බව ඔප්නැංවීමත් යන මේ සියල්ලේම සංකලනය අප ඒකකය වෙත ජයග්‍රහනය ලඟා කිරීමට මහෝපකාරී වූ බව මෙහි දී අභිමානයෙන් යුතුව සටහන් කරමි.

යුද්ධයක් යනු සටන් රාශියක එකතුවකි. එක් සටනකින් යුද්ධයේ ජය පරාජය කළ නොහැකි වුවත් පිරිස් බළයෙන් හා මහජන සහයෝගය ආදියෙන් විශාල පසුබෑමකට ලක් වී සිටින ත්‍රස්තවාදීන් ඉදිරියේ දී පරාජය කර කිලිනොච්චිය දක්වා හමුද ආදිපත්‍යය පතුරුවාලීමට අපහසු කරුණක් නොවනු ඇත. 'ජයසිකුරු' ක්‍රියාන්විතයේ පරමාර්ථයන් මුදුන්පත් කරලීම සඳහා ගුවන් සංක්‍රමික බළසේනාව යටතේ 3 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව සැදී පැහැදී සිටින බැව් සාඩම්බරයෙන් සටහන් කරමි.

සැකසුම

**බුද්ධි අංශය**

3 ශ්‍රීලපාහ

ගුවන් සංක්‍රමික බළඇණිය

# "වැලිකතරක" දා බිඳු හෙලූ සෝදිසි මෙහෙයුම.

## ක්‍රියාන්විතයේ පසුබිම

කාලාන්තරයක් තිස්සේ නිහඬ සේයාවෙන් දවාලත් රාත්‍රියත් අධි රස්නයෙන් මුලු ප්‍රදේශයම ගිණිහම් වෙමින් දිනෙන් දින කාල චකවානු අතීතයට එක් වෙමින් වර්ෂාවක සේවායකුදු නොමැති පැහැදිලි නිල් අහස් ගැබන් යුත් දූවිලි වැලි පොරෝනයෙන් මුලු පළාතම වියලු සුළඟින් කෙඩැරි වී ගොසිණි. නමුදු සොල්දදුවන් වශයෙන් රට ජාතිය බේරා ගැනීමේ මහඟු කාර්යයෙහි නියැලී දිවා රෑ නොතකන අපහට මා සිතන්නේ කාළගුණික බලපෑම්වත් දේශගුණික බළපෑම්වත් අප රාජකාරී දිවියට අදල කරගත යුතු දේවල් නොවනක බවය. එවැනි දේ පිළිබඳව ඒ මතින් රාජකාරී ඉටු කළෙහි නම් අද වන විට මෙකී වූ ත්‍රි සිංහලයම පාපතරයන්ගේ ග්‍රහණයට නතුවී හමාරය. මේ එවන් කටුක දේශගුණික තත්ත්වයක් මත සදුකළ ක්‍රියාන්විතයක මතක සටහනයි.

8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව 7 බසේමු යටතේ අලිමංකඩ ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියෙහි යෙදී සිටිය දී අප බළප්‍රදේශයට අයත් නොවූ 523 බසේමු අණසක යටතේ වූ ප්‍රදේශයට අයත් නාගර්කෝවිල් නමැති ප්‍රදේශයේ ත්‍රස්ථවාදී ක්‍රියාකාරකම් රාශියක් සිදුවෙමින් පවතින බවට ලැබුණු බුද්ධි තොරතුරු ජාලය හරහා ඉදිරි ආරක්‍ෂක වලල්ලෙන් ඔබ්බට ගොස් එකී ප්‍රදේශයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මැඩලීම වස් සූදනම් කෙරුණු සෝදිසි මෙහෙයුම් ක්‍රියාන්විතයට සහභාගී වීමට අප බළඇණියට ඉඩ ප්‍රස්ථාව ලැබුණි. අප ඒකකය විසින් මෙම ක්‍රියාන්විතය දැඩි කැමැත්තෙන් පිළිගනු ලැබූයේ කාළයක් තිස්සේ දිවා රෑ කරනු ලැබූ පුහුණුවීම්වල සාර්ථකත්වය මැණ බැලීමට මෙකී වූ ක්‍රියාන්විතය ඉතාම කදිම අවස්ථාවක් බව මනාවට පැහැදිලි වූ නිසා වෙනි. තව ද කාළයක් තිස්සේ ආරක්‍ෂක බංකර රාජකාරී කිරීමෙන් සෙබලුන්ගේ ප්‍රහාරාත්මක මානසිකත්වය දූර්වල වීමට බොහෝ සේ ඉඩ ඇති බැවින් ලැබුණු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගෙන ප්‍රහාරක පන්නරය එලෙසම පවත්වාගෙන සිටීම සුදුසු යැයි මා සිතමි. එසේම අණදෙන නිලධාරී තුමාගේ නිවැරදි මාර්ගෝපදේශකත්වය සහ නායකත්වය යටතේ එකාමෙන් උත්සාහයෙන්, උද්යෝගයෙන්, ධෛර්යෙන් සම්ප්‍රයුක්තව ලැබූ කණ්ඩායම් පුහුණුවීම් වලින් ඒකක සොල්දදුවෝ ඕනෑම ක්‍රියාන්විතයකට අවැසි දිම පන්නරය ලබා සිටියහ.

## ක්‍රියාන්විතය සිදුකළ අයුරු

1997.04.15 වන දින වන විට ක්‍රියාන්විතයට අවශ්‍ය සියලුම දෑ සම්පාදනය කර අවසන්ව තිබූ අතර, සවස 1500 පැයට පමණ තත් ක්‍රියාන්විතය සඳහා අවැසි නියෝග අණදෙන නිළධාරී මේජර් ජේආර් කුලතුංග ශ්‍රීලපාහ විසින් සියලුම නිලධාරී අණදෙන්නන් වරුන් හට ලබාදුන් අතර, එම නියෝගයන්ට අනුව 1997.04.17 වන දින අරුණලු උදවත් සමගින් සතුරු බලමුලු සොයා දියත් කරන්නට සැලසුම් කළ ක්‍රියාන්විතයට සහභාගී වනු වස් 1997.04.16 වන දින උදැසන සිටම අප ස්ථාන ගතව සිටි අලිමංකඩ සිට කිමි 23 ක් තරම් දුරක් මග ගෙවා ආයනන්කයි ප්‍රදේශයේ ස්ථානගතව සිටි 523 බළසේනා මූලස්ථානය වෙත පා තැබූ අතර, එදින 1700 පැය දක්වා විවේකී සුවයෙන් කල් ගෙවන්නට වූහ.

එදින සවස 1730 පැයට පමණ 523 බළසේනාධිපති කර්නල් එල් විජේරත්න විසින් ක්‍රියාන්විතයේ යෙදෙන හට පිරිස් හට ජයග්‍රහණය පතා සිය සුභ පැතුම් පිරිනැමූ අතර, අණදෙන නිළධාරී තුමන් විසින් ද ඒකක හට පිරිස් අමතා අවසානයේ නැවත වරක් අ. නි. තුමා විසින් නිලධාරී අණ දෙන්නන් හට කෙටි නියෝග ලබාදෙන ලදි. ඉන් අනතුරුව සවස 1900 පැයට පමණ හට පිරිස් නැවත වරක් 523 බළසේනා මූලස්ථානයෙන් පිටත්ව 14 වන ගජබා රෙජිමේන්තුව ස්ථානගතව සිටි ඉදිරි ආරක්‍ෂක වලල්ල දක්වා ගමන් ගනු ලැබූයේ, එතැන් සිට නැවත වරක් පා ගමනින් එදින රාත්‍රිය ගත කරනු පිණිස අපහට යාමටනියමිතව තිබූ එක්රැස් වනස්ථානය (Assembly Area) වෙත යාමට නැවත වරක් ප්‍රතිසංවිධානය වීමේ අභිලාශයෙනි.

ඉදිරි ආරක්‍ෂක වලල්ල වෙත පැමිණි අප හට පිරිස් හට අප සමග තත් ක්‍රියාන්විතය දියත් කිරීමට සූදනම්ව පැමිණි සිටි 4 ශ්‍රීලපාහ හා 9 ගරෙ 'බී' කණ්ඩායමේ හට පිරිස් මුණ ගැසුණු අතර, ඉදිරි අරක්‍ෂක වලල්ලේ සිට ප්‍රථමයෙන් 4 ශ්‍රීලපාහ බළඇණියත් දෙවනුව 9 ගරෙ 'බී' කණ්ඩායමත් ඊට අනුකූලව පිළිවෙලින් 'ඒ', 'සී' සහ 'බී' කණ්ඩායම් ද ·කි. මී. $4^1/_2$ පමණ වන මග ගෙවා නියම කර ලැබ තිබුණු බළඇණිය එක්රැස්වන (Assembly Aeea) ස්ථානය දක්වා ගමන් ගත් අතර, 1997.04.17 වන දින හිමිදිරියෙන්ම දියත් කිරීමට නියමිත ක්‍රියාන්විතය වෙනුවෙන් යාම සඳහා රාත්‍රි ලැගුම් ගැනීමට (Harbour) සිදු වූයේ විමසිලිමත් භාවය හා පරීක්‍ෂාකාරී භාවය සියයට සියයක්ම තහවුරු කරගෙන ය. ඊට හේතුව ත්‍රස්ථවාදී ග්‍රහණයෙන් සමන්විත වූ මෙකී ස්ථානය අනාරක්‍ෂිතව තිබූ බැවිණි.

ප්‍රදේශය පුරා දිගු නිහඬභාවය රජයමින් අතුපතර සෙමින් ලෙල දෙමින් සොබාවත්ව නැග එන හිරු පහසින් ප්‍රමුදිත වූ පුෂ්පයන් පරිද්දෙන් විකසිත සිතගත ඇති සෙබළ සමූහයෝ නාගර්කෝවිල් ප්‍රදේශයේ සතුරු බළකොටු සිඳ බිඳ එක්සත් කිරීමට නියමිත මෙහෙයුම ආරම්භ වන තෙක් නොඉවසිලිවන්තව බලා සිටියෝ ය. වේලාව පැමිණියේය. 'වැලිකතර' නම් වූ සෝදිසි මෙහෙයුම 1997.04.17 වන දින 0600 පැයට වමණ ආරම්භ වීමත් සමග පාබල හටයෝ දැඩි උනන්දුවෙන් පය පෙර තබන්නට වූහ. ක්‍රියාන්විතය සිදු කිරීමට වූ ප්‍රදේශයේ පොල්ගස්, තල්ගස් හා කුඩා පඳුරු වලින් ගැවසී තිබුණ ද සොල්දදුවන්ට දැඩි හිරු රශ්මියෙන් නිමේෂයක් හෝ විඩා නිවා ගැනීමට එම වෘක්‍ෂයන්ගෙන් සහායක් ලබා ගැන්ම ඉමහත් අපහසු වූ කරුණක් විය.

නාගර්කෝවිල් ප්‍රදේශයේ සිට ගිණිකොණ දිසාවට වැම්පියන්පත්තු ප්‍රදේශය දක්වා කි.මී. 11 ක් තරම් වූ දුර ප්‍රමාණයක් ඔස්සේ මේ සෝදිසි කිරීමේ මෙහෙයුම සිදු කරන්නට අවැසි නියෝග ලැබී තිබුණි. මෙහෙයුම ආරම්භයේ සිට අවසානය දක්වා මෙහෙයුම පියවර 05 ක් වශයෙන් කොටස් කර දියත් කිරීමට සැළසුම් කොට තිබූ අතර, එයින් ඇති වූ සරල භාවය නිසා සොල්දදුවන් හට පැහැදිලි අවබෝධයකින් යුතුව මෙහෙයුමයට සහභාගීවීමට හැකිවිය. භූමියේ ස්වභාවය හා ක්‍රියාන්විතයේ පරමාර්ථය මත බළඇණියේ යුද උපක්‍රමශීලී හැඩ ගැසීම (Battle Formation) සිදුකළ යුතු හෙයින් 'සී' සහ 'ඩී' කණඩායම් ප්‍රහාරක හා සෝදිසි කණ්ඩායම් ලෙස ඉදිරියෙන් හා 'බී' හා 'ඒ' කණ්ඩායම් පැති ආරක්‍ෂා කණ්ඩායම් ලෙස ද භූමියේ හැඩ ගැසුණි. මෙයට අමතරව ගමන් අක්‍ෂයේ (Axis of Advance) බටහිර දෙසින් පිහිටි ප්‍රදේශයේ මඩවගුරු හා පඳුරු ගහන වූ හෙයින් බළඇණියේ විශේෂ ක්‍රියාන්විත කණ්ඩය ඒ තුලින් කොම්පාසු කෝණ ආධාරයෙන් ගමන් ගැනීමට සිදුවිය.


1 පියවර ආරම්භක ස්ථානයේ සිට මාතර දක්වා ගමන් කිරීම මීටර් 3200 පියර 3840

2 පියවර මාතර සිට කොළඹ දක්වා ගමන් කිරීම මීටර් 1600 පියවර 1920


3 පියවර කොළඹ සිට නුවර දක්වා ගමන් කිරීම මීටර් 2600 පියවර 3120

4 පියවර නුවර සිට ගාල්ල දක්වා ගමන් කිරීම මීයර් 2300 පියවර 1560

5 පියවර ගාල්ල සිට හැටන් දක්වා ගමන් කිරීම මීටර් 1400 පියවර 1680



7GW
SOP
SOP
'C' COY
2 SF
N
REF: MAP SHEET (1:50000) KILINOCHCHI
ADVANCE OF SOP
EN POINT

4 SLLI
8 SLLI
Nagarkovil
MATARA
COLOMBO
Kudarappu
T 01
T 02
Maduna
KANDY
GALLE
HATTON
Chempiyanpattu
Chempiyanpattu
FINISHING LINE
2 (V) GW
[REF MAP SHEET (1:50000) MULLIN MAP]
MAP KEY
ASSAULTING TPS
FLANKING TPS
4 SLLI TPS
REPORT LINES
ASSAULT LINE
WITHDRAWEL ROUTE
OBJECTIVES
ADVANCE ROUTE OF SOP PL

වැලිකතරෙහි සැඟවුණු සතුරු බළමුලු සොයා උද අරුණලු වත් සමගින් ආරම්භ කෙරුණු සෝදිසි කිරීමේ මෙහෙයුම නාගර්කෝවිල් සිට කුඩාරප්පු ප්‍රදේශය දක්වා එනවිට දහවල් 1100 පැය පමණ වී තිබුණි. මේ ප්‍රදේශය තුළ සාමාන්‍ය සිවිල් වැසියන් තැනින් තැන දක්නට ලද අතර, ජනාකීර්ණත්වයෙන් බැහැරව තිබුණු බව සක්සුදක් සේ පැහැදිලි වන්නට විය. නිහීන, අමන මිලේච්ඡ වර්ගවාදී කොටි මෘගයන් මේ වන විට එඩි බලයෙන් පෙරට එන පාබල හමුදවන්ට බියෙන් ප්‍රදේශය අතහැර පලාගොස් තිබූ අතර, සිරිතක් වශයෙන් එල්ටීටීඊ සාමාජිකයන් මෙසේ පසුබැස දුවන විට බිම් වෙඩි අතුරු යෑම සාමාන්‍ය පුරුද්දක් හෙයින් සොල්දදුවන්ට ඉදිරියට තබන බිම් අඟලක් පාසා ප්‍රවේශම් සහිතව විමසිලිමත්ව සිය ගමන කරගෙන යාමට සිදුවිය.

කුඩාරප්පු හන්දියේ සැක කටයුතු ත්‍රස්තවාදී ආරක්ෂිත ස්ථානයක් ඇති බවට ලැබුණු තොරතුරු අනුව එයට ප්‍රහාර එල්ල කොට සතුරන් විනාශ කිරීමේ අරමුණ ඇතිව සොල්දදුවෝ යුහුසුලුව කාර්යශූරව සැදී පැහැදී සිටියේ දැඩි ප්‍රහාරයක් එල්ල කිරීමේ පරම චේතනාවෙන් යැයි කීවොත් මම නිවැරදි යැයි සිතමි. සිතූ පරිදි එම ප්‍රදේශයේ ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයක් එල්ල නොවූයෙන් කුඩාරප්පු ප්‍රදේශය සාර්ථක ලෙස සෝදිසි කිරීමෙන් අනතුරුව නැවත වරක් ගමන් ඇරඹූ අප බළඇණිය තව දුරටත් 4 වන ශ්‍රී ලංකා පාබල බළඇණිය හා සම්බන්ධතාවයෙන් යුතුව මුමුනායි ප්‍රදේශය දක්වා ගමන් කරමින් ත්‍රස්ථවාදී සැක කටයුතු ස්ථානයක් ලෙස සැලකූ එම ප්‍රදේශය ද මනා ලෙස තියුණු පරීක්ෂාවට ලක් කරන්නට විය. මේ වන විට වැලි සහිත පොළොවේ ගමන් ගනිමින් දැඩි හිරු රශ්මියෙන් ලද නොහික්මුණු රක්ත කිරණයෙන් මදක් පිපාසිතව සිටි සොල්දදුවන්ගේ ගමනෙහි වේගය යම් තාක් දුරට අඩුවී තිබුණු බව දිස්වන්නට විය. නමුදු මොවුන්ගේ චිත්ත ධෛර්යය මේ හැමට වඩා අභිබවා තිබීමෙ හේතුව නියාවෙන් මෙහෙයුම නොනවත්වා කරගෙන යාමට හැකියාව ලැබීම ඇත්තෙන්ම ප්‍රසංශනීය කටයුත්තක් බව සිහි කරනු වටී.

මුමුනායි සිට වැමියන්පත්තු දක්වා ගමන් ඇරඹුයේ 1600 පැයට පමණය. මෙහි දී ත්‍රස්තවාදීන් විසින් පවත්වාගෙන යනු ලැබූ අතහැර දමන ලද පුහුණු කඳවුරක් පෙනෙන්නට වූ අතර, මෙහි අස්සක් මුල්ලක් නැර සෝල්දදුවන්ගේ තියුණු පරීක්ෂාවට ලක් විය.ක්‍රමක් ක්‍රමයෙන් සෝදිසි කිරීමේ 'වැලිකතර' මෙහෙයුම ද නිමාවේ පරතෙර මැදින් මද හදවතට සමීප වන්නට වූ අතර, සෝදිසි කිරීමට ලක් වූ ප්‍රදේශයේ කිසිඳු ත්‍රස්ථවාදියෙක් සොයා ගැනීමට නොහැකි වූයෙන් සිත් තරමක් නොසතුටට පත් විලාශයක් සොල්දදුවන්ගේ මුහුණු දෙස බැලීමේ දී පසක් කරගත හැකි විය.

### අප ඉගෙන ගත් දෑ:

එක් දිනක් තුළ වැලිකතරක මෙතරම් විඩාබර ගමනක් පැමිණීමෙන් ලද පන්නරය මා සිතන්නේ ඔවුනට පුහුණුවීම් කාලයේ දීවත් නොලද හැකි තරම් වූ අවස්ථාවක් කොට දුන් බව නම් මොනවට පැහැදිලි වූ කරුණක් විය. 'සත්ජය' ක්‍රියාන්විතයට පසු ඊට හාත්පසින්ම වෙනස් වූ භූමි ප්‍රදේශයක කාළයකට පසුව කළ මෙම ක්‍රියාන්විතය තුලින් බොහෝ දේ ඉගෙන ගැනීමට හැකි විය.

අ. ක්‍රියාන්විතයට පෙර සිදුකළ යුතු සූක්ෂම භූමි අධ්‍යයනය. (Terrain Analysis)

ආ. ව්‍යාකුල නොවූ පැහැදිලි නියෝග

ඇ. සැලැස්මේ නම්‍යතාවය (Flexibility)

ඈ. පටු භූමි තීරුවක් ඔස්සේ දැඩි හිරු රශ්මිය හා කටුක භූමියක දිගු ගමනක් යාමේ දී සොල්දදුවෙකු තුල ගැබ් වී තිබිය යුතු අධිෂ්ඨාන ශක්තිය. මානසික හා ශාරීරික ශක්තියෙහි වටිනාකම

සොල්දාදුවෝ සාර්ථක 'වැලිකතර' සෝදිසි මෙහෙයුමෙන් පසුව නැවත වරක් මෙවන් ක්‍රියාන්විත වලින් සතුරන් සමග සටන් වැද මෘග කොටි රැළ නසා දමා මේ මාතෘ භූමියට එක ධජයක සෙවනයට නිදහස්ව නිවහල්ව වසනු වස් කදිම තෝතැන්නක් බිහි කිරීමේ පරම අවංක, නිහතමානී සිත් ඇතිව කිසිදු උපද්‍රවයකින් තොරව නැවත වරක් එදින 1900 පැයට පමණ අලිමංකඩ රාජකාරී ස්ථානය බලා පිටත් වූහ.

සැකසුම :
නි/62117 ලූතිනන් ඒඑම් අනුරසිරි ශ්‍රීලපාහ
බුද්ධි නිලධාරි 8 ශ්‍රීලපාහ

# වසර 14 ක් තුළ මැරුම් කෑ කොටි

ජනවාර්ගික අර්බුදයක් ඔස්සේ දමිළ ඊලමක් පිහිටුවා ගැනීමෙ අරමුණින් යුතුව එල්ටීටීඊ සංවිධානය විසින් මේ රටේ ඇති කරන ලද බිහිසුනු යුද්ධය මේ වන විට වසර 14 ක් දක්වා දිග්ගැස්සී ඇති බැව් ඔවුන්ගේ හැඳින්වීමෙන් පැහැදිලිවේ. වෙනම දෙමළ රාජ්‍යයක් යන සංකල්පයෙන් යුතුව ඊලාම් වාදී සංවිධාන කීපයක්ම මුල සිට උතුරු නැගෙනහිර ප්‍රදේශවල ආරම්භ වුව ද මෙයින් ප්‍රබලම සංවිධානය ලෙස නැගී සිටි 'දමිළ ඊලාම් කොටි' මේ දක්වා රටේ භීෂණය පවත්වාගෙන යාමට සමත් වී ඇත. මොවුන් විසින් කරන ලද මිනිස් ඝාතන සංඛ්‍යාව නිශ්චිත වයෙන් හෙලිකර දැක්වීමට නොහැකි තරම් ය. ආරක්ෂක අංශවල භටයන් මෙන්ම අහිංසක ගම්වැසියන්, සිංහල, දෙමළ, මුස්ලිම් වශයෙන් බේදයකින් තොරව ද භික්ෂූන් වහන්සේලා මෙන්ම වෙනත් ආගමික නායකයින් ද, සිංහල දමිළ දේශපාලන නායකයින් ඇතුළු ජීවිත ගණනාවක් මෙම කුරිරු සංවිධානය මගින් බිලිගෙන ඇත. බිම් බෝම්බ මෙන්ම මිනිස් බෝම්බ පුපුරවා හැර එකවර ජීවිත සිය ගණන් විනාශ කිරීමට තරම් මෙම කොටි සාමාජිකයෝ මිලේච්ඡ වූහ.

එසේ තිබියදී කොටි සාමාජිකයින්ගේ මියගිය සංඛ්‍යාව හෙලි කිරීමට ලංඩනයේ පිහිටි ජාත්‍යන්තර කොටි මූලස්ථානය ඉදිරිපත් වී ඇත. ඒ අනුව 1982 නොවැම්බර් 27 ද සිට 1996 දෙසැම්බර් 30 වැනිද දක්වා මියගිය කොටින්ගේ සංඛ්‍යාව 9301 බව පෙන්වා දී තිබේ. එය ඔවුන් ස්ථිර වශයෙන් සඳහන් කරන සංඛ්‍යාවයි. මෙසේ බිලිවූ කොටින්ගෙන් 8222 ක් පිරිමි වෙති 1079 දෙනෙක් කාන්තා කොටි බලකායට අයත් වූ සාමාජිකායන් ය. මෙම මුළු සංඛ්‍යාවෙන් 94 දෙනෙක් කලු කොටි ලෙස හඳුන්වා ඇත. එයින් 33 දෙනෙක් පිරිමි කලු කොටි වන අතර, 45 දෙනෙක් පිරිමි මුහුදු කලු කොටින් ලෙස සැලකේ. ඉතිරි 16 දෙනා කාන්තා කලු කොටි වෙති. කලු කොටි යනු දිවි නසා ගැනීම සඳහා කැපවුන සාමාජික පිරිසයි.

මේ මියගිය 9301 දෙනා අතුරින් වැඩි පිරිසක් එකවර වැනසුණු වසරත් එම සටනුත් ඔවුන් මෙසේ වෙන්කර දක්වා ඇත. 1991 ගුවන් හා මුහුදු ප්‍රහාර වලින් 602 ක් ද, 1992 විදුලි සැර මෙහෙයුමේ දී 233 දෙනෙක් ද, පූනරින් 'ගෙඹි පිම්ම' සටනින් 459 ක්ද, කොක්කුකොටුවාහිල් සටනින් 175 දෙනෙක්ද, 1995 හෙණ සැර මෙහෙයුමෙන් 181 ක්ද, රිවිරැස මෙහෙයුමේ දී 438 දෙනෙක් ද, 1996 නොනවතින රැස්ස සටනින් 314 දෙනෙක් ද, සත්ජය 1 හා 2 මෙහෙයුම් වලින් 115 දෙනෙක් ද සත්ජය 3 ක්‍රියාන්විතයෙන් 133 දෙනෙක් ද මියගොස් ඇත. මෑතක දී වන්නි මඩකලපුව, යාපනය ගැටුම්වලදී 995 දෙනෙකු මියගොස් ඇත. ඉහත අයුරින් කොටින්ගේ ලංඩන් ශාඛාව මියගිය කොටි පිළිබඳ විස්තර ප්‍රසිද්ධියට පත්කර ඇත.

සැකසුම -
සැරයන් අශෝකබංඩාර ඩීඑම්
බුද්ධි අංශය - 3 ශ්‍රීලපාහ
(ඉහත විස්තර මනහර සාර සංග්‍රහය ඇසුරිනි)

# "සතුරන් සොයා සැඩ සුළඟ හැමුවදා..."

යුධ බිමෙහි කවදත් පෙරමුණ ගත් 8 ශ්‍රීලපාහ බළඇණිය නොබෝද 'සැඩසුළඟ' නම් ක්‍රියාන්විතයක් සාර්ථකව නිම කිරීමට සමත් වූහ. සතුරන්ගේ පාරාදීසයක් යැයි සැලකූ කිලිනොච්චි නගරයෙන් පිටත කි.මි. 03 ට මදක් වැඩි ප්‍රමාණයක් නොබියව ගමන් කර එහි තිබූ එල්ටීටීඊ පොලිස් මුර පොලක් විනාශ කිරීමට අප බළඇණියෙ විශේෂ ප්‍රහාරක කණ්ඩය සමත් විය. 'සත්ජය' ක්‍රියාන්විතයෙන් පසු කිලිනොච්චි ප්‍රදේශයේ ස්ථානගත වූ සියලුම භට පිරිස් මේ වන විට ආරක්ෂක වලල්ලෙන් ඉදිරියට වැඩි දුරක් ඉදිරියට ගොස් ස්වාධීන කුඩා කණ්ඩායම් ක්‍රියාන්විත (Independent Small Gp Operations) කිරීමට හැකියාවක් තිබුණි. මේ හේතුවෙන් නොයෙක් වර සතුරන් අප ආරක්ෂක වලල්ල කිට්ටුවටම පැමිණ නිරීක්ෂණ හා වෙනත් ප්‍රහාරාත්මක ක්‍රියා කිරීමට පෙළඹුණි. ප්‍රහාරාත්මක භාවය ආරක්ෂක තත්ත්වයේ බලයයි. (Offensive is the best way of defence) යන මූල ධර්මය පෙරදැරිව සතුරු බල ප්‍රදේශය තුළට හොරෙන් ගොස් කුඩා කණ්ඩාය මක් ලෙස ඇතුල් වී විශ්මය උපදවන අයුරින් ප්‍රහාරයක් කිරීම අපගේ අරමුණ විය. අණදෙන නිලධාරී තුමන්ගෙන් ලැබුණු උපදෙස් අනුව ක්‍රියාත්මක වූ විශේෂ ක්‍රියාන්විත ප්‍රහාරක කණ්ඩය මේ සඳහා පෙරමුණ ගත් අතර, එයට සහාය වශයෙන් කපිතාන් ටීජීඩීඑම්ආර්බී දිසානායක ශ්‍රීලපාහගේ නායකත්වයෙන් යුතු 'සී' කණ්ඩායම ඕනෑම අවස්ථාවක විශේෂ ප්‍රහාරක කණ්ඩයට ආධාර කිරීමට සූදනමින් ආරක්ෂක වලල්ලෙන් ඉදිරියේ සිට සතුරු ඉලක්කය ආසන්නය දක්වා ස්ථානගත වී සූදනමින් සිටියහ.

මෙයට අමතරව විශේෂ බලකායේ එක් කණ්ඩායමක් සතුරු ආධාරක භට පිරිස් ඒම අවහිර කිරීම සඳහා පැති ආවරණයක් ලබා දුන් අතර 7 වන ගැමුණු හේවා බළඇණියේ විශේෂ ප්‍රහාරක කණ්ඩයද තවත් පසෙකින් අපහට ආවරණය සලස්වමින් ස්ථානගත කර තිබුණි. තව ද කාලතුවක්කු හමුදව අප කලින් ලබා දුන් ඉලක්ක පත් වලට අවශ්‍ය වුවහොත් ප්‍රහාර එල්ල කිරීමට සූදනමින් සිටියේය. 1996.12.15 වන දින අණදෙන නිලධාරී තුමා විසින් මෙම 'සැඩසුළඟ' නම් ක්‍රියාන්විතයට සහභාගී වන සියලුම භට පිරිස් සඳහා අවශ්‍ය නියෝග ලබා දීමෙන් පසු 1996.12.16 වන දින 0200 පැයට පමණ අප විශේෂ ක්‍රියාන්විත කණ්ඩය කිලිනොච්චි ඉදිරි ආරක්ෂක වලල්ල පසු කරමින් බස්නාහිර දෙසට සතුරු ඉලක්කය කරා ගමන් අරඹන මොහොතේ අණදෙන නිලධාරී තුමා සහ සියලුම නිලධාරීන් ද අප බළඇණියේ සහෝදර සෙබලුන් සමග ඕනෑම අවස්ථාවකට මුහුණ දීමට සූදනමින් සිටියේ ය. සතුරු භූමියේ නොබියව ඉදිරියට ඇදුන අප කණ්ඩය උදෑසන 0500 පැයට පමණ වන විට ලැබුණු බුද්ධි තොරතුරු වලට අනුව කලින් සැලසුම් කළ පරිදි පළවන කඩඉම් ස්ථානයට ලහාවීමට සමත් විය. මේ වන විට 'සී' කණ්ඩායම ද නියමිත ස්ථානයන් වෙත ලහාවී තිබිණ. කලින් සැලසුම් කල පරිදි කෝප්‍රල් ගුණතිලක සමග එක් පෙළක් 'සී' කණ්ඩායම සහ සතුරු ඉලක්කය අතර, එක් ස්ථානයක රැකසිට පහරදීමක් ස්ථානගත කල අතර, කෝප්‍රල් ජයරත්න ජීජ් සමග එක් පෙළක් ද, කෝප්‍රල් නිරෝෂන සමග තවත් පෙළක් ද එකතුව උපක්‍රමිකව ඉදිරියට ගමන් කරන ලදී. මේ වන තුරුද අපහට සතුරුන්ගේ කිසිම සංකේතයක් දක්නට නොලැබිණ. උදෑසන 0530 පැය වන විට අප බුද්ධි තොරතුරු වලට අනුව සතුරු පොලිස් මුරපොල පිහිටා ඇති ස්ථානයට ලහා වුව ද එම ස්ථානය හොඳින් විමර්ශනය කිරීමේ දී එහි සතුරු ගැවසීමක් පිළිබඳ කිසිදු හෝඩුවාවක් ලබා ගැනීමට අපහට නොහැකි විය. නමුත් ඉතාමත් ධෛර්ය සම්පන්න සොල්දදුවන්ගෙන් සැදුම්ලත් අප කණ්ඩය කිසිවිටකත් අධෛර්යයට පත් නොවී කෙසේ හෝ සතුරු මුර පොළ විනාශ කිරීමේ අරමුණින් විමර්ශණ මුර සංචාරයක් ලෙස තව දුරටත් ඉදිරියට ගමන් කළහ. ඒ අනුව ඉදිරියට ගමන් කළ අපට මදක් ඈතින් මිනිස් ඡායාවන් කිහියක් දක්නට හැකිවිය. සුදුපාට ටීෂර්ට් සහ නිල් පැහැදති දිග කලිසම් ඇඳ සිටි දෙදෙනෙකු සිවිල් වැසියෙකු යැයි සිතිය හැකි පුද්ගලයෙකු ද අප උකුසු ඇසට ලක් විය. ඒ අනුව ගුවන් විදුලි යන්ත්‍රය මගින් අණදෙන නිළධාරී තුමා අමතා වැඩිදුර උපදෙස් ඉල්ලා සිටියේ ය. අණදෙන නිලධාරී තුමාගේ නියෝගය සහ දිරි ගැන්වීම මත ක්ෂණිකව ක්‍රියාත්මක වූ අප සතුරු මුරපළට ප්‍රහාර එල්ල කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් තව දුරටත් ඉදිරියට ගමන් කළෙමු. ඒ යන අතරතුර ද අප ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා ලාකෝ කුරේ එස්පීජ් සමග කුඩා කණ්ඩාය මක් අතරමග ස්ථානගත කිරීමට අප අමතක නොකලෙමු.

> "අප යුද්ධ කරන්නේ අවිගත් සතුරන් සමග මිස අහිංසක සිවිල් වැසියන් සමග නොවන බව නියෝග වලදී අණදෙන නිලධාරී තුමා කළ ප්‍රකාශය අප සියලු දෙනාගේම සිත් වල නැවත නැවතත් දෝංකාර දෙන්නට විය."

සතුරු ඉලක්කයට මීටර් 300 ක් පමණ ලහා වූ පසු කෝප්‍රල් ජයරත්න සමග කුඩා කණ්ඩාය මක් ප්‍රධාන මාර්ගයේ පැති ආරක්ෂක කණ්ඩායමක් ලෙස ස්ථානගත කර මා සමග සිටි කුඩා කණ්ඩායම සහ කෝප්‍රල් නිරෝෂන කේසී සමග සිටි කුඩා කන්ඩායම් අක්ෂ දෙකකින් සතුරන් හට පැනයා නොහැකි ලෙස උපක්‍රමිකව ඔවුන් දෙසට ඇදුන නමුත් භූමියේ තිබූ බාධක අප ගමනේ වේගය අඩු කිරීමට සමත් විය. කෙසේ හෝ එම බාධක පසු කල අප සතුරා හට ප්‍රහාර එල්ල කළ හැකි තරම් දුරකට ලහාවිය. සතුරන් දෙදෙනාගෙන් එක් අයෙකු අත අවියක් තිබෙනු අපට නිරීක්ෂණය වූ නමුත්. සරමකින් හා කමිසයකින් සැරසී සිටි සිවිල් පුද්ගලයා ද ඒ අසලම සිටි හෙයින් අප හට ප්‍රහාර එල්ල කිරීමට පෙර කීප වරක් ඒ පිළිබඳ සිතීමට සිදු විය. අප යුද්ධ කරන්නේ අවිගත් සතුරන් සමග මිස අහිංසක සිවිල් වැසියනී සමග නොවන බව නියෝග වලදී අණදෙන නිලධාරී තුමා කළ ප්‍රකාශය අප සියලු දෙනාගේම සිත් වල නැවත නැවත දෝංකාර

දෙන්නට විය. තව ද අප සිටින්නේ මිතුරු පක්‍ෂයෙන් බොහෝ දුරස් වන්නට කුඩා කණ්ඩායමක් ලෙසින් හෙයින් වැඩි වේලාවක් ගත කිරීම සුභදායක නොවන බැවින් සිවිල් වැසියාට නොවදින ලෙස ප්‍රහාර එල්ල කිරීමට අප තීරණය කළහ. එම නියෝගයත් සමග ක්‍රියාත්මක වූ ලාකෝ වනිගසූරිය. සාසේ චන්දන සහ සාසේ සරත් එම්පී යන සෙබලුන් සාර්ථකව ප්‍රහාරය එල්ල කළහ. එහි දී එක් සතුරකු වෙඩි වැදී බිම ඇද වැටුණු අතර, සුදු තුවාල ලැබූ අනෙක් සතුරා (සිවිල් පුද්ගලයා අසලින් සිටි සතුරා) වෙඩි වැදුණු තම සගයා ද අරුදගෙන දකුණු දෙසට තිබූ කැලෑ රොදට පැන ගැනීමට සමත් විය. අහිංසක සිවිල් වැසියාට සිදුවූයේ කුමක්දැයි සිතා ගත නොහැකිව තුෂ්නිම්භූතව බලා සිටිය දී වහා ක්‍රියාත්මකවූ ලාකෝ රණවීර සහ ආසේ බංඩාර ඩීඑම්ජේ යන සෙනීන් එම ස්ථානය සහ සිවිල් පුද්ගලයා පරීක්‍ෂාවට ලක් කරවීය. එහි දී 'එල්ටීටීඊ' පොලිස් හමුදවට අයත් පොත්පත් කිහිපයක් එල්ටීටීඊ පුවත්පත් කිහිපයක් හ තවත් ලියකියවිලි කිහිපයක් ද පාපැදි දෙකක් ද සොයා ගැනීමට හැකිවිය. එදිනම 54 සේමු බුද්ධි අංශය මගින් එල්ටීටී ගුවන් විදුලි පණිවිඩ වලට ඇහුම්කන්දීමෙන් මෙම ප්‍රහාරයේ දී ඔවුන්ගේ පොලිස් නිලධාරියෙකු මියගොස් ඇති බව සනාථ කෙරෙන සිවිල් පුද්ගලයා සතුව සැක කටයුතු කිසිවක් නොවූ හෙයින් ඔහුව මුද හරින ලද අතර, සැලසුමේ පරිදි අප පසු බැසීම සඳහා අවශ්‍ය ආවරණ වෙඩි අප බළඇණියේ ආධාරක කණ්ඩායම සහ කාලතුවක්කු මගින් ලබා දුනි. අප සිටි ස්ථානය අනුව අප හට පසු බැසීම සඳහා තිබුයේ විනාඩි කිහිපයක පමණ සුළු වේලාවක් පමණි. සහෝදර සෙබලුන්ගේ ආවරණය සමගින් ඉතා ඉක්මනින් කඳවුර කරා පැමිනීමට අපට හැකි විය.

මෙම 'සැඩසුළඟ' ක්‍රියාත්විතයේ දී මිතුරු පක්‍ෂයේ කිසිවකුටවත් සුළු තුවාලයක්වත් නොලබා සතුරන් හට ප්‍රහාර එල්ල කර නැවත පැමිණීමට හැකිවීමඉතා වැදගත් කරුණක් ලෙස අප හට දැකිය හැක. තව ද මෙවැනි ක්‍රියාත්විත සිදු කිරීමට අවශ්‍ය ආත්ම විශ්වාසය සහ චිත්ත ධෛර්ය අපසතුව ඇති බව ද ඉතා හොදින් පැහැදිලිව පෙනෙන කරුණකි. අවශ්‍ය වන්නේ නිවැරදි නායකත්වයක් මගින් යුද සෙබලුන් දිරි ගැන්වීම පමණකි. මෙයට පෙර කිලිනොච්චි ප්‍රදේශයේ කිසිදු බළඇණියක් (විශේෂ බලකාය හැර) විසින් මෙවන් දුරක් ආරක්‍ෂක වලල්ලෙන් ඉදිරියට ගොස් ප්‍රහාරයක් එල්ල කර නොතිබූ අතර, ඒ සඳහ අප බළඇණිය වෙත උසස් මූලස්ථානය වෙතින් පැසසුම් ලැබිණි. මේ සටහන 'සැඩසුළඟ' ක්‍රියාත්විතයට සහභාගී වූ සියලුම දෙනාගේ චිත්ත ධෛර්ය වඩවනු පිණිසත්, ඉදිරියේ දී මෙවන් ක්‍රියාත්විත සඳහා පන්නරය ලබා ගනු පිණිසත් උපකාර වනු ඇතැයි මාගේ විශ්වාසයයි.

**ලුතිනන් ඩීඑස්එස් රදලගේ, ශ්‍රීලපාහ**
**8 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදව**

# සෙබල බිරිඳට හසුනක්

ඔබ එවූ ලිපි ලැබීමෙන් මා නොවී පමා
ලිව්වා පිළිතුරක් නැත්තේ මටම කමා
වරදක් වුනානම් මා හට වන්න සමා
පළමුව පතමි ඔබ හට තුන් සරණ මෙමා

කණගාටුවේ පර මල් පෙති ඉහල නැග
කැලතෙන විටදී සන්තාපයේ කඳුළු ගඟ
එනතුරු මග බඉලා ලිපියක් අතර මග
නැති කල ලියුම් හදවත් වේදනා ගඟ

සෙබළකු විලස යුධ හමුදවට බැඳිලා
බිරිඳක් සමග දරු තිදෙනාව තනි කරලා
සිටියත් මිතුරු කැල සමගින් එකතු වෙලා
මම නැහැ ඉන්නෙ ඔබ සැම අමතක කරලා

ලොකු පුතු තවම ආවෙ නැතුවද ගෙදර
පොඩි පුතු සමගදුව ඇතිවෙනව ද දබර
මොනවා කලත් තරවටු නොකරණු නිතර
මම නැති අඩුව පුරවන්නකෝ ඔබ නිතර

නිවාඩුවක් ලැබුනම ගෙදරට එන්න ම්
එහෙත් අදට ලිපියෙන් මා සමුගන්න ම්
ලදහැම විටම මේ විදියට අමතන්න ම්
ඔයට සියලු දෙවි පිහිටයි නවතින් නම්

**සෙ. 5 ඩී 01022 සාසෙ. විජේරත්න**
**5 ශ්‍රීලසාභ**
**ඒ කණ්ඩායම, යුධ හමුද කඳවුර, නිලාවේලි ත්‍රිකුණාමලය**

# රණවිරු සිතක ආයාචනය

කුරිරු වූ යුද්ධය රජයන
ශාපලත් මේ දෙරණේ
ජීවිතය ලැබූ නිසා
මේ දෙරණ රැක ගන්න
ලන්කර ගත්තෙමි
ගිනි අවිය ජීවිතයට
ජීවිතය දෙවෙනි කොට
රුපුසෙන් ජයගන්න
වෙර දරණ නිමේශයක
මගේ ජීවය යළි උපන්නෙමි
දයාබර කුමරියේ
ඔබේ මුදු සෙනෙහසින්
මගේ මෙහෙයට නිතැතින්ම
ඔබේ ශක්තිය මට ඇවසිය

නුමුදු
හිත්පිත් නැති වෙඩි උණ්ඩය
අපේ සෙනෙහස දෙපළු කලද
හිතැහෙන්න කුමරියේ
කඳුළු පිසද දෙනයනේ
මගේ පිවිතුරු සෙනෙහසේ නාමයෙන්

**සෙ/300208 කෝප්‍රල් ද සිල්වා ඩීඑච්එන්**
**බළඇණි මූලස්ථානය - 6 ශ්‍රීලපාහ**

# 8 වන බළඇණිය ශ්‍රීලපාහ හි "ඒ" කණ්ඩායම අලිමංකඩ ස්ථානගත වීම

8 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 'සත්ජය' ක්‍රියාත්මකය අවසානයේ කිලිනොච්චි නගර මධ්‍යයේ ඉදිරි ආරක්ෂක වලල්ලේ රාජකාරී කටයුතු ඉතාමත් සාර්ථක අන්දමින් කරමින් සිටින ලදී. මෙකී කාලයතුළ අලිමංකඩ ප්‍රදේශයට ත්‍රස්තවාදීන්ගෙන් එල්ල වූ දැඩි ප්‍රහාරාත්මක බලවේගය හේතුවෙන් අප බළඇණියට තත් ප්‍රදේශය බලා 1997.01.22 වනදින උද අරුනළුවත් සමග පියමන් කරන්නට සිදු විය. මෙකී ප්‍රදේශයට එනවිට ප්‍රදේශය භාරව සිටින ලද බලසේනාව වූයේ 7 වන බලසේනාවයි. එතෙක් මෙම බලසේනා ප්‍රදේශයේ රාජකාරී කටයුතු කරමින් සිටින ලද 1 වන ශ්‍රී ලංකා පාබල හමුදවත්, 6 වන ගැමුණු හේවා බළඇණියත් වූ බළඇණි වලට හදිසි සතුරු ප්‍රහාරයක් ඇති වුවහොත් සතුරා සමග මුහුණට මුහුණලා සටන් කර එකී බළඇණි වල භට පිරිස් ක්ෂණිකව ප්‍රතිප්‍රහාර කිරීමේ පරම අභිලාශයෙන් යාපනය කිලිනොච්චි ප්‍රධාන මාර්ගය දෙපස ශක්තිමත් ස්ථාන ගොඩනැගීමෙහි කාර්යය මූලිකව අප බළඇණියට පැවරුණු කාර්යය විය. එනම් මෙම බලසේනා බල ප්‍රදේශයට අතිරේක බළඇණියක් ලෙස රාජකාරී කටයුතු කරන ලෙසත් බල ප්‍රදේශයට පිටත අන් ස්ථානයන්හි ඇතිවිය හැකි ත්‍රස්තවාදී ප්‍රහාරයන් මැඩ පැවැත්වීමට සහාය දෙන බළඇණියක් ලෙස බළඇණි මූලස්ථානය 7 බසේමු මූලස්ථාන මූලස්ථානය අභිමුවෙහි ස්ථානගත විය.

මෙලෙස 8 ශ්‍රීලපාහ 'ඒ' කණ්ඩායම කිලිනොච්චි යාපන ප්‍රධාන මාර්ගයේ දකුණු දෙසට වන්නට ඉදිරි ආරක්ෂක වලල්ලේ රාජකාරී කරන 6 වන ගැමුණු හේවා බළඇණියට පිටු පසින් කි.මී. 05 ක් පමණ වූ පෙදෙසක් බලවත් ස්ථාන 12 ක් ස්ථාපනය කොට ඇති අතර, මෙම ස්ථාන වල භට පිරිස් ඒ ඒ කාර්යයන්හි නියැලෙමින් කණ්ඩායම අණසක පතුරුවා රාජකාරී ඉටු කිරීමට නියෝග ලද අතර, ප්‍රථමයෙන්ම බලවත් ස්ථාන ගොඩනැගීමේ කාර්ය භාරය කණ්ඩායමේ සොල්දාදුවන් විසින් උද්යෝගයෙන් හා උනන්දුවෙන් යුතුව දිවා රෑ නොතකා කල කැපවීම මහත් අගය කල යුත්තක් බව ප්‍රශංසනාත්මක මුඛයෙන් පැවසිය හැක. ක්‍රමක් ක්‍රමයෙන් මෙකී ස්ථානයෙහි රාජකාරී කිරීමට පුරුදු පුහුණු 'ඒ' කණ්ඩායමේ භට පිරිස් භට අණදෙන නිලධාරී තුමාගෙන් ලැබුණු නියෝගය මගින් රාජකාරී කරමින් සිටින අතර තුර ලැබූ මද විරාමයෙන් කල කණ්ඩායම් පුහුණුවීම් ඇත්ත වශයෙන් කාළයට පසුව භට පිරිස් භට ලැබෙන මහඟු අවස්ථාවක් බව සඳහන් කරනු වටී. මෙකී ලැබුණු පුහුණුවීම් වල සාර්ථකත්වය මැන බැලීමට ලැබූ අවස්ථාවක්දෝ යයි 'වැලිකතර' වැනි ක්‍රියාත්මක වලට සහභාගී වීමට හැකියාව ලැබිණි. මෙයට අමතරව සතුරන් අප බළ ප්‍රදේශයට ඇතුලත් වී විමර්ශණ ආදී කාර්යෙහි නිරතව සිටී ද යන්න පිළිබඳව සියයට සියයක්ම තහවුරු කර ගැනීමේ පරම අභිලාශයෙන් සතියකට වරක් මෙන් සෝදිසි කිරීමේ මෙහෙයුම් කරනු ලබයි. මෙම සෝදිසි කිරීමේ මෙහෙයුම් මගින් ද කණ්ඩායම් භට පිරිස් භට ඉදිරි ක්‍රියාත්මකයන්ට සහභාගී වීමට ලබාගත යුතු කදිම පන්නරය මෙන්ම චිත්ත ධෛර්ය ඉතා උසස් අන්දමින් වැඩි දියුණු වී ඇති බැව් මොනවට පැහැදිලි වේ.

කණ්ඩායම් බළප්‍රදේශයේ රාජකාරී කටයුතු කරමින් සිටින අතරතුර කණ්ඩායම් සෙබලුන් හිරු උදවත් සමගින් මාර්ග පරීක්ෂා කිරීමේ කටයුතු වල යුහුසුලුව නියැලෙන අතර, එකිනෙහි තවත් භට කණ්ඩායම් ඔවුන් ස්ථානගතව සිටින ස්ථානයේ සිට ඉදිරි ආරක්ෂක වලල්ල දක්වා පාමුර සංචාර දෛනිකව සිදු කිරීමෙන් සතුරා භට සැඟැවී සිටීමට අවැසි අවස්ථාව මහත්සේ දුර්වල කොට ඇති අතර, එමගින් ඉදිරි ආරක්ෂක වල්ලෙහි භට පිරිස් හි චිත්ත ධෛර්ය නොමදව වැඩිවී ඇත.

මෙවැනි කුඩා ගණයේ ක්‍රියාත්මක එමෙන්ම පුහුණුවීම් කටයුතු සිදු කරන අතුරතුරෙහි ලැබෙන්නා වූ විවේක පාඩු අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ලබාගනු වස් නොයෙකුත් ක්‍රීඩාවන් හා විනෝදාත්මක වැඩ සටහන් සැලසුම් කොට ක්‍රියාවෙහි යොදවනු ලබයි.

කණ්ඩායම් භට පිරිස් දිනපතා සන්ධ්‍යා භාගයේ අත් භට පිරිස් භට හදිසි අවස්ථාවකදී සහාය දීමේ පරමාර්ථයෙන් පෙර පුහුණුවීම්වල යෙදෙන අතර, ඕනෑම අවස්ථාවකදී එවන් අවස්ථාවල දී කැපවී යුහුසුලුව කටයුතු කිරීමට කදිම පන්නරයලබාගෙන ඇති අතර, එමගින් තම තමන්ට කලයුතු කාර්යයන් පිළිබඳව දැනුමෙන් ද පෝෂණය වී ඇත.

මෙවන් අතිරේක භට පිරිසක් වශයෙන් රාජකාරී කටයුතු වල නියැලී සිටිය ද ඕනෑම අවස්ථාවක ඕනෑම සතුරු ප්‍රහාරයකට මුහුණ දී එම ප්‍රහාරයන් ව්‍යර්ථ කොට උපරිම වශයෙන් ඔවුන්ට හානි පැමිණවීමේ චිත්ත ධෛර්යෙන් පරිපූර්ණව කල්යල් බලා සිටිනුයේ කුමන හෝ ක්‍රියාත්මකයක් ලැබේදෝ යයි යන පරම පවිත්‍ර වූ චේතනාවෙනි.


නි/62252 ලුතිතන් ජේකේආර්පී ජයසිංහ - ශ්‍රීලපාහ
වැඩබලන නිලධාරී අණදෙන "ඒ" කණ්ඩායම
8 ශ්‍රීලපාහ - අලිමංකඩ


# සාපලත් දේශය

කිමද මිනිසුනේ උපන් මේ බිමේ - නැත් කරන්නේ බිම් කඩක් රැගෙන
ඒ තමුදු ඉපබදෙන විට මිනිසුනේ - තේරුන් ගන්ට නොහැකිව බල
තන්හාව පොදි බැඳන් අහිංසක ජීවිත - බිලිදෙන මිනිස්සුන්ගේ සිතනු මැන
මොහොතක් යුද්ධයේ සාපයට හසුව - මේ දේශයට උගස් කෙරු තරුණ
ජීවිතවල රතු රුධිරය ගලා - ගිය යුගයකල අධර්මිෂ්ඨ මිනිසුනේ
පලායන මනුෂත්වය නැවත මේ - බිමට එක්කර හෙට දින පායන
හිරුට අයුක්තියේ දොර වසා - සිතනු මැන සාමය ගැන


සෙ/309452 සාසෙ සිරිපාල එස්එම්
ඒ කණ්ඩායම 12 ශ්‍රීලපාහ. යුධහමුද කඳවුර,
චාවාකච්චේරිය - යාපනය


# එපා පෙම් කරන්නට මිළ මුදලට

ජීවිතය ජීවත් කරවන්නට - පිදූ සෙනෙහසට පෙම් කලානම්
සබඳ ඔබ - මොණතරම් සුන්දර වේද
මා දිවිය සොයා ගිය රුපියල් සත නිසා - අතර මං වුනු ඔබ
කිසි දිනක පාවා නුදුන්නෙමි - මගේ අමිල සෙනෙහස
දුප්පත් වුවත් ඔබ සැමට - වඩා මිල මුදලින් මා පොහොසත්
මිනිස් කමින් මා සදකල්


සෙ/305 883 සාසෙ රංජිත්
බණ්ඩාර ඩබ්පීඩී
ඒ කණ්ඩායම 12 ශ්‍රීලපාහ
යුධ හමුද කඳවුර, චාවකච්චේරිය,
යාපනය

# සෙබලුන්ගේ චිත්ත ධෛර්ය වර්ධනය කිරීම තුලින් ක්‍රියාන්විත

මුලු ලෝකයේම නෙත් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත ඇද බැඳ ගැනීමට සමත් වී ඇති මෙවන් යුගයක අප සෙබලුන් ක්‍රියාන්විත ප්‍රදේශ වල අද්විතීය සේවයක් ඉටු කරනු ලබයි. මෙවන් යුගයක අප සෙබලුන්ගේ චිත්ත ධෛර්ය වඩාත් උසස් මට්ටමක පැවැත්ම මෙන්ම එය වඩාත් දියුණු කිරීම අප සියලූ දෙනාගේම වගකීම මෙන්ම අරමුණ ද වේ.

සෙබල චිත්ත ධෛර්ය වර්ධනය කිරීම තුලින් අප ලැබූ ජයග්‍රහණයන් අද මුලු මහත් ලක්වැසි ජනතාව මෙන්ම මුලූ ලෝකයටම මහත් ආදර්ශයකි. මෙය ත්‍රස්තවාදී පාරාදීසය බඳු වූ යාපා පටුන ජය ගැනීම තුලින් පැහැදිලි වේ. එද මද්දුම බංඩාර කුමරු දුන් ආදර්ශය මෙද අප අගය කරන්නාක් මෙන් අප මෙද සෙබලු දිරිමත් කළ යුත්තේ කෙසේ ද? සතුරු ප්‍රහාර අභිබවා යාපා පටුන ජය ගැනීමට ඉන්ද්‍රකීලයක් සේ ඉදිරියට ගිය අප හමුදාවෝ ඉන් ලැබූ ජය පාබල සෙබලුන්ටත් ත්‍රිවිධ හමුදාවටත් මහත් ආඩම්බරයකි.

සෙබල චිත්ත ධෛර්ය වර්ධනය කිරීමට කණිෂ්ඨ නායකයෙකු හැටියට අපට කුමක් කළහැකි සෑම සෙබලෙකුම පරීක්ෂණයට ලක් කිරීම මින් ප්‍රධානම තැනක් ගනී. මේ තුලින් ඔවුන්ගේ මානසික තත්ත්වය ජීවන මට්ටම, හැඟීම් මෙන්ම ඔවුන්ගේ ආකල්ප තේරුම් ගත හැක. යම්කිසි කාර්යයක් ඔවුන්ට පැවරීමේ දී ඒ පිළිබඳ නිපුනත්වය ප්‍රධාන වශයෙන්ම සලකා බැලිය යුතු ය. ඔවුනට ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දිය යුතුය.

තව ද සෙබලුන්ගේ චිත්ත ධෛර්ය උසස් මට්ටමක පැවතීමට සෙබල සුභසාධනය මූලික තැනක් ගනී. ඔවුන්ට ක්‍රියාන්විත වල දී පවා සුභසාධනය ගැන ක්‍රියා කිරීම තුලින් ඔවුන් ලද දිරිය කැපී පෙනේ. එමෙන්ම සෙනීන්ගේ මානසික තත්ත්වය දියුණු කරලීම සඳහා විනෝද, ක්‍රීඩා විවිධ කලාත්මක කටයුතු වලට ඔවුන් නැඹුරු කරලීම මෙන්ම සංගීතයට ඔවුන් යොමු කිරීම තුලින් ඒකාකාරී බව මග හරවා ගත හැක.

හැකි සෑම විටම සෙබළුන් පුහුණු වීම් වලට යොමු කිරීම තුළින් ආත්ම විශ්වාසය වර්ධනය කර ගත හැක. අප ලක්වාසීන් විසින් සංවිධානය කරනු ලබන බෝධි පූජා මෙන්ම ආබාධිත රණ විරුවන් සඳහා සුභසාධක වැඩ සටහන් ද සෙබලුන්ගේ මානසිකත්වයට ඉමහත් පිටුවහලක් වී ඇත.

සමස්ථයක් වශයෙන් ගත් කල අප සෙබලුන්ගේ චිත්ත ධෛර්ය ඉතාමත් උසස් මට්ටමක පවතී. සතුරු බලය බිඳ හෙලීමටත්, සතුරාගේ චිත්ත ධෛර්ය පහත් මට්ටමකට බිඳ දැමීමටත් මෙය ප්‍රධාන ලෙස ඉවහල් වී ඇත. දැනට පවතින 'ජයසිකුරු' ක්‍රියාන්විතය සලකා බැලූ විට මේ බව පැහැදිලි වේ. අප හමුදාවෝ නොබියව ඉදිරියට ඇදෙන්ම ත්‍රස්තවාදීන් සීඝ්‍රයෙන් පසු බසී.

මෙවන් ක්‍රියාන්විතයකදී පවා සෙබලුන් ලද හසුන් පත්, ආසිරිපත් එමට ය. අප ලක්වැසි ජනතාව විවිධ පුවත්පත් වල පල කරන ලිපි සෙබල දිරියට දෙන ශක්තිය අමත කළ නොහැක. එමෙන්ම නියම මග පෙන්වීමක් සහ නායකත්වයක් යටතේ සිදු නොකළ හැකි දෙයක් නැත.

**නි/54362 2 / ලූති ආර්එස්සී වාසුදේව, ශ්‍රීලපාහ**
**බණ්ඩගාර නිලධාරී**
**"ඒ" කණ්ඩායම - ශ්‍රීලපාහ අලිමංකඩ**

## කොනොනි විශ්වාස මාලාව

1. වෘත්තීය නිපුනත්වය අතින් මට වඩා පුදුස්සෙක් නොමැත
2. මම කොමිෂන් නොලත් නිලධාරියෙක් වෙමි. සෙබල නායකයෙකි.
3. යුද හමුදාවේ කොඳු නාරටිය නමින් හැඳින්වෙන කොමිෂන් නොලත් නිලධාරීන්ගේ සාමාජිකයෙකු වන්නට ලැබීම මම ගෞරවයක් කොට සලකමි.
4. මම කොමිෂන් නොලත් නිලධාරීන් සම්බන්ධයෙන් ආඩම්බරයට පත්වන අතර, මා කුමන අවස්ථාවක කුමන තත්ත්වයක සිටිය ද සෑම විටම එම බලකායෙන්, හමුද සේවයේත්, මාගේ මව් බිමේත් ගෞරවය රැගෙන පරිදි ක්‍රියා කරමි.
5. පුද්ගලික ලාභයක් අපේක්ෂාවෙන් හෝ අභිමතය ළඟාකර ගැනීම සඳහා මම මගේ තනතුර, තත්ත්වය කිසිදු විටත් උපයෝගී කර නොගනිමි.
6. කාර්යක්ෂම භාවය මාගේ ආදර්ශ පාඨයයි.
7. පැවරුණු රාජකාරි ඉටු කිරීම සහ මාගේ සෙබල පිරිසගේ සුභ සාධනය සොයා බැලීම සහ ප්‍රධාන වගකීම මාගේ මතකයේ නිසැකින්ම රැඳී පවතී.
8. යුධ උපායෙහි නිපුනත්වය සහ ශිල්පීය නිපුනත්වය, ශිල්පීය දක්ෂතාවය උපරිම මට්ටමින් ලබා ගැනීම සඳහා මම සියලුම පරිශ්‍රමයන් දරමි.
9. කොනොනියෙකු වශයෙන් මාගේ වගකීම මා හොඳින් දනිමි.
10. මම කොනොනීන් හට ආවේනික වූ එම වගකීම ඉටු කරමි. සෑම සෙබලෙකු හට හිමි විශිෂ්ඨ නායකත්වය මම ඔවුන්ට ලබා දෙමි. මාගේ සෙබලුන් මම හොඳින් හඳුනමි.

**සෙ/300315**
**සැරයන් රූපසේන ශුජීජී**
**8 ශ්‍රීලපාහ "ඒ" කණ්ඩායම - අලිමංකඩ**

## සෙබල සිතින්

යුද්ධයේ බිහිසුණු ගිනි දැල් මැද
සාමයේ අරුණළු විකසිත කරන
සිංහනාදය පතුරු වන්නට
රණබිමේ අවි සරඹ පානා සෙබළ සොයුරනේ
සතුරු ඔදතෙද බිඳ දමා
අප යන මේ ගමනේ සපල පිළිතුරු
රැගනෙ මිස නොඑමු

**සෙ/22709 සාසෙ බාලසූරිය බීඑීඑස්**
**මූලස්ථානය 2(සෙව්) ශ්‍රීලපාහ**
**(බළඇණිය කාර්යාලය) වෙංකල්අඩි - මඩකලපුව**

# කිලිනොච්චි නැගෙනහිර

1996 වර්ෂයේ සැප්තැම්බර් මස අගභාගය යුධ හමුදාවට විශේෂ කාලපරිච්ඡේදයක් විය. 'සත්ජය II' මෙහෙයුම ක්‍රියාත්මක වූ මේ අවධියේ එයට සහභාගී වූ භට පිරිස්වල පූර්ණ උත්සාහය, අභිප්‍රාය වූයේ ත්‍රස්තවාදී බලකොටුවක් වූ යාපනය අහිමි වූ කොටින්ගේ ප්‍රධාන පරිපාලන නගරය වූ කිලිනොච්චිය දිනා ගැනීමයි. 96 වර්ෂයේ සැප්තැම්බර් මස 28 දින ආරක්ෂක හමුදාවන්ගේ සහ සමස්ත සාමකාමී රට වැසියන්ගේ ප්‍රාර්ථනා මල්පල ගන්වමින් සත්ජය III හමුදාවෝ කිලිනොච්චි නගරය ත්‍රස්ත ග්‍රහනයෙන් මුදවා ගත්හ. පරාජයේ කම්කටලු සමගින් එඩිතර සොල්දාදුවන්ට මුහුණ දී ගත නොහැකි වූ කොටි ත්‍රස්ථවාදීන් පරාජයේ සංකේතයෙන් පමණක් කිලිනොච්චියේ ඉතිරිකර පැන දිව්වේ ය.

මෙම මහගු සටනේ දී විජයග්‍රහනය තෙක්ම නොසැලී එඩිතරව සටන්කල බළඇණියක් වශයෙන් 7 ශ්‍රීලපාහ ද සඳහන් කළ හැක. කිලිනොච්චි නගරයෙන් බටහිර දිශාවේ කි. මීටර් 6 ක පමණ දුර සිට කිලිනොච්චි නගරය දෙසට සත්ජය III මෙහෙයුමේ යෙදී සිටි භට පිරිස් 96 සැප්තැම්බර් මස 28 දින සවස් වරුවේ කිලිනොච්චිය නගරය ද අත්පත් කරගෙන මෙහෙයුමේ ඉදිරියටම ඇදෙමින් කිලිනොච්චිය නැගෙනහිර ප්‍රදේශයෙන් තම මෙහෙයුම අවසන් කළහ. දින කිහිපයක් එහිම ආරක්ෂක කටයුතුවල නියැලෙමින්, නිතර නිතර අප වෙත ලඟා වූ සතුරන් විනාශ කරමින් පසුගිය දිනවල ගෙවූ වෙහෙස කර ජීවිතයට විරාමය තබමින් විවේකයෙන් ගත කළහ.

සැලසුම් සහගත ලෙස ස්ථිර ඉදිරි ආරක්ෂක වලල්ලක් තැනීම දින කිහිපයකින් ඇරඹී අතරු විවෘත භූමි වෙල්යායවල්, මඩවගුරු, ලඳුකැලෑ හා ඇල මාර්ග හරහාම ස්ථිර ආරක්ෂක වලල්ලක් ඉදිකෙරුණි. චිත්ත ධෛර්යෙන් ඔද වැඩි ගිය යුධ සෙබලුන්ගේ ශ්‍රමයෙන් දින කිහිපයක් ඇතුලත ඉතා හොඳ ආරක්ෂක වලල්ලක් ඉදිකරගෙන ප්‍රදේශයේ සතුරන්ගේ ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමට සෙබලු අදිටන් කරගත්හ. කිලිනොච්චිය ආරක්ෂක ප්‍රදේශයෙහි නැගෙනහිර ආරක්ෂක කලාපයේ එක් ප්‍රදේශයක් 7 ශ්‍රීලපාහ වේ. අණසක පතුරුවා හැරීමට ද වෙන් කෙරුණි. සත්ජය මෙහෙයුමෙන් පසුව මේ දක්වා කිලිනොච්චිය නැගෙනහිර ප්‍රදේශයේ තම අණසක පතුරුවමින් අප බළඇණිය මහගු සේවාවක් කරන්නෙහි ය. බළඇණි කණ්ඩායම් 04 ක් ඉදිරි ආරක්ෂක වලල්ලේ ස්ථාන ගතව ඇත.

යුධ හමුදාවට කිලිනොච්චියෙහි ඇති වැදගත් කමසේම සතුරාට ද එහි ඇති වැදගත්කම මනාව වැටහී ඇත. පසුගිය කාලයෙහි කිලිනොච්චිය ප්‍රදේශයෙහි අධික ලෙස සතුරු ක්‍රියාකාරකම් මතුවීම තුලින් එය මනා ලෙස පැහැදිලි වේ. දිනෙන් දින උග්‍රවන සතුරු ක්‍රියාකාරකම් අතරේ ඉතාමත් කල්පනාකාරීව, සන්සුන්ව සහ උපක්‍රම භාවිතයෙන් කඳවුරු සීමාවන්ට සතුරාට ලඟාවීමට නොදී සතුරාව විනාශ කරමින් ආරක්ෂක කටයුතු වල නියැලීමට සිදුවී තිබේ. විශේෂයෙන් කිලිනොච්චිය නැගෙනහිර ප්‍රදේශයෙන් සතුරාගේ ක්‍රියාකාරකම් බහුලව දක්නට ලැබෙන ප්‍රදේශයකි. පෙරසිට පැවති සතුරු කඳවුරු තිබීම සහ භූමියේ පිහිටීම අනුව සලකා බැලීමේ දී මෙම ක්‍රියාකාරකම් අධිකව තිබීම පැහැදිලි වේ. මීට පෙර පැවති ඉතා වැදගත් වූ ප්‍රහාරාත්මක ක්‍රියාන්විතයන්ට සහ ආරක්ෂක කටයුතු වල නියලීමෙන් ලද ආභාෂය සහ පරිනත භාවය මත ඒකකයේ සියළුම නිලධාරීන් / සෙසු නිළයින්ගේ ඒකම අභිප්‍රාය වනුයේ එක සතුරකුටවත් හෝ ආරක්ෂක වලල්ල නිරීක්ෂනය කිරීමට පැමිණි සතුරන් නොයෙකුත් අවස්ථාවල විනාශ කිරීම හේතු වෙන් බළ ඇණිය පැසසුම් ලද අවස්ථා බොහෝ ය. එසේ පැසසුම් ලැබුවේ නියමාකාරයෙන් කිලිනොච්චිය නැගෙනහිර කලාපයට ආරක්ෂාව සැලසූ නිසාවෙන් ය.

මෙහි දී මා මතක් කළ යුතු තවත් කරුණක් ඇත. අප බළඇණිය සමග කිලිනොච්චිය ආරක්ෂක කලාපයේ රාජකාරී කරනු ලබන අනෙකුත් ඒකකයන් ද තම වගකීම් මනා ලෙස ඉටු කරනු ලබන බවයි. එහි එක් එක් කොටසට දායකත්වය දෙමින් අප බළඇණිය ද මහගු කැප කිරීමක් කරයි.

සේනාංකාධිපති, බළසේනාධිපති හා ඒකක අණදෙන නිලධාරීගේ ද උපදෙස් මත සතුරු භූමියේ ද සීමිත මෙහෙයුම් සිදු කරයි. මෙහි දී ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වූ නිලධාරී / සෙනින් විසින් සතුරු භූමියේ විමර්ශනය කිරීම පවා සිදුවේ. මනා සැලසුමක් මත සිදුකරනු ලබන මෙවැනි මෙහෙයුම් තුලින් ලබා ගත්තා ලද තොතුරු මත ප්‍රහාරයන් දියත් කොට විශාල අලාභ හානි සතුරාට සිදු කිරීමට අපට හැකියාව ලැබී ඇත. දරුණු තර්ජනයට මුණපා සිටින කිලිනොච්චිය නැගෙනහිර ආරක්ෂක වලල්ලෙහි දී සතුරා පැරදී පසුබැස්ස අවස්ථා එමට ය. ආරක්ෂක වලල්ලේ සිට විශාල දුර ප්‍රමාණයකට කුඩා කණ්ඩායම් මගින් විමර්ශණය කිරීම හේතුවෙන් සතුරාගේ කඳවුරු ගැන සහ සතුරා ගැන තොරතුරු මත නොයෙක් ක්‍රියාන්විත සිදු කෙරුණි. ලද තොරතුරු මත හෝ සහ සතුරන් නිදහසේ සැරිසරන ප්‍රදේශයන්හි රැක සිට ප්‍රහාර දීම් මගින් සහ යුධ උපක්‍රම භාවිතා කිරීම් මගින් සතුරාගේ තොරතුරු සොයා ගැනීම සහ සතුරාට ප්‍රහාර දීම හේතුවෙන් සතුරාට ඔහුන්ගේ ත්‍රස්ථ කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට නොහැකිවී ඇත.

නොයෙකුත් උපක්‍රමයන් භාවිතා කරමින් ඉදිරි ආරක්ෂක වලල්ල තුලට ඇතුල්වීමට තොරතුරු සෙවීමට සහ ප්‍රහාරදීමට සතුරන් උත්සාහ කරන බවත් පෙනී යයි. සිවිල් ඇඳුමින් සැරසුණු වයසක පුද්ගලයන් සහ තරුණ පුද්ගලයන් ද ආරක්ෂක වලල්ල දෙසට පැමිණ ගැවසෙන බව මුලදී නිරීක්ෂණය වූ අතර, පසුව එය ක්‍රමයෙන් අධික විය. නොයෙක් අවස්ථාවල සිවිල් ලෙස සැරසුණු පුද්ගලයන් අවි අතැතිව මෙසේ පැමිණි බව විමර්ශණය විය. මෙය සතුරාගේ උපක්‍රමයක් ලෙස කලක තිබුණි. මෙලෙස ආරක්ෂක වලල්ලේ තොරතුරු සෙවීමට උත්සාහ කරන සතුරන් මැඩ පැවැත්වීමට ඒකකයේ සියළුම කණ්ඩායම් විසින් කැළෑ භූමිවල පමණක් නොව විවෘත භූමිවල පවා සාර්ථක ලෙස සහ උපක්‍රම ලෙස ගමන් ගෙන එම ප්‍රදේශයෙන් ආවරනය කිරීම තුළින් සතුරාට ප්‍රහාර එල්ල කිරීමට සිදුවේ.

මෑතක දී ලද බුද්ධි තොරතුරු වලට අනුව කිලිනොච්චිය ආරක්ෂක වලල්ල මේ වනතුරා නිසි පරිදි විමර්ශණය කිරීමට, ආරක්ෂක කලාපයට ප්‍රහාර එල්ල කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට හෝ සතුරාට නොහැකි වී ඇති බව අනාවරනය විය. මෙය මෙම ප්‍රදේශයේ නියුතු භටපිරිස්වල උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස හැගියයි. කිලිනොච්චිය නැගෙනහිර සතුරු බලමුළු විනාශ කරන්නේ අප බට පිරිස්වල අප්‍රතිහත ධෛර්ය සහ විශ්වාසය මතයි.

**ලූතිනන් චන්දන ඩයස්. ශ්‍රීලපාහ**
**බී කණ්ඩායම 7 ශ්‍රීලපාහ**

# ක්‍රියාත්විතයක මතක සටහන්

ශ්‍රී ලංකා ද්වීපයේ සාමයේ කිරුළු දම් පැළඳීම සඳහා 1996.02.22 දින සත්ජය III ක්‍රියාත්විතය දියත් කෙරිණි. මෙම කුරිරු ත්‍රස්තවාදී මූල ඝාතනය කිරීමේ තීරණාත්මකත අවස්ථාවකි පාබළ හමුද රෙජිමේන්තු පවුලේ සාමාජිකයා වන 7 ශ්‍රීලපාහ හමුදවේ 'ඒ' කණ්ඩායම වන අප කණ්ඩාමට ද කාර්ය භාරයක් පැවරී තිබුණි.

එනම් 1996.09.22 දිනෙන් ආරම්භ කරන ලද 'සත්ජය III' ක්‍රියාත්විතය සඳහා සහභාගී වීමේ උදාර අවස්ථාව අප ඒකකයට ද ලැබීමෙන් අනතුරුව ඒ සඳහා සහභාගීවීම් වස් අප කණ්ඩායම ස්ථානගතව සිටි අරියාලෙයි ඉදිරි ආරක්‍ෂක වලල්ල II ශ්‍රීලපාහ ඒකකය වෙත භාරදී ක්‍රියාත්විතයට අප කණ්ඩායම යුහුසුලුව සූදනම් වීමු. පසුව 1996.09.15 දින අරියාලේ සිට අලිමංකඩ දක්වා පැමිණෙන ලදී. එදින සිට 1996.09.20 දින තෙක් සතුරාගේ ප්‍රහාරයන්ට මුහුණ දෙන අයුරුත් සතුරා විනාශ කරන අයුරුත් සියලු දෙනාම දහඩිය වගුරුවමින් පුරුදු පුහුණු විය.

පසුදින එනම් 1996.09.21 දින අප බළඇණිය සමග 'ඒ' කණ්ඩායම ද පරන්තන් දක්වා ගමන ආරම්භ කරන ලදී. එදින අප කණ්ඩායම පරන්තන් ආරක්‍ෂක වලල්ලට ආසන්ව රාත්‍රිය ගත කිරීම සඳහා ස්ථාන ගත වීමු.

එනම් පසු දින 1996.09.22 දින ක්‍රියාත්විතයේ පළමු අධියර වූ පරන්තන් සිට මුරුසුමුඩේ දෙසට ගමන් ගැනීම අප කණ්ඩායමට පැවරී තිබුණු අතර, හිරු අවරට උදවීමටත් ප්‍රථම 'ඒ' කණ්ඩායමේ නිලධාරී අණදෙන නි/62188 කපිතන් වීඩීඑස් පෙරේරා, ශ්‍රීලපාහ ගේ අණදීම යටතේ 'සත්ජය III' ක්‍රියාත්විතයට අවතීර්ණ විය. එහි දී පරන්තන් ඉදිරි ආරක්‍ෂක වලල්ලෙන් ඉදිරියට ගමන ආරම්භ කල අප කණ්ඩායම ඉදිරි ප්‍රහාරක කණ්ඩායමක් ලෙස ගමන් ගත් අතර, ආරම්භයේ දීම සතුරාගෙන් නොනවත්වා මෝටාර් ප්‍රහාර සහ සුලු අවි උපයෝගී කර ගනිමින් අපගේ ගමන අඩාල කිරීමේ අරමුණ කරා සතුරා යොමු වී සිටියේය. එම ප්‍රහාර මැඩ ගෙන අප කන්ඩායම ඉදිරියට ගමන් කර ක්‍රියාත්විතය නොනවත්වාම කරගෙන ගිය අතරතුර දී ද සෙනීන් කිහිප දෙනෙකුට සතුරු මෝටාර් ප්‍රහාර වලින් සුලු ලෙස තුවාල සිදුවිය. තුවාල සිදුවූවන් අතර , සෙ/15420 කෝප්‍රල් ජයමාන්න ජේඑම් සහ සෙ/303727 ලාකෝ ගුණසිංහ ඩීඑම්සීඑම්, සෙ/304495 ලාකෝ රංජිත් එච්පී, සෙ/308285 ආසෙ සෝමරත්න ආර්එන්ජී, සෙ/309225 සාසෙ කොඩිතුවක්කු කේඩීජ්පී යන සෙනීන් හට තුවාල සිදුවිය. සතුරා ද සැහෙන ප්‍රමාණයක් මරණයට පත් වූ අතර, සැහෙන ප්‍රමාණයක් බරපතල ලෙස තුවාල සිදුවිය. පසුව මුරුසුමුඩේ ප්‍රදේශයෙන් පසු බැස 1996.05.26 දින පරන්තන් සිට කිලිනොච්චිය දක්වා ගමන ආරම්භ කරන ලදී. එහිදී සතුරාගෙන් දැඩි ලෙස මෝටාර් ප්‍රහාර සහ වෙඩි ප්‍රහාර එල්ල වූ අතර, අපගේ ගමන නොනවත්වාම කරගෙන ගියේ ය. එම යන අතරතුර අප කණ්ඩායමේ සෙනීන් දෙදෙනකු මරණයට පත් වූ අතර, නිලධාරිවරයෙකු ඇතුලුව තවත් කිහිප දෙනෙකුට තුවාල සිදුවිය. මිය ගිය සෙනීන්, සෙ/309204 සාසෙ විජේවීර, සෙ/309188 සාසෙ ජයරත්න වන අතර, තුවාල ලැබූ නි/63041 2/ලුතිනන් ඩබ්ජීපී ගුණරත්න ශ්‍රීලපාහ, සෙ/12920 ව/සැරයන් දයාරත්න කේජීඩබ්, සෙ/306086 ලාකෝ ප්‍රේමසිරි එල්එච් යන අය හට තුවාල සිදුවිය. පසුදින 1996.09.27 සහ 28 යන දිනයන්හි දී සතුරාගේ ප්‍රහාර දැඩි ලෙස එල්ල වූ අතර, ඔවුන්ව මරාගෙන ඉදිරියට යාමට අප කණ්ඩායමට හැකි වූ අතර, 1996.09.29 දින උදේ කාලයේ ගමන් කරන අතරතුරේ අප කණ්ඩායමේ සෙනීන් තුන් දෙනෙකුට සුලු තුවාල සිදු වූ අතර, සෙනීන් දෙදෙනකු ඔවුන් ජීවය වා තලයට මුසුකරමින් අපගෙන් සදහටම සමු ගත්තේ ය. මිය ගිය සෙනීන් සෙ/309185 සාසෙ සෙනවිරත්න කේඑම්කේජී. සෙ/309108 සාසෙ සුනිල් ශාන්ත ටීවීඩී කොතෙකුත් සෙනීන් තුවාල ලබුවත් මියගියත් ඔවුන්ගේ අඩුව ගැනවත් නොතකා ඉදිරියට ගමන් ගැනීමට අප කණ්ඩායමේ නිලධාරීන් අණදෙන තුමා සෙනීන් දිරිමත් කළ අතර 1996.09.29 දින 16.30 පැයට අප බළඇණිය සමගින් අප කණ්ඩායම ද කිලිනොච්චි නගරය ජයග්‍රහණය කිරීමට හැකිවිය. එහි ප්‍රීතිය නිමිත්තෙන් කිලිනොච්චිය නගරයේ ජාතික ධජයන් පාබළ අපට හිමි බළඇණි ධජයත් අණදෙන නිලධාරී තුමා විසින් ඔසවන ලදී.

පසුව එනම් 1996.09.30 දින අප බළඇණිය සමගින් 'ඒ' කණ්ඩායම කිලිනොච්චිය ප්‍රදේශයේ බලය තහවුරු කරගෙන සිටින අතරතුර සතුරාගේ මෝටාර් ප්‍රහාර විටෙන් විට එල්ල වන්නට විය. එහි දී අප කණ්ඩායමේ තවත් සෙනියෙක් තුවාල සිදුවිය. සෙ/109544 ආසෙ අනුරකුමාර ඩබ්ඩබ්එම්එම් පසුව අප බළඇණියට සහ අප කණ්ඩාමට පැවරී තිබුණේ භාරදූර කාර්යයකි. එනම් ආරක්ෂිත වලල්ල සකස් කිරීමයි එහි දී අප කණ්ඩාමට පැවරී තිබූ කොටස ඉතා ඉක්මණින් හා ශක්තිමත් ලෙස නිම කළේය. එහිදී අප කන්ඩායමේ නිලධාරී අණදෙන තුමාගේ කාර්යශූර බව සියලු දෙනාටම දැක ගැනීමට හැකිවිය.

මෙම වකවානුව තුළ අප බළඇණිය සමගින් අප කණ්ඩායම ද ඉතා මැනවින් රාජකාරි කරගෙන යන අතරතුර 1997 වර්ෂය උදවෙත්ම අප කණ්ඩායම විසින් සෑම වර්ෂයකම අප බළඇණියේ මීට ප්‍රථම සිටි නිළධාරියකු වන මේජර් දොන් නලීන් මාස්කෝරාල 'රිවිරැස' ක්‍රියාත්විතයෙ 'දී මියගිය අතර, එමනිලධාරිගේ අනුස්මරණය නිමිත්තෙන් මේජර් දොන් නාලීන් මාස්කෝරාළ අනුස්මරණ අභියෝගතා ක්‍රිකට් කුසලානයට තරග වැදීමට කණ්ඩායමට සිදුවිය. එහිදී අප කණ්ඩායම ද සමගින් සියලු කණ්ඩායම් තරග වැදුනු අතර, එනම් 1997.03.19 සිට 28 දින දක්වා පැවැති ක්‍රිකට් තරගාවලියෙන් සියලුම කණ්ඩායම් පරදවා 'ඩී' කණ්ඩායම මේජර් දොන් නලීන් මාස්කෝරාල අනුස්මරණ අභියෝගතා ක්‍රිකට් කුසලානය දිනා ගත්තේය.

**2/ලුතිනන් ආර්කේඩීඑන් චන්ද්‍රදස ශ්‍රීලපාහ**
**7 ශ්‍රීලපාග**
**ඒ කණ්ඩායම**
**කිලිනොච්චිය.**

# 9(සෙව්) ශ්‍රීලපාහ "බී" කණ්ඩායමෙහි තෙවන ඊළාම් යුද්ධයේ දායකත්වය

01. අප 9 (ස්වේච්ඡා) ශ්‍රීලපාහ ඒකකය නව ඒකකයක් වශයෙන් ආරම්භ කරන ලද අවධියේ පටන් එනම් 1993.11.01 වසරේ සටන් මේ දක්වාම යාපනය අර්ධද්වීපය තුළ ක්‍රියාත්මක රාජකාරියෙහි නියුතු නිත්‍ය හා ස්වේච්ඡා ඒකක අතුරින් වැඩිම කලක් යාපනය අර්ධද්වීපයේ ස්ථානගතකර ඇති ඒකකයකි. ඒකක මූලස්ථානය දෙවන ඊලාම් යුද්ධය ආරම්භ කළ වකවානුව තුළ ළදරු ඒකකයක් වශයෙන් පළාලි මයිලඩ්ඩිහිදී ස්ථානගත කරන ලද අතර, අප ඒකකය වෙත පැවරී තිබුණේ ඉදිරි ආරක්ෂක වළල්ලේ රාජකාරි කරගෙන යෑමයි. මෙයිනුත් අප ඒකක 'බී' කණ්ඩායමට උතුරේ ක්‍රියාත්මක කරන ලද මුල්ම ක්‍රියාන්විතයේ පටන් 'රිවිරැස' ක්‍රියාන්විතය දක්වාම අනිකුත් නිත්‍ය ඒකක සමග සම්බන්ධව කටයුතු කිරීමට ඉඩ ලැබීම ඒකකයක් වශයෙන් අප ලද භාගයයක් කොට සලකමි.

02. ත්‍රස්තවාදීන් විසින් අපගේ ගුවන් යානා වලට මිසයිල එල්ල කිරීමට පටන්ගත් අවධියේ ගුවන් යානා නිර්පද්‍රිතව පලාලි ගුවන් තොටුපල වෙත ගෙන්වා ගැනීම අපහසු වූ අතර. එය වැළැක්වීම සඳහා යාපනය අර්ධද්වීපය තුළ ප්‍රථමයෙන් ආරම්භ කරන ලද සේෆ් පැසේජ් (Safe-passage( ක්‍රියාන්විතයට දායක වීමට අප ඒකකයට සිදු වූ අතර, එයිනුත් 'බී' කණ්ඩායම හට බළඇණියක් වශයෙන් තොණ්ඩමනාරු කළපුව දක්වා ඉදිරි ආරක්ෂක වළල්ල විශාල කිරීමේ දී නිත්‍ය ඒකකයත් සමග පැති ප්‍රහාරක කණ්ඩායමක් වශයෙන් සහභාගී වීමට සිදුවුනි. මෙම ක්‍රියාන්විතය සඳහා 6 ශ්‍රීලපාහ, 8 ශ්‍රීලපාහ, 3 ගරේ හා සන්නාහ සන්නද්ධ බළකාය සහභාගී වන ලදී.

03. රිවිරැස ක්‍රියාන්විතය ආරම්භ කිරීමට මුල් පියවරක් වශයෙන් ආරම්භ කරන ලද අකුණු පහර (Thunder-Strike) ක්‍රියාන්විතය මගින් එකල ත්‍රස්තවාදීන්ගේ බලකොටුවක්ව තිබූ අච්චුවේලි නගරය අල්ලා ගැනීම සිදුකල අතර, ස්වේච්ඡා ඒකකයකින් සහභාගී වූ එකම ඒකකය 9(සෙව්) ශ්‍රීලපාහ වන අතර, එයිනුත් අප 'බී' කණ්ඩායම 7 කාඉරේ, සමග පැති ප්‍රහාරක කණ්ඩායමක් වශයෙන් සහභාගී වූ අතර, ත්‍රස්තවාදීන් විසින් එල්ල කරනලද ප්‍රහාරයකින් අප කණ්ඩායමේ සෙ/9ඩී00740 සාසෙ රත්නපාල ඩබ්ඩී හට සුළු තුවාල සිදුවිය.

04. එවක් පටන් අප ඒකකය මයිලඩ්, තොන්ඩමනාරු, පොන්නාලෙයි. අච්චුවේලි, පේදුරුතුඩුව, වාවාකච්චේරි යන ස්ථානයන්හි රාජකාරි කර ඇති අතර තනි කණ්ඩායමක් වශයෙන් මෙතෙක් ඒකකය වෙතින් පිටත ක්‍රියාන්විතයන් සඳහා සහභාගී කරවන ලද කණ්ඩායම 9(සෙව්) ශ්‍රීලපාහ 'බී' කණ්ඩායම වේ. එයිනුත් අච්චුවේලි ප්‍රදේශයේ පුත්තූර්හි දී සතියක් ඇතුලත ත්‍රස්තවාදීන්හට එරෙහිව ක්‍රියාත්මක වී පහත සඳහන් ප්‍රතිඵලයන් අත්කරගෙන ඇත.

05. මෙම බළප්‍රදේශයට අයත් සිවිල් වැසියෙකුගෙන් ලත් තොරතුරක් මත 1997.04.25 වන දින රාත්‍රි ත්‍රස්තවාදීන් තිදෙනකු පැමිණ ඇති අතර, ඔවුන්ගෙන් එක් අයෙක් ළඟ පිස්තෝලයක් තිබෙන අතරම ත්‍රස්තවාදීන් කොට කලිසම් හා ටී ෂර්ට්ස් වලින් සැරසී පැමිණ සිටිය බැව් ද අසල කඩයකින් බීම හා බිස්කට් රැගෙන එදින රාත්‍රි පිටත්ව ගොස් ඇති බැව් ද මෙම කණ්ඩායම වෙත දන්වා සිටියේය. මේ පිළිබඳව 9 (සෙව්) ශ්‍රීලපාහ මූලස්ථානය වෙත දැනුම් දී අදාළ ප්‍රදේශය දෙසට 1997.04.26 වන දින සෙනින් 7 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් රැකසිට පහරදීම සඳහා ඇවැසි නියෝග ලබා දී පිටත්කර හරින ලදී.

06. එම අදාල රැකසිට පහරදීමේ බළඇණිය එදින 2100 පැයට ජනාවාස පිහිටි ප්‍රදේශය ආසන්නයට ගොස් ඇති අතර, කඩෝ පිහිටි දෙසට යාම සඳහා ම. වේලාවක් ගමනෙ අතරමග රැඳි සිටීමට සිදුවිය. මෙම අවස්ථාවෙම වාගේ ඒ අසල පිහිටි නිවසක සිවිල් වැසියෙකු වැසිකිළි යාම සඳහා අපගේ රැකසිටි පහරදීමේ බළඇණිය අසලට පැමිණි අතරම 2140 පැයට පමණ ත්‍රස්තවාදීන් ද මෙම රැකසිටි පහරදීමේ බළඇණිය ගමන්ගත් මාර්ගයේ පිටුපසින් වාගේ ගමන් ගෙන ඇත.

07. මේ අවස්ථාවේදීම රැකසිට පහරදීමේ කණ්ඩයේ අණදෙන්නා විසින් ප්‍රහාරය එල්ල කළහොත් සිවිල් වැසියා ද ප්‍රහාරයට මැදිවන හෙයින් සිවිල් වැසියා හට දුවන්නට කියා කෑ ගසනවාත් සමගම ත්‍රස්තවාදීන් විසින් අත් බෝම්බයකින් දමා ගසා පලා යාමට තැත් කල අවස්ථාවේදී රැකසිට පහරදීමේ බළඇණිය විසින් ප්‍රතිප්‍රහාර එල්ලකිරීමේ දී ත්‍රස්තවාදීන් පලාගොස් ඇත. මෙම ගැටුමේ දී අත්බෝම්බයක් හමුවූ අතර, ත්‍රස්තවාදීන්හට තුවාල සිදුවී ඇති බව සිවිල් වැසියන්ගෙන් දැනගැනීමට ලැබුණි. මෙහි දී රැකසිට පහරදීමේ කණ්ඩායමේ සෙබලුන් දෙදෙනෙකුහට සුළු තුවාල සිදුවිය.

08. 1997.04.28 වන දින 'බී' කණ්ඩායමේ නිලධාරී අණදෙන වන කපිතන් ඩබ්ජීජී සිසිරකුමාර ශ්‍රීලපාහ, සෙ/9ඩී00537 කෝප්‍රල් ප්‍රේමරත්න ඩබ්එම් සහ සෙ/9ඩී00151 ලාකෝ කුමාර එස්එස් යන අයවළුන් විසින් ප්‍රදේශයේ ජංගම මුර සංචාරයක යෙදී සිටින ලදී. එහිදී අවරංගල් බටහිර ග්‍රාමයේ දී ත්‍රස්තවාදීන් 04 දෙනෙකු මාර්ගයේ කතා කරමින් සිට ජංගම මුරසෙබලුන්දුටු විගස ඉන් දෙදෙනකු පාපැදියකනැග පලා ගිය අතර, දෙදෙනකු නිඅ වන මා විසින් අත්අඩංගුවට රැගෙන මා භාරයේ රඳවා ගෙන පැනගිය ත්‍රස්ථයන් දෙදෙනා පසුපස කෝප්‍රල් ප්‍රේමරත්න හා ලාකෝ කුමාර යන සෙනීන් දෙදෙනාහට ලුහුබඳින ලෙස නියෝග දුනිමි. මෙහි දී පලාගිය ත්‍රස්ථයන්

විසින් ලාකෝ කුමාර වෙත අත්බෝම්බයකින් දමා ගසා පිස්තෝලයකින් වෙඩි තබා ඇත. වෙඩිහඩ මධ්‍යයේ කෝප්‍රල් ප්‍රේමරත්න විසින් ද අවට කඳවුරු වලට දන්වා සහායක හට පිරිස් ගෙන්වා ගැනීමට හා ප්‍රදේශය වට කිරීමට ආධාර වන ලෙස ඉල්ලා සිටින ලදි. මෙහි දී මිනිත්තු කීපයක් තුල දී අවට කඳවුරුවල හට පිරිස් සහාය වූ අතර ලාකෝ කුමාර විසින් එක් ත්‍රස්තවාදියෙකු මරා දමන ලදී. මෙහි දී ලාකෝ කුමාර හට සුළු තුවාල සිදුවිය. වෙඩි වැදී සිටිය දී ලාකෝ කුමාර විසින් ලුහුබැඳ ප්‍රහාර එල්ල කළ අතරම, ත්‍රස්තවාදීන් එල්ලකල ප්‍රහාරයෙන් සිවිල් වැසියෙකුහට ද, තුවාල සිදුවිය. තව ද සිවිල් ගම්මානයක් අසල විශාල වශයෙන් සිවිල් වැසියන් ගැවසෙන අවස්ථාවක කිසිදු සිවිල් අයෙකුහට හට පිරිස් එල්ල කරන ලද ප්‍රහාරයන්ගෙන් හානියක් සිදු නොවන ආකාරයෙන් ප්‍රහාර එල්ල කර ඇත. එම ප්‍රහාරයේ ප්‍රතිඵලයක් වශයෙන් ආරක්ෂක හමුදාව විසින් පහත සඳහන් වෙඩි ද්‍රව්‍ය අඩංගුවට ගන්නා ලදී.

09. ක්ලේමෝ බෝම්බ 05 යි
වයර් රෝල් 02 යි
ක්ලෝමෝ පිපිරවීමට ගන්නා බැටරි
අත්බෝම්බ 02 යි
ටී 81 අවි 01 යි
පිස්තෝල පතරෝම්
වෙනත් වෙඩි ද්‍රව්‍ය
තවත් ත්‍රස්තවාදීන්

10. ඉහත වෙඩි ද්‍රව්‍ය වලට අනුව ත්‍රස්තවාදීන් විසින් විශාල ප්‍රමාණයක ප්‍රහාරයක් ආරක්ෂක හමුදාවන්හට එල්ල කිරීමට සූදානම්ව ඇති බැව් දැන ගැනීමට ලැබුණු අතර, මෙම ප්‍රහාරය මගින් සිදුවීමට තිබූ විශාල ප්‍රහාරය වැළැක්වීමට ලැබීම අප ඒකකයට විශාල ගෞරවයක් වී ඇති බැව් ද පැවසීමට හැකිය.

**නි/2942 කපිතාන් ඩබ්පීජී සිසිරකුමාර**
**ශ්‍රීලපාහ**
**"බී" කණ්ඩායම 9(සෙව්) ශ්‍රීලපාහ**
**පුත්තූර්.**

# මගේ අගය වැනසුන හැටි....

මම විරෝධාර රණවිරුවෙකුගේ නිවාඩු ඉල්ලුම් පතක් වෙමි. මම මෙය ලියන්න අදහස් කලේ මාහට දිනක් සිදුවූ අකරතැබ්බයක් ඔබ සියලු දෙනාටමදැන ගැනීම සඳහායි. මම දිනක් යාලුවෙකුගේ මුදල් පසුම්බියකට වී හොඳට නිදගෙන සිටියෙමි. එවිට යාලුවා එකවරම මුදල් පසුම්බිය දිගහැර මාව එළියට ගත්තා. පස්සේ එයි කිවෙ මොකක් ද දන්නවා ද?

මෙහෙ වරෙන් මචං. උඹ ප්‍රවේසම් කළ හොඳටම ඇති. දැන් නමා උමේ වෙලාව, උඹ කොහොම හරි සාජන් මේජර් සර් ගෙන් දවස් දාහතරක් නිවාඩු ඉල්ලල දිපන් යැයි කීවා. ඒ විතරක් නෙවි යාලුවා ටිකක් වටපිට බලලා මට ආදරයෙන් හාදුවක් දුන්නා. ඊට පසුව යාලුවා මා ඒ පිට මේ පිට පෙරළලා හොඳට කියෙව්වා. ඒවා නම් මට ඇහුනෙ නැහැ. ඊට පස්සේ මාව හයදුප අය මගේ ඉතිරිකර තිබූ හිස්තැන් වලට අවශ්‍ය යාලුවාගේ විස්තර ලීවා. ඊට පස්සේ මාව ආදරයෙන් අත්දෙකෙන්ම අල්ලලා ආපසු යාලුවා ලියූ දේවල් කියෙව්වා. කියවලා අන්තිමට මොකද දන්නවා ද කිවේවෙ.

මේක ලිවා හරිද මන්ද ගිය සැරේ එකනම් ලිවේ විකිරි බංඩා, දැන් අබිසන්, මේ සැරේ උාත් නැහැ. හරි ඇති.... හරි ඇති. ඒත් කෝප්‍රල් ළඟට යන එකනෙ වැඩේ. එනකොට ඇතින් ඇසුනා කෝ... කෝ... ලීව් ෆොම් එක තාම පුරවන වද කියල ඩබල් ද මොකක්ද කීවා. මම හිතන්නේ දෙකක් වෙන්න ඇති. අනේ ඒ හඬට යාලුවා හොඳටම බයවෙලා මාව අරගෙන පොතක් ඇතුලට දමලා එයත් අරගෙන කෝප්‍රල්.... කියලා හඬ ආව දිහාවට දිව්වා. එහෙම යන කොට පොත මැද්දට දාපු මගේ ඇස්දෙක එළියට ඇවිල්ලයි තිබුනෙ. මම දැක්කා කෝප්‍රල් හොඳ පොල්ලකුත් අතට අරන් යාලුවා එන දිහාව බලාගෙන ඉන්නවා. යාලුවා කෝප්‍රල් ළඟට ඇවිත් අර මම ඇතුලට දමපු පොත එක අතකට අරවගන එයාගේ කකුල උස්සලා දඩෝං ගාලා පොළොවට ගැසුවා. මගේ ඔලුවත් එක්ක ගැස්සුනා. ඊට පස්සේ කෝප්‍රල් පොත අරනට අරන් එය පෙරළලා මාව එළියට ගත්තා. අරගෙන මගේ යාලුවා ලියාපුවා කියවලා මේක වැරදියි අයියෙ කියලා කිව්වා.

ඊට පස්සේ මොකද දන්නවා ද මට කලේ කිසිම අනුකම්පාවක් නැතිව මාව ගුලි කරලා යාලුවාට දුන්නා මාව කන්න කියලා. අනේ ඉතින් යාලුවා මට කට ඇතුලට දාගෙන හෙමිහිට හැපුවා. සමහරවිට මට රිදෙයි කියල වෙන්න ඇත. ඊට පසු යාලුවා කෝප්‍රල්ගේ කාමරයට එක්ක ගෙන ගිහින් කෝප්‍රල් ගේ පෙට්ටියෙන් මගේ යාලුවෙකු ගෙන කෝප්‍රල්ම එහි හිස්තැන් වලට යාලුවාගේ විස්තර පිරෙව්වා. ඊට පස්සේ යාලුවාට මෙන්න මෙහෙම කිව්වා.

"රයිට් තමුසෙ නිවාඩු ගිහිල්ලා එන කොට ලීව්ෆොම් දහයක් ගේන්න ඕන. පැ...හැ.. දැ..ලි..ද... යාලුවා මාව කලින් අතට අරන් ආපසු කකුල උස්සල බිම ගහල එයා ඉන්න තැනට ඇවිත් මොක දන්නවා ද මට කලේ. "මට දැන් උඹෙන් වැඩක් නැහැ උඹ පලයන් කුණු ගොඩට. එහෙම කියලා මාව පාගලා විසිකලා. අනේ මාව කොහෙන්ද ආපු සුළඟකට හසුවෙලා මුදලට පෙරලී ගියා. "මගේ අගය සැනසුන හැටි."

..... අහෝ දුකකි....

**සෙ/302501 කෝප්‍රල් රත්නායක සීඩී**
**බී කණ්ඩායම**
**8 ශ්‍රීලපාහ**

# සෙවනැල්ලක් සේ රැඳී සිටින්නට

පුරා මාස ගණනක් තිස්සේ උතුරු කර ක්‍රියාත්මක ප්‍රදේශයේ අරයාලෙයි, කොලොම්බුතුරෙයි ඇතුළු අවට ප්‍රදේශයන් රුදුරු ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයෙන් ආරක්ෂා කර ගැනීම හා දියත් කර ඇති ආරක්ෂක කොටු පවුරු ආරක්ෂා කිරීමේ කාර්යයෙහි නියැලී සිටින අතරවාරයේ මා හට පැවැරුණු රාජකාරී කොටස අවසමන්කර ලද සුළු විවේකයෙන් මෙවන් කරුණු පෙළක් ඔබ හමුවේ තබන්නට ලැබීම ද මා ලද භාග්‍යයක් කොට සලකමි.

අප බළඇණිය වන II වන ශ්‍රී ලංකා පාබල හමුදව ගත්කල ඉතා දීර්ඝ ඉතිහාසයක් නොමැති මෑත යුගයේ ශ්‍රී ලංකා පාබල ඒකකයන් පෙළට එක් වූ නව සාමාජිකයෙකි. එහෙත් මෙම ඒකකය වෙත එකතු වී සිටින නිලධාරී / සෙසු නිළ පිරිස දෙස බලන කල අද්දැකීම් වලින් සහ යුධමය පළපුරුද්ද ඉතා ඉහල තළයක ඇති සැම අතින්ම පිරිපුන් අදහස් හා සිතුවිලි සමුදයක් ඇති පිරිසක් හැටියට අවධාරණයෙන් යුතුව මා හට කියා පාන්නට හැකියාවක් ඇත. එලෙසම අප ශ්‍රීලපාහ රෙජිමේන්තුවට අයත් අනෙකුත් නිත්‍ය ශ්‍රීලපාහ ඒකකයන් වෙතින් මෙම බළඇණිය වෙත ඒක රාශී වී නව බළඇණියක් ස්ථාපනය කෙරුණ ද දැන් අපසිටින්නේ එක් මවු තුරුලේ සිටින දරුවන් පිරිසක් වශයෙන් බව මේ කියවන ඔබටත්, අදහස් එක් කර ලියා දක්වන මා හටත්, ආඩම්බරයට කරුණක් බව නිහතමානීව පෙන්වා දෙන්නට පුළුවන. විශ්වාසනීයත්වය, අවංක භාවය සහ ක්‍රියාශීලිත්වය පෙරදැරි කරගත් අණදෙන නිලධාරී තුමන් ප්‍රමුඛ සියළුම නිළධාරී /සෙසු නිළ පිරිස තමන්ගේ රට ජාතිය ආගම යන තිදොර කෙරේ සැම විටම ක්‍රියාවට නගන්නට උත්සාහ ගනුයේ මේ දැයට ආවේණික වූ සහ අපට අවශ්‍ය වූ සාමය සමෘද්ධිය සහ තිරජීවනය මේ ධරණී තලය තුල ගොඩ නගන්නටයි. එවන් සිතුවිලි සමුදයක් පෙරදැරි කරගෙන අද මෙම යාපනය අර්ධද්වීපය තුල වෙසෙන අසරණ ද්‍රවිඩ වැසියන්ගේ හිතසුව පිණිස විවිධ ගණයේ ක්‍රියාකාරකම් සිදු කර ඇති අතර, ඉදිරි කාලයේ දී ද එයට වඩා වැදගත් වැඩ පිළිවෙලවල් වලින් හෙබි ක්‍රියාකාරකම් සිදුකරන්නට කටයුතු කරන ලබන බව මේ අවස්ථාවේද අපට පෙනෙන්නේට ඇත. එසේම ඒ සැම අවස්ථාවකදීම අප ඒකකය තව තවත් දිරි ගැන්වීම පිණිස 512 බළසේනාවේ බළසේනාධිපති තුමන් ප්‍රමුඛ කාර්ය මණ්ඩලය වෙතින් ලැබෙන නොමද සහාය සහ දිරි ගැන්වීම ඒකක අණදෙන නිලධාරී තුමන් ප්‍රමුඛ අප සියළු දෙනාට විශාල ශක්තියක් වූ බව එක සිතින් කියන්නට පුළුවන.

දීර්ඝ කාලයක් තිස්සේ රුදුරු එල්ටීටීඊ ත්‍රස්තවාදී ග්‍රහණයට තෙරපෙමින් නොයෙක් තාඩන පීඩන වලට ලක් වෙමින් සිටි අසරණ ද්‍රවිඩ වැසියන් සහ ඔවුන්ගේ දෙපල ඉඩකඩම් අල්පමේය ලෙස ද තඹයකට හෝ මායිම් නොකොට විනාශකර දමන්නට මේ යුධ සමාජය කුරිරු විය. ඒ සියල්ලන්ගේම ලත් ජයග්‍රහණයන් සහ මුළු හමුද පාලන තන්ත්‍රය තුලින් ක්‍රමක් ක්‍රමයෙන් ඒ විනාශ වෙමින් තිබූ ප්‍රදේශයන් වල නැවත වරක් ද්‍රවිඩ වැසියන්ගේ ශ්‍රමයෙන් ඔප් නැංවුනු ගෙවතු අලංකාර වන්නට විය. ඔවුන්ගේ නිවෙස්වලට නව එළියක් වැටෙන්නත් වීම පමණක් නොව යාපනය අර්ධද්වීපය තුළම නව ඉරක් පායා එළිය මතු වන්නට විය. ඒ සැම දෙයක්ම පිටුපස සෙවනැල්ලක් මෙන් සිටියේ අප හමුද හට පිරිස් බව කියන්නට පුළුවන. එහෙස්ම මෙම ඒකකයට ආවේණික වුන ආරක්ෂිත බළප්‍රදේශය තුළ වෙසෙන ද්‍රවිඩ වැසියන් සහ ඔවුන්ගේ වතු පිටිද ඉතා අලංකාර වන්නට වූයේ අප බළඇණිය මගින් කිසිදු ජාතිභේදයකින් තොරව සලසා දී ඇති නිදහස් පාලන රටාව සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට නන්විද අන්දමින් උදව් උපකාර කිරීමෙන් බව සිතා අප සැමට සතුටු විය හැකිය. එහෙත් එද අප හමුදවන් එකට පෙළසැදී දියත් කරන ලද 'රිවිරැස' ක්‍රියාත්මකය තුලින් අප සතු බළය මොනතරම් ශක්තිමත් ද යන්න රුදුරු ත්‍රස්ථවාදියාට පෙන්වා දීමට හැකිවී ඇති අතර, එම ක්‍රියාත්මකයේම ක්‍රියාත්මක කරන ලද II වන සහ II වන අධියරයන් තුලින් සිදු කරන ද මෙහෙයුම් කටයුතු වලින් මුළු මහත් යාපනය අර්ධද්වීපය අප හමුදවන් සතුකර ගන්නට හැකිවීම අප ලද විසිතුරු ජයග්‍රහණයකි. එයින් පෙනී යන්නේ අප සැම දෙනා එකට එකතු වී එකම අරමුණකින් ක්‍රියා කලහොත් අප ඇති බළය බිඳ දමන්නට තරම් කිසිදු බළවේගයකටවත් මේ දේශයේ ඇති කිසිදු බළවේගයකටවත් ඉවත් කර දමන්න නොහැකිවන බවයි.

ඉතින් මේ දේශයේ සදාචාරය දිගුකල් රඳවා ගන්නට අප හදවත් තුළ ඇති සතුට කොතරම් නම් බලගතු ද, එලෙසම රුදුරු ත්‍රස්තවාදි ග්‍රහණය තුරන්කර දමා සිංහල මුස්ලිම් ද්‍රවිඩ වැසියන් එකට එකතුකර මේ දේශයේ යලිදු සාමයක් ඇති කරලන්නට අපට නිරතුරු ශක්තිය ධෛර්යය ලැබේවායි එකම සිතින් අප ප්‍රාර්ථනා කරගනිමු. සැම සතුරු බළවේගයක්ම අපට ඇති යෝධ ශක්තියෙන් වනසා දමා නව මාදිලියක ජීවන රටාවක් අනාගත පරපුරට දායාදකර තියා මා මෙලොවින් සමුගෙන ගියත් මාගේ නාමය හෝ මේ දේශයේ සදකල් රැඳේය යන සිතුවිල්ල ඇතිව අපගේ සේවය ඉත සිතින් යුතුව ඉටු කරලන්නට සැම විට අවධාරණය කරගනිමු. මතු යම් දිනෙක අප මේ කරුණු ලබන උදරතර මෙහෙවර තලින් අපගේ පවුල්වල සහෝදර සහෝදරියන් හට සහ දූ දරුවන් හට නිදහසේ තම ජීවන රටාව ඉදිරියට ගෙන යන්නට හැකියාව ලැබෙනු ඇතැයි මොහොතක් සිතන්න.

II වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව වටා එක්වුන විණය ගරුක සෙබළ පිරිසකුත් ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තු මව තුමියගේ II වන පුත්‍ර රත්නය වශයෙනුත්, මේ දේශයට සේවය කරන්නෙමු.


සැකසුම :
සෙ/304017
**කෝප්‍රල් පියසේන සේනාධීර ඊඩබ්ජී**
II බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව
බලඇණි මූලස්ථානය
යුධ හමුද කඳවුර,
අරියාලෙයි, නුවර පාර - යාපනය.

# "ශ්‍රීලපාහ 6 වන බළඇණිය කයිට්ස් වැසියන් අතරේ"

'ඊලාම් දේශය' දිනා ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන සාමකාමී ජන ජීවිතයට හානිකර අයුරින්, රාජ්‍ය විරෝධී ත්‍රස්තවාදී ක්‍රියාවන්හි යෙදෙන එල්ටීටීඊ ද්‍රවිඩ ගරිල්ලා සංවිධානයේ කඩාකප්පල්කාරී ක්‍රියාවන්ට විසඳුම් යෙදීමේ දී 'ලක්රජය' හා 'එල්ටීටීඊ'ය අතර පවතින වත්මන් අර්බුදකාරී යුද්ධය ඇතිවිය. දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ බහුල වශයෙන් ව්‍යාප්තව පවතින ත්‍රස්තවාදී ක්‍රියා මර්ධනය කිරීමේලා, රජයේ සන්නද්ධ හමුද නිරන්තරයෙන් ත්‍රස්තවාදීන් සමග ගැටුන ද, එම ප්‍රදේශ වල පදිංචි බහුතර සාමකාමී දමිළ ජනයාට හිරිහැර කිරීම, මර්ධනය කිරීම හෝ අඩන්තේට්ටම් කිරීමේ කිසිදු අදහසක් හෝ අවශ්‍යතාවයක් රජයට මෙන්ම ආරක්‍ෂක හමුදවන්ට ද නොවීය.

පසුගිය වකවානුවේ දී දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශවල 'එල්ටීටීඊ' ය ත්‍රස්තවාදී ක්‍රියා මගින් තම අණසක පතුරුවා තිබූ බව අප කවුරුත් පිළිගන්නා සත්‍යයක් වුව ද, එකී රාජ්‍යයක් තුළ වෙසෙන සාමාන්‍ය ජනයාගේ අත්‍යවශ්‍ය සේවාවන් සැපයීමට රජය හා ආරක්‍ෂක හමුද මෙන්ම නොයෙකුත් ස්වේච්ඡා සංවිධාන ද දැඩි වෙහෙසක් දැරූහ. කෙසේ වෙතත් ත්‍රස්තවාදීන්ගේ කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් අත්‍යවශ්‍ය සේවාවන් යථා තත්ත්වයෙන් පවත්වාගෙන යාමට නොහැකිවීමෙන් ජන ජීවිතය අවුලට පත් වී පීඩාකාරීත්වය වර්ධනය වුවද, එල්ටීටීඊ සංවිධානයේ 'සිහින ඊලාම් දේශය' දිනා ගැනීමේ 'සිහින පොරොන්දු' කෙරෙහි විශ්වාසය තැබූ සමහරෙක් හා ඔවුන්ගේ තර්ජනීය බලපෑම්වලට ලක් වූ අහිංසක ජනයා මෙම පීඩාකාරී කටුක පරිසරයේ අනාථ වූහ.

ත්‍රස්තවාදී ග්‍රහනයේ අනාථව සිටින අහිංසක ජනතාව මුදගෙන 'සාමය' උදකරලීමේ අරමුණින් ක්‍රියාත්මක කළ 'රිවිරැස' මෙහෙයුම මගින් 'එල්ටීටීඊ' සංවිධානයේ 'සිහින ඊලාම් දේශය' සිහිනයක්ම බවට පත් කරමින් සන්නද්ධ හමුදවන් යාපනය නගරය ඇතුළු ප්‍රදේශය තම ආධිපත්‍යයට නතුකර ගැනීමේ දී ඔවුන් ජාත්‍යන්තර වශයෙන් ගොඩනගාගෙන තිබූ ව්‍යාජ ප්‍රතිරූපය බිඳ වැටුනා මෙන්ම තම සගයින් හා තර්ජනීය බලපෑම් මත ඔවුන්ගේ ග්‍රහනයේ සිටි සාමාන්‍ය ජනයා ඔවුන් කෙරේ යම්තරමින් තබා තිබූ විශ්වාසය ද ගිලිහී ගියේ ය. එහෙත් ත්‍රස්තවාදීන්ගේ තර්ජනීය බියගැන්වීම් වලට ලක් වූ ප්‍රදේශවාසීන් වැඩි පිරිසක් තම ගම්බිම් අතහැර පළාගොස් සිටි බැවින් ආරක්‍ෂක හමුද ආධිපත්‍යයට නතු වූයේ ජනශූන්‍ය භූමිය පමණි.

එහෙත් මූලික අරමුණ සාක්‍ෂාත් කර ගැනීමේ අභිප්‍රායෙන් නැවත ක්‍රියාත්මක කළ 'රිවිරැස 02 හා 03' මෙහෙයුමේ දී ආරක්‍ෂක හමුදවන්හි අණසකට පත් විශාල ප්‍රදේශයක වූ ලක්‍ෂ සංඛ්‍යාත ජනයා සන්නද්ධ හමුදවන් කෙරෙහි තම විශ්වාසය තබා ත්‍රස්තවාදීන්ගේ දැඩි විරෝධය හා මරණීය තර්ජන ද නොසළකා තම ගම්බිම් වෙත පැමිණ නැවත පදිංචි වූහ. සන්නද්ධ හමුදවන් ලත් මෙම සුවිශේෂ වූ ජයග්‍රහනයෙන් පසු අහිංසක ජනතාවගේ ජනජීවිතය නංවාලීම සඳහා අකර්මන්‍යය පැවති අත්‍යවශ්‍ය සේවාවන් යථා තත්ත්වයට පත් කිරීම පිණිස සේනාංකාධිපතීන්, බලසේනාධිපතීන් හා ඒකක අණදෙන නිලධාරීන් සිට සෑම මට්ටමේ අණදෙන්නෙකුටම මහත් වෙහෙසක් දැරීමට සිදුවිය.

රිවිරැස 03 මෙහෙයුම අවසන්වීමත් සමග 'පේදුරුතුඩුව' කඳවුරේ ස්ථානගතවීමෙන් පසු ඒකක බල ප්‍රදේශයේ පදිංචිව සිටි දහස් සංඛ්‍යාත අසරණ ජනයාගේ විවිධාකාර වූ ප්‍රශ්නවලට විසඳුම් සැපයීමට ඒකක අණදෙන නිලධාරී මේජර් ඩීයූ ද ලැනරෝල්, ආර්ඩබ්පී, ආර්එස්පී තුමන් හට සිදුවිය. පේදුරුතුඩුව කඳවුරේ ස්ථානගතව සිටි කෙටි කාලය තුළ දී ප්‍රදේශවාසී දමිළ ජනයාගේ අඩාලව පැවති ජන ජීවිතය නගා සිටුවීමේලා විශාල මෙහෙයක් සිදුකල අතර, අකර්මන්‍යව පැවති ධීවර කර්මාන්තය ආරම්භ කිරීමසඳහා අවශ්‍ය ආම්පන්න ලබාදී මුහුදු යාමට අනුමැතිය ලබාදීම, කළුකඩ හිමියන්ගේ සූරා කෑමට ලක්ව සිටි අහිංසක ජනයාට සහනයක් වශයෙන් 'සුභ සාධක වෙළඳසැල්' ආරම්භ කිරීම හා ගරාවැටී ජරාවාස වී තිබූ පාසැල්, රෝහල් මෙන්ම කෝවිල් ශ්‍රමදන මගින් ප්‍රතිසංස්කරණය කරදීම වැනි දෑ ප්‍රමුඛත්වයේලා සඳහන් කළ හැක. ප්‍රදේශවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස ඒකකය මගින් සිදුකළ විවිධාකාර ව්‍යාපෘති කෙරෙහි පැහැදුනු අහිංසක ජනයාගේ නොමද ගෞරවය ඒකකයටත්, එමගින් පොදුවෝ යුධ හමුදව වෙතත් හිමිකර දීමට සමත් වීම අපලත් තවත් ජයග්‍රහණයකි.

'ත්‍රිවිධ පහර' මෙහෙයුමට සහභාගී වී 27 වන බලසේනා මූලස්ථානය යටතේ කයිට්ස් දූපතේ ස්ථානගත වීමෙන්පසුව ද සිවිල් ජනයා සමග සමීපව රාජකාරී කිරීමේ අවස්ථාව නැවත වරක් මෙම ඒකකය වෙත උදා වූ අතර, මෙහි දී මුලින්ම ප්‍රදේශයේ ජන ජීවිතය පිළිබඳ අධ්‍යයනය යෙදුණු අණදෙන නිලධාරී තුමන්ට, ඔවුන් නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ දිවි ගෙවන බව මනාව අවබෝධ විය. විශේෂයෙන්ම ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන, ධීවර කර්මාන්තය හා ස්වයං ව්‍යාපාර පවත්වා ගෙන යා නොහැකිව සිටින බව අනාවරණය වූයෙන් ඒවායෙහි අඩුපාඩු ඉතාමත් කෙටි කාලයක් තුල දී සපයා දී යථා තත්ත්වයට පත් කර ගත හැකිවීම ප්‍රදේශවාසීන්ට මහත් අස්වැසිල්ලක් විය. එසේම ජනතාවගේ පොදු අවශ්‍යතාවයන් වූ පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා සපුරා දුනි.

1. අඩාලව තිබූ ධීවර කර්මාන්තය ආරම්භ

කිරීම පිණිස අවශ්‍ය මූලික කටයුතු හා මුහුදු යාම සඳහා අනුමැතිය ලබාදීම.

2. අසරණ රෝගීන් සඳහා වෛද්‍ය සායන පැවැත්වීම.

3. කළුකඩ හිමියන්ගෙ සූරාකෑමට ලක්ව සිටි අසරණ ජනයා වෙනුවෙන් සුභ සාධක වෙළඳසැල් ආරම්භ කිරීම.

4. ගරා වැටී තිබූ නිවාස අළුත් වැඩියාකර ගැනීම සඳහා අමුද්‍රව්‍ය සපයා දීම.

5. පාසැල්, රෝහල් හා කෝවිල් ශ්‍රමදන මගින් ප්‍රතිසංස්කරණය කරදීම.

6. අඩුපාඩුවක්ව පැවති පෙර පාසැලක් ආරම්භ කිරීම.

7. බැංකු/වෙළඳසැල්' සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම.

මේ වන විට කර්නල් බීබීඑස් මෙන්ඩිස් ආර්එස්පී, ශ්‍රීලසිරෙ 27 බලසේනාධිපති වශයෙන් පත්වී ආ අතර, ඔහුද ප්‍රදේශවාසීන්ගේ ජන ජීවිතය නංවාලීම සඳහා ප්‍රමුඛත්වයක් දී කටයුතු කළේය. ඒ වනවිට ප්‍රදේශයේ බැංකු කටයුතු අකර්මන්‍යව පැවති බැවින් ස්වයං ව්‍යාපාර ආරම්භ කිරීමට ස්ථානයක් සපයා දීම මූලික අවශ්‍යතාවයක් ලෙස සැලකූ බලසේනාධිපති හා අණදෙන නිලධාරී තුමන් කයිට්ස් දූපතේ මෙම ඒකක 'ඩී' කණ්ඩායම ස්ථානගත ප්‍රදේශයේ බැංකු ශාඛාවක් හා රැකියා නොමැති තරුණියන් සඳහා මැහුම් පාසැලක් ආරම්භ කිරීමට ද තීරණය කළහ.

ඒ අනුව අවශ්‍ය මූලික කටයුතු සලසන ලෙස නිඅ 'ඩී' කණ්ඩාම වෙත දුන් උපදෙස් අනුව කපිතන් ඩීඩබ්ආර්ජේජ් කුමාර ශ්‍රීලපාහ මූලිකත්තවය ගෙන කටයුතු කරමින් 'ඩී' කණ්ඩායම් සෙනීන්ගේ ශ්‍රම ශක්තියෙන් මූලිකවම අවශ්‍යතාවය වූ ගොඩනැගිලි අළුත්වැඩියා කරන්නට යෙදුනි. ප්‍රදේහයේ වූ සීමිත සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගනිමින් ඒකකය වෙතින් සුළු මුදලක් වැයකර භට පිරිස් හි මනා කැපවීම හා උද්යෝගය මත ප්‍රදේශවාසීන් විශ්මයට පත් කරමින් ඉතාමත් කෙටි කාලයක් තුල මනස්කාන්ත ලෙස ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමේ කටයුතු නිම කළහ. මෙය අපගේ හැකියාවන් හා සාමූහික සහයෝගීතාවය මල්පල ගත් අවස්ථාවක් ලෙස හැඳින්විය හැක.

කයිට්ස් දූපත් වාසීන්ගේ සුභ සාධනය සඳහා වූ මෙම ව්‍යාපෘති 96/12/05 දින පෙරවරු 1037 ට යෙදුණු ශුභ මොහොතින් විවෘත කිරීමට යෙදුනි. විවෘත කිරීමේ උළෙලේ ප්‍රධාන ආරාධිතයා වශයෙන් 51 ප්‍රහාරක සේනාංකාධිපති මේජර් ජනරාල් කේජේසී පෙරේරා. ආර්ඩබ්පී. ආර්එස්පි, යූඑස්පි. පීඑස්සී, එම්එස්පී (ඩීර්එෆ්) සහභාගී වූ අතර, විවෘත කිරීමේ කටයුතු ඔහු අතින් සිදුවිය. මහජන සුභ සාධනය උදෙසා ඒකකයෙහි ක්‍රියාකාරීත්වය සේනාංකාධිපති, බලසේනාධිපති හා ප්‍රදේශවාසීන්ගේ ද පැසුමට ලක් වූ අතර, අප සේවය අගයමින් එම ප්‍රදේශවාසීන් ලිපි මගින් ද සිය කෘතඥතාවය පළකර තිබීම අගය කළ යුත්තකි.

ඒකකයෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ පැහැදුනු ප්‍රදේශවාසීන්ගෙන් ද විශාල සහයෝගයක් අප සෙබළුන් වෙත ලැබුණු අතර, එය දූපතේ ආරක්ෂාව පවත්වාගෙන යාමට මහත් පිටුවහලක් විය. ආරක්ෂක හමුදවේ හා පොදුවේ සිංහල ජාතිය කෙරෙහි දමිළ ජනයා දැක්වූ 'ජාතිවාදී' ආකල්පය තුරන් කර ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීමට හැකිවීම යුද්ධයෙන් භූමිය අත්පත් කර ගැනීම මෙන්ම යුධමය වශයෙන් වාසි සහගත බව ක්ෂේත්‍රයේ නියැලී කවුරුත් පිළිගන්නා සත්‍යයකි. කයිට්ස් දූපත් වාසීන්ගෙ ප්‍රසාදය ලබමින් අපලත් මෙ සුවිශේෂ ජයග්‍රහණය යුධ හමුදවට මෙන්ම සාමය අගයන ලක්වැසි සැමගේ අනාගත අභිවෘද්ධියට හේතුවනු නිසැකය. දිවයිනේ සාමය උදකර ලිමට නත් අයුරින් ප්‍රබල දායකත්වයක් දැරූ 6 ශ්‍රීලපාහ නාමයට මතු දිනක ලක්වැසි සැමගේ ගෞරවණීය ආචාරය හිමිවනු නිසැකය.

**සැරයන් ප්‍රීති කුමාර කේඑිආර්**
**(බුද්ධි අංශය 6 ශ්‍රීලපාහ)**

# සැමදා අපට අහිමිද? බක්මහ උළෙල

කොවුලාගේ හඬින් නව අවුරුදු පිබිදෙනවා
උතුරු නැගෙනහිර යුධ ගිනි අඩුවෙවා
මාපිය - හිතමිතුරු - සැමදෙන සිහිවෙනවා
යුද්ධය නිමා කර අවුරුදු සමරනවා

කැවුම් කොකිස් මුං අලුවා තියාගෙන
අම්මා ගෙදර ඇති පෙරමග බලාගෙන
බුලත් හුරුළු හා තෑගි ද සදගෙන
එන්නම් අම්මෙ මා නිවාඩු ලබාගෙන

අලුත් අවුරුද්ද අපහට නැතිවේවි
නමුත් සෙබළු කිසි දිනකදි නොහඬාවි
දේශය රැකගන්න හැමවිට කැපවේවි
දළද සමිඳු සැමවිට අප සුරකීවී

**සැකසුම**
**සෙ/22820 සායෙ නිමල් එස්ඩී**
**2 ශ්‍රීලපාහ (ඒ කණ්ඩායම)**
**යුධහමුද කඳවුර**
**(කලුපාලම)**
**වෙන්කල්අඩි, මඩකලපුව**

# උපන් බිමේ සාමය

ඔබත් මමත් ඉපදුනු මිය ඇදෙන රට
තවත් කෙනෙක් වටකර වැට බඳින විට
අතත් පයත් හකුලාගෙන සිට
යටත් උනොත් නැතිවෙයි තුන් හෙලය හෙට

කොහෙන් ඇවිත් පැන්නත් බල සෙනග සැදී
රටෙන් අඩක් දෙන්නට අප නොමැත බැඳී
උපන් බිමෙන් අහලක් කිසිවකුට නොදී
පෙමෙන් රකිමි මෙහි උරුමය නොසිට බෙදී

රටත් රැකීමේ ඉහලම වග කීම
අණක් නොවේ මෙහෙයකි දෙන සැනසීම
එහෙත් මරා සියගාණක් රැක දීම
පිනක් කියා සලකමි මම හැමදම

අපෙන් ගන්න බැරිදේකට අත පෑවා
සටන් වදින කාටත් මෙය වැට හේවා
මෙයින් පසුව මේ වෙඩිහඬ නොඇ සේවා
උපන් බිමේ සාමය මල් පිබී දේවා

**සෙ/5 ඩී0135 6**
**සායෙ තිලකරත්න ජයකොඩි ඒ**
**5 ශ්‍රීලපාහ ඒ කණ්ඩායම**
**වෙල්වෙරිකුලම් ත්‍රිකුණාමලය**

# 1997-04-30 දින රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේ පැවති සාදය



රෙජිමේන්තු අධිපති නිලධාරී නිවස්නයට පැමිණි අවස්ථාව



රෙජිමේන්තු අධිපති ඇතුලු නිලධාරීන් රෙජිමේන්තු ගීතය ගායනා කරන අවස්ථාව



සාදයට පැමිණ සිටි නිලධාරීන් සුහද සාකච්ඡාවක



රෙජිමේන්තු සේනාවිධායක ශ්‍රීලපාහ සමග සාදයට පැමිණි නිලධාරීන් කිහිපදෙනකු ලබා ගත් ජායාරූපයකි



රාත්‍රියේ භෝජන සංග්‍රහයට සියලු නිලධාරීන් සහභාගීවී භුක්ති විඳින අවස්ථාවකි



නිලධාරී නිවස්නයේ සාදයේදී රෙජිමේන්තු අධිපති සියලු නිලධාරීන් අමතන අවස්ථාව

# 1997-04-26 දින රෙජිමේන්තු අධිපතිගේ ප්‍රධානත්වයෙන් බනි/සැර නිවස්නයේ පැවති සාදය


රෙජිමේන්තු අධිපති බනි/සැරයන් නිවස්නයේ ගරු සභාපති සමග නිවස්නයට පැමිණි අවස්ථාවේදී ගත් ඡායාරූපයකි


රෙජිමේන්තු බනි/සැරයන් නිවස්න සාදයේදී සාමාජිකයින් කිහිප දෙනකු සුහද හමුවීමක්


රෙජිමේන්තු අධිපති රාත්‍රියේ භෝජන සංග්‍රහයකට අසුන්ගෙන සිටින අවස්ථාවේදී ගත් ඡායාරූපයකි


බනි/සැරයන් නිවස්න සාමාජිකයින් රාත්‍රියේ භෝජන සංග්‍රහය භුක්ති විදින අවස්ථාවේදී ගත් ඡායාරූපයකි


තුවාක අංශය භාරව සිටින ව/සැරයන් ජයනෙත්ති කේ්ඩිඑන් හට රෙජිමේන්තු අධිපති විසින් ස්තුති කරන අවස්ථාවේදී ලබා ගන්නා ලද ඡායාරූපයකි


රෙජිමේන්තු අධිපති විසින් සියලුම අයවලුන් අමතන ලද අවස්ථාවකි

# තල්පත් හා එකලූ සිත

රුක්තල් උතුර හැර අන් දෙස දුර්ලභය
දැසට දැක්ම අරුණෝදය පියකරුය
පිං සිදු වන්න දෙවියන් හා වටිනවය
ආයුෂ බොහෝ වේවා ඔබ නිර්මලය

අද විවිධ ජාතීන් වශයෙන්.එක් එක් වූ පිල්වලට බෙදී ජීවත් වන ලක්වැසි ජනතාවට පුරාතනයේ විජය රජුගේ ආගමනයෙන් බිහි වූ දැහැමි මිනිස් කොට්ඨාශයක් වශයෙන් වංශගතව ඒකරාශි වී අන්‍යොන්‍ය සැබැඳියාවෙන යුතුව ජීවිත දාහය ගෙවූහ. කෙසේ හෝ ත්‍රි සිංහලය එක් සත්ව හා එක් සිත්ව මහත් වූ පෞරුෂත්වයෙන් සම්පිණ්ඩව නිවහල්ව පෙර ගිය ගමන් වලකාලමින් බාධා ඇති කරමින් ද නිස්කාරණයේ කණකොකා හැඬීමට වී දැනට තරමක කාලයක් ගත වී ඇත. අද වේදනාත්මක කඳුලු මේ දරණී තලයේ වගුරුවාලමින් සිත්පිත් ඇත්තවුන්ට භුක්ති විඳීමට දායාද කොට ඇති අමිහිරි කටුක ක්‍රියාකාරකම් වලට මූලික පෙරදම පෙළ ගැහි නැගී සිටියේ අතලොස්සක් වූ ද්‍රවිඩ ජනයා තුළ ජනිත වූ පුහු ඊලාම් මතවාදී සංකල්පය නිසා ය. ජාතියේ දේශයේ අවාසනාවට මෙන් මෙවැනි දඩබ්බර මෘගයන් රැලක් බිහිවූයේ කුමන පවකින්දෝ යන්න අද කා අතරත් මුවගට නැගෙන වචනෝද්වලියකි.

මේ ලක් භූමි තලය ඕනෑම මනුස්සයකුට මෙන්ම ඕනෑම රුක්ෂලතාදියකට මණරම් වූ කදිම සෝභාත්මක බිමකි. මේ බිමෙහි වඩාත් වැදගත් අන්තර්ගතය වන හිස කොටස මෙන් වූ භූමි භාගය සමන්විත වූයේ යාපන අර්ධද්වීපය කේන්ද්‍රස්ථාන කොට ගෙන ය. විශාල වශයෙන් ද්‍රවිඩ ජනයාගේ වාස භූමිය වූ මේ පොළොව තලයට අපි පා ඔසවත්ම අපි දෘෂ්ටි කෝණයට අසු වූයේ බැලු බැලු හැම තැනකම ඉතා සාරවත්ව වැඩුණු රුක්ෂයකි. මෙය නමින් දමිල වැසියාගේ කල්ප රුක්ෂය විය. එනම් අද ක්‍රියාන්විතයක දී යුධ කටයුතු මෙන්ම ප්‍රමුක්තියක් හිමි වන තල් රුක්ෂයයි. ඇත්තෙන්ම තල් රුක්ගමුවක් සහිත ප්‍රදේශයක තිබෙන අති උතුම් චමත්කාර ජනක වායස්ථබාවය කාගේත් මන දොල සපුරාලනු වැනිය. සිය වැඩ කටයුතු නිමවා ගතේ දාහය නිවාලනු වස් මුලු ප්‍රදේශයම රක්ත වර්ණ කරමින් ජලස්නානය උදෙසා තල් අතු ඉති පඳුරු අතරින් මුහුදට හිමින් හෙමින් පා ඔසවන හිරු ඇති සන්ධ්‍යා භාගයක ඇති වන ස්වාභාවික අලංකාරත්වය කෙසේනම් වචන වලින් විස්තර කරම් ද?

එතෙකුදු වුවත් මෙතරම් අනූන වටිනා තල් රුක්ෂයට ද බුර බුරා නැගෙන යුධ ගිනිදැල්වල ආහාෂය ලැබ ගැන්ම යුද්ධය තරම්ව පැරණිය. දමිළ ජනතාව සිය දිවි දෙවැනි කොට සලකාලනුයේ මේ මනරම් වූ තල් රුක්ෂයට ය. ඒ කොතෙක් ඔවුන්ගේ ජීවිතය හා බැඳි පවතී ද යන්න තම දියණියන්ගේ විවාහ කටයුතු වල දී දෙනු ලබන දැවැද්ද තරමටම මෙය වටිනාකමින් යුක්තව තිබීමෙන් පෙනී යයි. එදවස උතුරු කොනින් දකුණේ ජනයා වෙත තල් ගසින් නිර්මාණිත රස කැවිලි විසිතුරු බඩු ආදී දේවල් ලැබුනේ උතුරේ ජනතාවගෙන් හිමි වූ දායාද නැතහොත් ත්‍යාගයන් ලෙස ය. එමතු ද නොව එමගින් ජාතීන් ද්විතිය අතර මනාලෙස වැඩුණු අන්‍යොණ්‍ය සුහදතාවය මිත්‍ර ශීලත්වය චිරාත් කාලයක් විරාජමානව පැවති බව පසුගිය වකවානුව දෙස බැලීමේ දී මොනවට පැහැදිලි වේ. අද ඇත්තෙන්ම අසරණ දමිළ ජනයා තිරසාර මිහිරි අනාගතය අපේක්ෂාවෙන් මූදුන් පමුණුවා ගෙන පොළොවේ මිහිදන් කෙරු තල් රුක්ගමු වලින් පල ප්‍රයෝජන ගැනීමට නොහැකිව ලත් තැන්ම ලොප් වි ඔවුහු අසරණව සුසුම් හෙලති. හේතුව කුරිරු වූ යුද්ධයේ ආධිහස්තයට ඔවුන් මෙන්මතල් රුක්ෂවය ද ගොදුරු නොවීම යයි කාට නම් කිව හැකිද,

ටොක්... ටොක්... ප්‍රදේශයම දොන්කාර දෙමින් අසෙන ශබ්දය ලෙස මඳක් විවර වූ කන් ඇතිව මඳක් විමසා බැලූවෙමි. සොල්දදුවන් කීපදෙනෙකු වටවි වාතලයට පා කර හරින පොරොව තල හඩ පහර මොන තරම් ප්‍රදේශයම හකුළුවා තබන්නට සමත් වී ඇද්ද යන්න විමර්ශනාත්මකව බලන්නෙකුට හෝ අසන්නෙකුට හැර වෙන කෙනෙකුට ඇසේ ද යන්න කිම තරමක් අපහසු ය. ඔබ නිසා දහස් ගණන් සොල්දදුවන් ලබන සිය ජීවිත ආරක්ෂාව පිළිබඳ ඔවුහු නිරන්තරයෙන්ම ඔබට සිය කෘතඥපූරුව ස්තූතිය පිරිනැමීමට මොහොතකදු මැලි නොවෙති. එමෙන්ම ඔවුහු හද පත්ලෙන්ම ණය ගැති වෙති. ඔබ මේ ලක ජනිත කරවීමට උත්සුක වූ ඔබේ ඥාතීන් යුද්ධයෙන් හෙම්බත්ව ඔබව හැරද තල්ලු වී ගොසිනි. ඉඳින් අපගේ පූර්ණ නිරන්තර වෑයම නම් ඔහුන් ඔබ අබියසට පැමිණීමට හැකි පසු තලය ගොඩ නැගීමයි. ඇත්තටම තල් රුක්ෂවයට කතා කරන්නට කටක් තිබුනෙනම් කඳුලු වගුරන්නට නුවන් තිබුනේ නම් කට හඬින් මුලු ප්‍රදේශයම දුක් බරින් දොන්කාර වන්නට තිබිණි. සිය කඳුලින් මුලු ප්‍රදේශයම දොරගලා යන්නට ඉඩ තිබිණි. එසේ වුනි නම් කොටි මෘර්ගයන්ගේ අවසානය එනම් සෝද පාලුව ඇති වන්නට ද ඉඩ ප්‍රස්ථා තිබුණි.

බෙදුම්වාදී ඊලාම් යුද්ධයට පිඹුරු පත් සකස් වූනද පටන් මෙන් තුරාවට ලක්දරු විරුවන් ගේ සමීපතම මිතුරා බවට පත් වී සිටින හිතෙයිෂී වන්නයා 'තල් රුක්ෂය' ඔබයයි කිවහොත් එය නිවැරදි යයි මට හැඟෙමි. දිනක් ගතහොත් සොල්දදුවා සිය කාලයෙන් වැඩිම කාලයක් තල් කඳන් හා සැදුනු බංකරයක් තුල කාලය ගෙවයි. සියහැඩි වැඩීමට මහෝපකාරී වූ සිය නිවසට වඩා මිහිරි ගාම්බීර තෝතැන්නක් බවට මෙකී වූ බංකරය අද පත්ව ඇති බව සක්සුදක්සේ පැහැදිලිවේ. ඉතින් මේ හා බැඳි මිත්‍රශීලි බාවය මෙමගින් මනා ලෙස පිළිබිඹු වන්නේ ය. ශක්තිමත් මහමෙරපර්වතය මෙන් රිජු ලෙස ශක්තිමත්ව රිජුව සිටින ඔබ සොල්දදුවන් විසින් සිය හැඩි දැඩි දැත්වලට මිරිකුණු පොරෝ පහරින් බිම ඇද දමණුයේ ඔබ නිසා ඇති ඊරිෂ්‍යාවත් ක්‍රෝදයත් හෝ අසතුටක් ඇති නොවනු නිසා වෙන් වග සඳහන් කරනුයේ කැමැත්තෙනි. ඔබගේ ශක්තිමත් කඳන් නමැති අත් දඬු මොන තරම් ඔහුන්ට සේවයක් සලසනවා ද යන්න වචනක වලින් කිව නොහැහේ. යුද්ධයෙන් මිය යන්නන් සිහිකරනු වස් තැන් තැන්හි පිහිටුවනු ලබන ස්මාරකන්සේ ඔබගේ ස්මාරකයන් ද ඔබ ජීවත්ව සිටි භූමි භාගයේ හේම පිහිටුවාලන්නට සොල්දදුවෝ කාරුණික වී සිටිති. ඇත්තෙන්ම තල් කඳ හා මුල කොට

ස්මාරකයක සිරි නොගන්නේ යම් දිනෙක දමිල වැස්සන් වූ ඔබේ ඥාතීන්ට ඔබ මෙකී යුද්ධයේ වැදගත් කාර්ය භාරයක් ඉටු කරලීම වස් ගෞරව ප්‍රණාම දැක්වීමට අවැසි ප්‍රතිෂ්තම්බන අප විසින් ඉදිකොට ඇත්තෙමු. අපි දු එකි වූ සත් කාර්යයට අවස්ථාව ලත් විග සම්මාදන් වීමට අධිටන්කර ගෙන ඇත්තෙමු.

අද මේ ලක ඇති භූමි කම්පාව ඉදිරි අනාගත පරපුර වෙනුවෙන් යුහුසුළුව සන් සුන් කොට නොගත මුලු සමහත් දේශය ස්වර්ණමය කර යුතුම වන්නේ ය. එනම් පුහුමාන්‍යයෙන් ඉදිමී අවි අත දරා පැමිණෙන්නා වූ ද්විපාද කොටියනට මරු පහරක් එල්ල කළ යුතු ය. ඒ කිරීමට ප්‍රථම සොල්දදුවන්ගේ ආකවරණය සලසා ගත යුත්තක්ම වන අතර ඒ කාර්ය බාරය අද ඉටු කිරීම සඳහා ඔබ අතට සිය වගකීම ලබා ගෙන සිටිනු දැක්මෙන් අප හදවත් තුල ජනිත වන අහිංසක සතුට මෙතකැයි කියා සීමාවන් දැක්විය නොහැක. දේශ දේශාන්තර අතැර. ලෙයින් කඳුලින් දහ දියෙන් අනුකම්පා නෙතින් බලා සිටින වග අපිදු නොදන්වා නොවේ. අපි හැමගේ චිත්ත සන්තාණය තුළ නිතරම උපදින දැහැමි සිතුවිල්ල නම් අපට කුලූපග මිත්‍රයෙක් වූ ඔබට යහතින් වැඩීමට අවශ්‍ය වටාපිටාව නිර්මාණය කිරීමයි.

ඉදින් තල් රුක්‍ෂනය ඔබගේ මෙහෙය අදට මෙන් හෙටටත් අත්‍යාවශ්‍ය වන්නේ ය. එම අවශ්‍යතාවය ගැන්මට නම් ඔබ වර්ගයා තව කාලාන්තරයක් සිය අකමැත්තෙන් වුව ද මේ කුරිරු බිමෙහි ජීවත් විය යුතුම වන්නේ ය. ඊට අපි අපේ සුහපැතුම් ප්‍රාර්ථනා කිරීමට මෙය අවස්ථාවක් කොට ගනිමු.

ඉතින් මිතු තල් රුක්‍ෂය. මල හිරු රැස් බසිනා සන්ධ්‍යා රක්ත වර්න කාන්තිය ඔබ අතු ඉති පතර අතරින් නිෂාචර කත වැළඳ ගැනීමට තව ඉතිරිව ඇත්තේ ඇසි පිය හෙලන තරම් වූ කාලාන්‍රයෙකි. 'ගිනි අවිය අත දරන්, තල් වැටේ මායිමේ....' ඔබ හා සුසැදි යුගමය වූ ස්වර රටාපත් අතරට වී මොහොතක් සැනසුම්ව ඔබ අග පසගින් මනා කොට හැඩ වැඩ වූ බංකරය ද ඔබ හා සමගින් විචිත්‍ර වූ සෝභාව දැනට මසිතින් යන්තම් විචිත්‍රණය කොටගෙන ඔබට බොහෝ ආයුෂ පතා ඔබ ගැන හැඟීම් බරව මෙයට තිත තබමි. .

**නි/62117 ලූතිනන් ඒඑම් අනුරසිරි, ශ්‍රීලපාහ 8 ශ්‍රීලපාහ "සී" කණ්ඩාම අලිමංකඩ**

# ඇගැයීමක්.....

යුද්ධය යන නම ඇසූ පමණින්ම අපට නිතැතින්ම සිහියට එන්නේ එයට කැපවූ වීරෝධාර සෙබලුන්ය. ඔවුන් නිරන්තරයෙන්ම තම ජීවිතය කැපකොට රටේ ඒකීය ස්වභාවය සහ සාමය ආරක්‍ෂා කිරීම පිණිස ජීවත්ව සිටී. දැනට යුද්ධයේ පවතින තත්ත්වය මත භාහිර ලෝකය හා සම්බන්ධ වී කටයුතු කිරීමට අවස්ථාව සෙබලාට අහිමිව ඇත. එහෙත් යුද බිමේ සිටින අප වැනි අය රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ අමතක නොකිරීම ගැන සෙබලුන් වූ අප සිය දහස් වාරයක් ස්තුති වන්ත විය යුතු ය. මන්ද යත් අපගේ නිර්මාණ හා කුසලතාවයන් යුධ බිමේ සිටිය දීම කලඑළි දැක්වීමසඳහා ඉදිරිපත් කර ඇති 'වයිට් හැකල්' නම් වූ ත්‍රෛමාසික සහරාවයි.

යුධමය තත්ත්වයෙන් පීඩාවට පත්ව සිටින අප වැනි සෙබලුන් හට තම හැකියාවන් නිර්මාණය කොට කලඑළි දැක්වීමට අවස්ථාව සලසා ඇති හෙයින් අප ලබනුයේ අසීමිත වූ සතුටකි. එතුලින් අපගේ යුධ වෙහෙස මොහොතකට හෝ අමතක කරලීමට අවස්ථාව සැලසී ඇත. රෙජිමේන්තුව තුළ සිදුවන විශේෂ සිදුවීම් හා ක්‍රියාන්විත තොරතුරු ද, නි/සෙනීන්ගේ නිර්මාණ හා අදහස් උදහස් ද සහරාව තුලින් නෙත ගැටෙන සෙබලා තුළ යම් හෙයකින් හෝ යහපත් වූ ප්‍රතිඵලයක් කරා ගෙන යාමට සමත් වී ඇති බැව් ඉතාමත්ම සතුටින් යුතුව සටහන් කරමි. මෙය හුදෙක්ම මාගේ අදහසක්ම පමණක් නොව සිය දහසක් වූ ශ්‍රීලපාහ සෙබලුන් වෙනුවෙන් මා මෙසේ අපරිමිත සතුටින් යුතුව සනිටුහන් කළෙමි.

**සෙ/304133 කෝප්‍රල් චන්ද්‍රසිරි ඩබ්ඊ**
**"බී" කණ්ඩායම 8 ශ්‍රීලපාහ, අලිමංකඩ**

# සෙබළ සොයුරාණෙනි නුඹට......

දෙපා රිදවන දරුණු විෂකටු සුවඳ වනමල් විලස පිළිගෙන පැරදුමෙන් එන අඳුරු සෙවනැලි ජය බිමක් ලෙස වැළඳ ගනු මැන...
සිතන සිතුමන් පතන පැතුමන් පැතුවිලසින් ඉෂ්ඨ වන්නට දයාවෙන් මේ ලෙසින්.
තැබුවෙමි පුංචි සටහනක් සොයුරාණෙනි දයාබර නුඹට....
අඳුරු කුරගගා එන ගුප්ත වූ නිශාවේ... තල් වැටට තනි රකින සෙබල සොයුරාණෙනි
අසිරිමත් සුව සිහින යායේ සරන්නට වරම් නොම දේද නිදි දෙව් දියණි නුඹේ නෙතට....
භයංකර රාත්‍රියේ රැහැයි ගී ගැයෙයි නිති.. හුදකලා නුඹේ සිත ඉතිං පැරෙයි රිදෙයි....
තිඹේ මුදු යොවුන් විය කෙලි සිනාකවට කම්... යුධ බිමේ පාළුවේ ගියාදෝ....
සුමට නුඹේ සුරතල් සුරතේ ආකවරණය ලබයි නිති නොහික්මුණු ගිනි අවිය.. හන්තානේ අඩවියේ කෙම්බිමට
පිං පිරු අහිංසක නුඹ ද,... මේ යුධ බිමට පෙම් කරන දහසකුත් රුපුන් කැල සැරි සරණ මානයේ...
නුඹේ විකුම් දකිව් ගහනකද මිහිමව ද, ... වීරයෙකි හෙට ද නුඹ මතකයේ රජ කරන මහ මැදුර....
රජකරන සිටුවරුන් හට නොවෙයි.... නඹේ කටුක දිවියේ රස හඳුනනා මෙමට මිස රණ මතින්
නුඹේ සිත එඩිතරව නැගෙද්දී.... මන්මතින් රහති නුඹ හා සමවූ තවත් අය....
දිනෙක මිහිතලය තුල නිදන් වන විට සැවොම.....
ඉන් නුඹේ ජීවය උදරයි.... උදරයි....

**සෙ/304373 සාසෙ පුෂ්පකුමාර ඒඑච්ඩී**
**"බී" කණ්ඩායම 8 ශ්‍රීලපාහ අලිමංකඩ**

# What's New
## තොරතුරු බිඳක්....

Major K J Jayaweera

### උසස් කිරීම් නිලධාරී - 2(සෙව්) ශ්‍රීලපාහ

නා/මේජර් නිලයට
කපිතාන් ටීජේබී කරුණානායක. ශ්‍රීලපාහ - 1995.12.01 දින සිට
කපිතාන් ටීඑච් කරුණාදාස, ශ්‍රීලපාහ - 1996.05.27 දින සිට
කපිතාන් ඩබ්ජී ආර් විජේරත්න, ශ්‍රීලපාහ - 1996.05.27 දින සිට
කපිතාන් ජීබී පෙරේරා, ශ්‍රීලපාහ - 1996.05.27 දින සිට
කපිතාන් ඩීඑම් විජේරත්න, ශ්‍රීලපාහ - 1996.05.27 දින සිට

නා/මේජර් නිලයට උසස් කිරීම් - 5(සෙව්) ශ්‍රීලපාහ
කපිතාන් බීඩබ් දෙල්ගහපිටිය, ශ්‍රීලපාහ - 1995.12.01 දින සිට
කපිතාන් කේඩීඑස් වීරසිංහ, ශ්‍රීලපාහ - 1995.12.01 දින සිට
කපිතාන් කේඑන් පෙරේරා. ශ්‍රීලපාහ - 1995.12.01 දින සිට
කපිතාන් ඩීඒසී ජයතිලක, ශ්‍රීලපාහ - 1995.12.01 දින සිට
කපිතාන් ඩබ්පීකේ පියරත්න, ශ්‍රීලපාහ - 1995.12.01 දින සිට
කපිතාන් ආර්එම්එච් රත්නායක, ශ්‍රීලපාහ - 1995.12.01 දින සිට
කපිතාන් එල්බීඩීඑච්එස් ලක්ෂ්මන්, ශ්‍රීලපාහ - 1996.05.27 දින සිට
කපිතාන් ඩබ්එච්පීබීජේ වීරකෝන්, ශ්‍රීලපාහ - 1996.05.27 දින සිට
කපිතාන් එච්එම්ඒබී හේරත්, ශ්‍රීලපාහ - 1996.05.27 දින සිට

### යාකිරීම් / පත් කිරීම් - නිලධාරී

නි/2244 මේජර් ඩබ්ඩීඑල්පී වික්‍රමසිංහ, ශ්‍රීලපාහ - 1996.08.31 වනදින සිට මාස 1 කනතුර සඳහා ශ්‍රීලංයුහසෙව්පුපා - දියතලාව වෙත යා කරන ලදී.

### උසස් කිරීම්- නිලධාරී

නි/2317 කපිතාන් ජීවීජී චන්ද්‍රසෝම ශ්‍රීලපාහ - 1995.12.01 වන දින සිට බලපාන පරිදි නා/මේජර් නිලයට අතිගරු ජනාධිපතිතුමිය විසින් උසස් කර ඇත.
නි/3433 ලුතිනන් ඩබ්ඩීආර් ගුණසේකර, ශ්‍රීලපාහ - 1996.06.15 වන දින සිට බලපාන පරිදි නා/කපිතාන් නිලයට යුධහමුදාපති විසින් උසස් කර ඇත.

### ඈතුලත් කිරීම් - කෙඩෙට් නිලධාරී

කෙනි 2/ලුතිනන් සී ජයවීර, ශ්‍රීලපාහ, කෙනි 2/ලුතිනන් එස්ඒඩී ජිනේන්ද්‍ර, ශ්‍රීලපාහ - නත් නිලධාරීන් ස්වේච්චා හමුදාවට බඳවාගෙන 1996.12.21 දින සිට මෙම ඒකයේ සක්‍රිය සේවා රාජකාරී සඳහා යොදවා ඇත.

### පත් කිරීම් - නිලධාරී

නි/2317 මේජර් ජීවීජී චන්ද්‍රසෝම, ශ්‍රීලපාහ - 1997.01.01 වන දින සිට බලපාන පරිදි ඒකකයේ 2 අණදෙන නිලධාරී වශයෙන් අනි විසින් පත්කර ඇත.
නි/3432 කපිතාන් ඩබ්ඩීආර් ගුණසේකර, ශ්‍රීලපාහ - 1997.01.01 වන දින බලපාන පරිදි ඒකකයේ විධායක අධිකාරී වශයෙන් අනි විසින් පත්කර ඇත.

සැකසුම සෙ/12504 ලාකෝ දයානන්ද, ඒපීඑන්එස් (නිතකාන.ම ලිපිකරු) 4 ශ්‍රීලපාහ
මූලස්ථානය 9(සෙව්) ශ්‍රීලපාහ යුධහමුද කඳවුර, නාවක්කිරි යාපනය

Major General AMU Seneviratne
No. 06, Kariyawasam Place,
Kalapaluwawa, Rajagiriya.
12 th June 1997

The Commandant
Sri Lanka Light InfAntry
Panagoda Catonment
Homagama.

I sincerely thank the Regimental Commander, Commandant, all Officers and Men of the Regiment for inviting me and acording a farewell on the day of my retirement from service on completion of thirty two years and four months in the Regiment and the Army. Let me put it on record that the occasion was grand, befitting a retiring General replete with the traditional Guard of Honour an address to officers and men, tea with all ranks, culminating with Dinner cum Get-to-gether of the Officers, their ladies and children.

My wife and I thank the Regimental Commander and the Commandant for providing us an opportunity to meet many senior and junior officers and their ladies which will carry happy memories with us for ever. It was a honour bestowed on us to continue our association with the SLLI Family even after retirement.

My wife and I wish the Regimental Commander, all Officers, men and their families all the very best.

***Major General AMU Seneviratne***

### දරු උපත් නිලධාරී

ලුතිනන් කර්නල් ජේඑස් මාසක්කාර, ශ්‍රීලපාහ ගේ බිරිඳට 1997.05.15 දින ඩර්ඩන්ස් රෝහල කොල්ලුපිටියේ දී පුතකු උපනි. නම සෙනාල් රනුල් මාසක්කාර
මේජර් කේ. ජේ. ජයවීර , ශ්‍රීලපාහගේ බිරිඳට 1997.06.30 දින යුධ හමුද රෝහලේ දී පුතෙකු උපනි. නම කේ ලුසිත් ලුක්ෂාන් ජයවීර

### දරු උපත් සෙසු නිල

සෙ/11412 ච/සැරයන් අබේසේකර ඩබ්එම්වී ගේ බිරිඳට 1997.04.06 දින බොරැල්ල කාසල් රෝහලේ දී දුවකු උපනි. නම ලක්ෂාන් හංසිකා අබේසේකර
සෙ/12026 ච/සැරයන් වික්‍රමසිංහ පීජීඩබ් ගේ බිරිඳට 1997.01.25 දින කෑගල්ල රජයේ රෝහලේ දී පුතෙකු උපනි. නම : මතරංජු ප්‍රතිභා වික්‍රමසිංහ
සෙ/13185 සැරයන් ජයතිලක ඩීඑච්ගේ බිරිඳට 1997.01.02 දින බොරැල්ල කාන්තා රෝහලේ දී පුතෙකු උපනි. නම හලිෂාන් ගිහාන් ජයතිලක

## දරු උපත් සෙසු නිළ

සෙ/14006 සැරයන් කරුණාතිලක එල්ජීඑස්ගේ බිරිඳට 1996.10.01 දින අනුරාධපුර රජයේ රෝහලේ දී දුවකු අපනි. නම උමේෂිකා දිල්ෂානි කරුණාතිලක

සෙ/13627 ලා/කෝප්‍රල් බණ්ඩාර කේඑච්එම්ඩබ්ගේ බිරිඳට 1997.04.12 වන දින කුරුණෑගල රජයේ රෝහලේ දී දුවකු උපනි. නම සචිනි හර්ෂිකා කුමාරි කරුණාරත්න.

4 ශ්‍රීලපාහ

සෙ/11685 බති II ගාමිණි කුමාර වී ගේ බිරිඳට 1996.09.17 වන දින යුහ රෝහලේ දී දුවකු උපනි. නම විදූනගේ හංසනී භාග්‍යා

සෙ/12590 ච/සැරයන් ජයසේන කේඑල්එස්ගේ බිරිඳට 1997.01.20 දින යුධහමුද රෝහලේ දී දූවකු උපනා. නම කේඑල්ඒ සූභාෂිනි මුතුමාලි

සෙ/12689 ච/සැරයන් අබේගුණරත්න එම්පීඑස් ගේ බිරිඳට 1996.04.12 දින කැගල්ල මූලික රෝහලේ දී පුතෙකු උපනි. නම : අකිල හේෂාන් අබේගුණරත්න

සෙ/11829 ච/සැරයන් විජේසිංහ ඩබ් ගේ බිරිඳට 1996.02.21 දින කැගල්ල මහ රෝහලේ දී දූවකු උපනි. නම : තිලිණි මදූෂිකා විජේසිංහ

සෙ/15421 කෝප්‍රල් රත්නායක ආර්කේවීපී ගේ බිරිඳට 1996.11.28 දින අලව්ව රජයේ රෝහලේ දී දූවකු උපනි. නම සෙහානි දනුෂිකා රත්නායක.

සෙ/300609 කෝප්‍රල් කරුණාරත්න ඩබ් ගේ බිරිඳට 1996.09.09 දින කහටගස්දිගිලිය රජයේ රෝහලේ දී දූවකු උපනි. නම ෂාරා කුමුදුණි කරුණාරත්න

සෙ/13126 ලාකෝ බණ්ඩාර එච්ජීපී ගේ බිරිඳට 1996.10.13 ගලගෙදර රෝහලේ දී දූවකු උපනි, නම - සුජාති වාසනා කුමාරි බංඩාර

6 ශ්‍රීලපාහ

සෙ/300693 ලාකෝ සිසිරකුමාර එච්ඒ ගේ බිරිඳට 96.09.20 වන දින ඇහැලියගොඩ රජයේ රෝහලේ දී දූවකු උනි. නම එච්ඒ චමිකා නිමාෂා කුමාරි

සෙ/300847 ලාකෝ චන්ද්‍රසේන ජේඑම් ගේ බිරිඳට 197.03.07 වන දින නාවලපිටිය මූලික රෝහලේ දී පුතකු උපනි. නම: ජේඑම් කවිෂ නිෂාන් ජයසිංහ

සෙ/13732 සාසෙ ජයරත්න එම්ජීඩබ්ජී ගේ බිරිඳට 1995.01.09 වන දින අනුරාධපුර රජයේ රෝහලේ දී දූවකු උපනි. නම : එම්ජී ඉරේෂා සුභාෂිණි ජයරත්න.

7 ශ්‍රීලපාහ

සෙ/14234 කෝප්‍රල් සිරිවර්ධන ඩබ්ඒගේ බිරිඳට 1997.06.07 දින කැගල්ල රජයේ රෝහලේ දී පුතෙකු උපනි. නම: ඩබ්ඒ කසුන් ගිම්හාන් සිරිවර්ධන

10 ශ්‍රීලපාහ

සෙ/12731 සැරයන් චන්ද්‍රසිරි එස්එල් ගේ බිරිඳට 1996.08.08 දින උතුරු කොළඹ රජයේ රෝහලේ දී පුතකු උපනි. නම : තණුෂ්ක දිල්හාන් චන්ද්‍රසිරි

සෙ/15985 කෝප්‍රල් කරුණාරත්න වයිජීඑන් ගේ බිරිඳට 1996.05.29 දින ද සොයිසා කාන්තා රෝහලේ දී පුතෙකු උපනි. නම: රංග ශ්‍යාමල් කරුණාරත්න

සෙ/12654 කෝප්‍රල් අබේකෝන් එත්ඒ ගේ බිරිඳට 1996.09.03 දින කොළඹ නවලෝක රෝහලේ දී පුතෙකු උපනි. නම: ආනන්දික ඉසුරු අබේකෝන්

11 ශ්‍රීලපාහ

සෙ/300002 ලාකෝ විජේසේන බංඩාගේ බිරිඳට 1995.12.14 දින රෝහලේ දී පුතකු උපනි. නම: කමේෂ් දුමින්ද කුමාර විජේබංඩාර

සෙ/14688 කෝප්‍රල් විමලසිරි ඩබ්ජී ගේ බිරිඳට 1996.08.31 දින කොළඹ කාසල්වීදියේ කාන්තා රෝහලේ දී පුතකු උපනි. නම: විදාන ගමගේ බුද්ධික ප්‍රදීප් කුමාර

12 ශ්‍රීලපාහ

සෙ/13290 කෝප්‍රල් හෙට්ටිආරච්චි ජීඑච්ඒආර් ගේ බිරිඳට 1997.02.17 දින පේරාදෙණිය රජයේ රෝහලේ දී පුතෙකු උපනි. නම: කුෂාන් අකලන්ක හෙට්ටිආරච්චි.

## මංගල සීනු

සෙ/301374 කෝප්‍රල් රණවීර එච්සීඑන් - 7 ශ්‍රීලපාහ 1995 මැයි මස 05 වන දින අවිස්සාවේල්ල උඩුවිල පදවිංචි සමන්ති නන්දිකා ප්‍රියදර්ශණී සමග අවිස්සාවේල්ල විවාහ ලේකම් කාර්යාලයේ දී විවාහවන ලදී.

සෙ/304266 සාසෙ එදිරිසිංහ ඩබ්ජීජේ - 4 ශ්‍රීලපාහ 1997 ජුනි 05 වන දින හේවා ගමගේ නයනා ක්‍රිෂාන්ති මෙනවිය සමග මැදිරිගිරිය විවාහ ලේකම් කාර්යාලයේ දි විවාහ වන ලදී.

සෙ/13133 සැරයන් රාජපක්ෂ ආර්පීඑන්එස් 97.03.21 වන දින කනම්පැල්ල විවාහ ලේකම් කාර්යාලයේදී වීරකුට්ටි හෙට්ටිආරච්චිලාගේ රෝෂනී ජනකාන්ති මෙනවිය සමහ විවාහ විය.

සෙ/15991 කෝප්‍රල් බස්නායක බීඑම්ජීජේ 1997.05.23 වන දින වාරියපොලදිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී කෝනාර මුදියන්සේලාගේ දීපානි නිලන්ති කුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/300188 ලාකෝ ගුණවර්ධන එච්එස්කේ 95.09.23 වන දින අළුත්ගම විවාහ රෙජිස්ටාර් කාර්යාලයේ දී රුවන්පාලගේ දර්ශනී තරංගා මනතුංග මෙනවිය සමග විවාහ විය.

සෙ/301479 ලාකෝ සිරිවර්ධන එච්එම් 97.05.09 වන දින රත්පත්විල විවාහ ලේකම් කාර්යාලයේදී පියසේනගේ පද්මා දිසානායක මෙනවිය සමග විවාහ විය.

සෙ/304294 ලාකෝ දිසානායක එම්ආර්එස් 95.09.07 වන දින දෙහිවල රත්මලාන අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී වීරක්කොඩිගේ අසන්ති කෞශල්‍යා මෙනවිය සමග විවාහ විය.

සෙ/302382 ලාකෝ තිලකරත්න එන් 97.02.27 වන දින රත්නපුර දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී ඉස්මාලගේ මාලා සුභෝධිනි මෙනවිය සමග විවාහ විය.

සෙ/301546 කෝප්‍රල් වර්ණසූරිය ඩබ්එම්එස්ඩී 97.04.30 වන දින නවගත්තේගම විවාහ ලේකම් කාර්යාලයේ දී රණසිංහ ආරච්චිලාගේ ප්‍රියන්තා නිල්මිණි රණසිංහ මෙනවිය සමග විවාහ විය.

සෙ/303034 ලාකෝ වීරසිංහ එම්එම්ජී 97.01.27 වන දින කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී හිද්දා දූරගේ ඉන්දු ප්‍රියදර්ශණී මෙනවිය සමග විවාහ විය.

සෙ/303985 සාසෙ රාජරත්න එම්ජීඑල් 97.03.29 වන දින පළාපත්වල විවාහ ලේකම් කාර්යාලයේ දී සිරිසේනගේ සුමිත්‍රා නිලන්ති දිසානායක මෙනවිය සමග විවාහ විය.

සෙ/300153 සාසෙ රුද්‍රිගු බීකේඑම්බී 97.03.12 වන දින ජාඇල විවාහ ලේකම් කාර්යාලයේ දී ජයමාන්න මොහොට්ට්ටිගේ දෝන ඇනී නිශාන්ති චන්ද්‍රිකා මෙනවිය සමග විවාහ විය.

සෙ/305895 සාසෙ අමරසිරි ඩීඑල්එස් 96.11.25 වන දින දිවුලපිටිය අතිරේක දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී ඉමියා මුදියන්සේලාගේ ප්‍රියන්ති ජයලත් මෙනවිය සමග විවාහ විය.

සෙ/302481 ලාකෝ ජයකොඩි එච්ජීඩබ්කේ 1995.11.22 දින සන්ධ්‍යා චන්ද්‍ර කාන්ති මෙනවිය සමග විවාහ විය.

සෙ/304578 සාසෙ විජිතකුමාර ඩීඑම් 1996.11.03 දින යසවතී මැණිකේ මෙනවිය සමග විවාහ විය.

සෙ/303942 ලාකෝ පියසිරි එස්ඩී 1996.12.19 දින නිරෝෂා වික්‍රමසිංහ මෙනවිය සමග විවාහ විය.

සෙ/300112 සාසෙ විජේරත්න ආර්ජී 96.12.04 දින අනෝමා මැණිකේ ඉලංගන්තිලක මෙනවිය සමග විවාහ විය.

සෙ/302262 ලාකෝ නන්දසිරි කේපීඑස් 1996.11.28 දින අනුෂා පුෂ්පකුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/11921 ච/සැරයන් කුලරත්න එල්ඒඑස් 1997.01.06 දින රේණුකා පුෂ්පකුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/12622 සැරයන් ධර්මසිරි ඩීඩබ්එස් 1997.01.23 දින නාලිනී රම්‍යලතා මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/300536 සාසෙ ජයකොඩි ආර්එච් 97.01.25 දින චන්දිමා මෙනවිය සමග විවාහ විය.

සෙ/303173 සාසෙ කුරේ ඩීආර්බී 97.03.19 දින චම්පා කුමාරි මෙනවිය සමග විවාහ විය.

සෙ/301296 කෝප්‍රල් ප්‍රියන්ත කේවිඑස් 1996.12.19 දින තිරංජලා මල්කාන්ති මෙනවිය සමග විවාහවන ලදී..

සෙ/300470 කෝප්‍රල් කුමාරගේ කේඑස් 1995-06-30 දින කැස්බෑව විවාහ ලේකම් කාර්යාලයේ දී කහතුඩුවේ පදිංචි කේ. නිල්වා දමයන්ති මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/00560 සාසෙ රවින්ද්‍ර ව්ඒස්ඩී 1997.02.19 දින එස්ජ් සමන්මලී පෙරේරා මෙනවිය සමග මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී විවාහ විය.

සෙ/15949 ලාකෝ හේමසිරි එච්පී 1996.07.11 දින කටුනායක විවාහ ලේකම් කාර්යාලයේ දී සුනිතා හෙට්ටිආරච්චි මෙනවිය සමග විවාහ විය.

2 ලපාහ ඒකකයට අයත් සෙ/2ඩී1214 කෝප්‍රල් කුමාරදස ටීඑම්ජ් 196.09.27 දින රාජාංගන වම් ඉවුරේ විවාහලේකම් කාර්යාලයේ ද රමාලතා හේරත් මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/2ඩී02026 ලාකෝ සුගත් ඒජ් - 1995.06.07 වන දින අංක 147, කුමාරන් රත්නම් පාරේ පිහිටි විවාහ ලේකම් කාර්යාලයේ දී හෝලු පතිරනලාගේ සුජීවනී කල්දේරා මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/2ඩී01017 ලාකෝ මහින්ද ඒඑම් 1997.03.06 වන දින පාතේගම විවාහ ලේකම් කාර්යාලයේ දී ආර්ජ් චම්පිකා මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/2ඩී02566 සාසෙ අනුරසිරි ජේපී - 1996.09.22 වන දින තිස්සමහාරාම විවාහ ලේකම් කාර්යාලයේදී හේවාලෙද මුල්ලගේ රමණී මෙනවිය සමග විවාහ වන ලදී.

සෙ/300992 ලාකෝ ප්‍රියන්ත කුමාර එම්ජ් 1995 ඔක්තෝබර් 30 දින බුලත්සිංහලගේ බිලේෂා කුරේ මෙනෙවිය සමග අත්තනගල්ල දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ දී විවාහ වන ලදී. 3 (ශ්‍රීලපාහ) සෙ/15711 සාසෙ කරුණාදාස එස්කේ 1997 ජනවාරි මස 16 දින රත්නායකගේ ශාන්ති රත්නායක මෙනෙවිය සමග නොච්චියාගම විවාහ ලේකම් කාර්යාලයේ දී විවාහවන ලදී. (1 ශ්‍රීලපාහ)

ජයසිකුරු ක්‍රියාත්විතයේ දී මියගිය නි/සෙසු නිල නාම ලේඛනය

1 ශ්‍රීලපාහ 97.06.06 දින

සෙ/14644 කෝප්‍රල් දිසානායක ඩීඑම්පී

3 ශ්‍රීලපාහ 97.05.15 දින

සෙ/13772 කෝප්‍රල් කරුණාපාල ඩී, සෙ/14721 කෝප්‍රල් නිමල් රත්න ඒපී, සෙ/300509 කෝප්‍රල් ධර්මසිරි කේබී, සෙ/303477 ලා/කෝප්‍රල් ධර්මසේන එන්එච්පීකේ, සෙ/303477 ලාකෝ කුලතුංග පී, සෙ/302890 සාසේ කල්පේ එච්එම්පීබී, සෙ/308434 සාසෙ විජේනායක එම්පීජ්, සෙ/303199 සාසෙ ප්‍රනාන්දු ජීඑම්,

97.05.16 දින

සෙ/117292 සාසේ කීර්තිරත්න ඩී.පී, සෙ/101000 සාසෙ තිලකරත්න ඩීපී

97.05.17 දින

සෙ/303491 සාසෙ බංඩාර කේඑම්වී, සෙ/303433 සාසෙ බංඩාර ඩබ්ඩබ්ඩීආර්, සෙ/119111 ආසෙ දයාසිරි හේරත් එම්, සෙ/111675 ආසෙ තිලක් කුසුම්සිරි ටීකේ, සෙ/302471 ලකෝ ලලිත් ඩීජී.

4 ශ්‍රීලපාහ 97.05.18 දින

සෙ/306608 සාසෙ ජයතිස්ස ආර්එම්, සෙ/304259 සාසෙ පියරත්න එන්පීඑස්, සෙ/300592 ලාකෝ නෝනිස් පීකේඑම්එස්.

97.05.25 දින

සෙ/308318 සාසෙ ගුරුසිංහ එන්

97.05.10 දින

සෙ/306598 සාසෙ දිසානායක ආර්එම්යූඑස්, සෙ/309570 සාසෙ කුමාරසිංහ එච්පීජේ, සෙ/306646 සාසෙ රත්නායක ආර්එම්පී, සෙ/23674 සාසෙ ප්‍රේමතිලක එච්ඩබ්

97.06.24 දින

සෙ/15280 සැරයන් කරුණාරත්න ටීඑච්ජ්, සෙ/13794 සැරයන් චන්ද්‍රසිරි එච්එච්, සෙ/301821 කෝප්‍රල් අනුරතිලක කේඑම්,

97.06.25 දින

සෙ/302674 කෝප්‍රල් උදය කුමාර පීජේපී, සෙ/303302 ලාකෝ දිසානායක ඩීඑම්, සෙ/122892 ආසෙ නන්දන යූ, සෙ/89690 ආසෙ දිල්රුක් බීඑච්ජ්, නි/62951 2/ලුතිනන් සිඩී කුමාරගේ ශ්‍රීලපාහ.

6 ශ්‍රීලපාහ 97.06.25 දින

සෙ/11205 බනි II විජේරත්න එච්.

97.06.26 දින

සෙ/306416 සාසෙ විමලසේන එන්

97.06.23

සෙ/308333 සාසෙ ප්‍රියදර්ශන කේඩීසීකේ

97.06.06

නි/302523 2/ලුතිනන් ඩබ්ආර්පීකේ රුද්‍රිගු, ශ්‍රීලපාහ, සෙ/13850 කෝප්‍රල් තිලකරත්න එම්.

97.05.14 දින

සෙ/123678 ආසෙ රුවන් නිශාන්ත එම්එම්, සෙ/305879 සාසෙ චන්දන ප්‍රේමලාල්, සෙ/309857 සාසෙ විමල ධර්ම ඩබ්ඩී.

7 ශ්‍රීලපාහ 97.06.10 දින

සෙ/301990 කෝප්‍රල් ඒකනායක ඩබ්එම්

10 ශ්‍රීලපාහ 97.06.10

නි/300942 ලුතිනන් ඒඑම් විජේරත්න, ශ්‍රීලපාහ

97.05.13

සෙ/123150 ලාකෝ සිසිර කුමාර ඩබ්එම්

97.05.15

සෙ/306921 ලාකෝ බණ්ඩාර කේඑම්ජ්, සෙ/306921 සාසෙ සෙනවිරත්න ඩබ්පීජී, සෙ/306960 සාසෙ තිලකරත්න ඒඑම්.

97.06.06

සෙ/302995 ලාකෝ ගාමිණී ටීඑච්එම්, සෙ/307979 සාසෙ බාලසූරිය බීඑම්සී, සෙ/118349 ආසෙ ප්‍රේමරත්න යූ, සෙ/304278 සාසෙ පෙරේරා ඩබ්ආර්, සෙ/307755 සාසෙ රාජකාරුණා ආර්ඩබ්කේ.

97.06.08

සෙ/30655 ලාකෝ සමරසිංහ වයිආර්එස්කේ, සෙ/309743 සාසෙ ජයතිස්ස එච්ජ්, සෙ/123052 ආසෙ පෙරේරා කේජ්ඩීපී.

97.06.10 දින

සෙ/304704 ලාකෝ ප්‍රියන්ත ඩබ්ඩීඑස්,
සෙ/306785 සාසෙ සුනිල් ආර් ,
සෙ/122065 ආසෙ මදනායක එම්කේඑල්,
සෙ/305901 ලාකෝ රත්නායක ආර්එම්ආර්,
සෙ/306976 සාසෙ ප්‍රේමදන්ද්‍ර එම්ජේජ්,
සෙ/306979 සාසෙ බංඩාරනායක බීඑම්එස්,
සෙ/119409 ආසෙ සුනිල් එස්කේකේ,
සෙ/309139 සාසෙ හරිස්චන්ද්‍ර ඩීඑස්ඩී,
සෙ/306940 සාසෙ බංඩාර ඩබ්පීඑල්එස්එන්,
සෙ/306971 ලාකෝ මහින්දරත්න ආර්පී,
සෙ/300948 ලාකෝ රවීචන්,
සෙ/300969 කෝප්‍රල් හේරත් එච්එම්එච්පී,
සෙ/306503 ලාකෝ ජයරත්න එම්ජීජේ,
සෙ/306190 ලාකෝ දිසානායක ඩබ්එම්එන්,
සෙ/305916 ලාකෝ දිසානායක ඩබ්එම්එන්,
සෙ/305916 ලාකෝ අමරසේන පීඩබ්පී,
සෙ/304316 ලාකෝ චන්ද්‍රසිරි ජේපීජ්,
සෙ/15744 කෝප්‍රල් ගුරුගේ පීඩී,
සෙ/119406 ආසෙ අමරසේකර එස්කේ,
සෙ/309128 සාසෙ නාමල් ජයරත්න වීජ්,
සෙ/304851 ලාකෝ රත්නායක ආර්එම්එස්,
සෙ/306902 සාසෙ නිමල් ඉන්ද්‍රරත්න එන්පී,
සෙ/305130 සාසෙ නන්ද කුමාර ඊජ්,
සෙ/306500 ලාකෝ රයාපන්න එස්සී,
සෙ/306941 සාසෙ විජේසිංහ කේපීජ්,
සෙ/303430 ලාකෝ බණ්ඩාර ඩබ්එම්ජ්,
සෙ/119404 ආසෙ සමන් එම්එච්,
සෙ/12043 ලාකෝ ප්‍රේමලාල් ටීඑම්ජ්,
සෙ/304134 ලාකෝ ජයසිංහ අයිඩීඑච්,
සෙ/303028 කෝප්‍රල් ජයරත්න බීඑච්,
සෙ/303596 ලාකෝ විජේසිරි ඩබ්එම්,
සෙ/306985 ලාකෝ පියදාස එම්ජීඑම්කේ.
සෙ/308497 සාසෙ අනුර බංඩාර ඩබ්එම්,
සෙ/306952 සාසෙ මංචනායක කේඩබ්ජ්,
සෙ/302949 කෝප්‍රල් කරුණාතිලක එන්ජී,
සෙ/303992 ලාකෝ ප්‍රියන්ත එල්ආර්,
සෙ/14352 සැරයන් පත්මසිරි ඩීජීජ්,
සෙ/13870 සැරයන් දොලවත්ත ඩී,
සෙ/13449 සැරයන් වසන්ත කුමාර කේඑල්ජීඑන්,
සෙ/300105 කෝප්‍රල් අධිකාරි ඒඅයිජ්,
සෙ/301869 කෝප්‍රල් රංජිත් කේවයි,
සෙ/302365 කෝප්‍රල් සුරවීර එස්ජ්එස්,
සෙ/306217 ලාකෝ පුෂ්පකුමාර එච්එල්,
සෙ/13622 සාසෙ රත්නායක ඩීඑස්කේ,
සෙ/301568 සාසෙ රණසිංහ ඒකේකේඑස්,
සෙ/305757 සාසෙ උපනන්ද විකේඑස්,
සෙ/307015 සාසෙ රාජපක්ෂ

# ප්‍රීතිමත් ජීවිතයකට මාර්ගය

## 4 වන කොටස

සෙස්සන්ගේ යහපත සහ සතුට වෙනුවෙන් සිය කාලය, ශ්‍රමය සහ ධනය ඇතුළු ඕනෑම දෙයක් කැප කිරීමට ඔබට හැකි නම් සතුට නිතැතින්ම ඔබ වෙත ගලා එයි.

මෙය සිදුවන්නේ කෙසේ ද? මේ පිළිබඳව මෙම ඡේදයේ ඉතා දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට අදහස් කරමි. සතුට වනාහි බෝවෙන රෝගයක් වැනිය. එනම් සතුටින් සිටින්නන් අසල සිටීමෙන් සහ ආශ්‍රය කිරීමෙන් සතුට පැතිරීම සිදුවන බව තේරුම් ගත යුතු ය. එය ඉතා සුළු උදහරණයකින් පැහැදිළි කළ හැකිය. ඔබ කණස්සල්ලෙන් සිටි අවස්ථාවක් මතකයට නගා ගන්න. දැන් ඔබ එවැනි අවස්ථාවල කළ කී දේවල් සිහියට නගා ගන්න. ඔබ එවැනි අවස්ථාවක කරන්නේ සතුටින් සිටින මිත්‍රයෙකු හමුවීමට යාම, නැත්නම් ගීතයක් ඇසීම, චිත්‍රපටයක් නැරඹීම වැනි දේ ය. එනම් අසතුටු සිතුවිල්ල එලවා හැරීම සඳහා සතුටු සිතුවිල්ලක් යොද ගැනීමය. මීළඟට ඔබ ඉතා කණගාටුවෙන් සිටි මොහොතක සිට, ඉතා සතුටින් ගී ගයමින් ප්‍රීති වෙමින් සිටින්නන් අතරකට ගිය අවස්ථාවක් සිහියට නගා ගන්න. එවැනි මොහොතක ඔබ සිතේ පැවැති කණස්සල්ල ක්ෂණයකින් අතුරුදන් වූ බව ඔබට මතක ඇතැයි සිතමි. සතුට වනාහි බෝවෙන දෙයක් යැයි මා කියන්නේ ඒ නිසාය. ඔබ අවට සිටින්නන් සතුටින් සිටී නම් ඒ සතුට නිතැතින්ම ඔබ කරා ද පැමිණේ. මෙය මෙසේ සිදුවන්නේ කෙසේ ද?

සතුටින් සිටින්නන් අතර, සිටින විට සතුටු ස්වභාවයක් දැනීමත්, අසතුටින් සිටින අය අතරට ගිය විටෙක අසතුටකුත් දැනෙන බව අප සැවොම ජීවිතයේ අත්දැකි තිබෙන සංසිද්ධියකි. ඇතැම් පුද්ගලයන් ස්වභාවයෙන්ම නපුරු ගති ඇති අන් අයගේ අසතුටට හේතුවන දේම කරන්නට කැමති අයවළුන් ය. එවැන්නකු දුරින්ම දුටුවිට මුණ නොගැසී මග හැර යාමට පවා ඇතැම් විට ඔබ පෙළෙඹෙනු ඇත. එසේ කිරීමට සිදුවනුයේ එවැනි පුද්ගලයින් විසින් කරන නපුරු දේවල් නිසා පමණක් නොව, එවැනි අයවළුන් විසින් ඔබට දෙන්නේ සිත අසතුටට පත්වන පණිවුඩයක් ය. අන් අය අසතුටට පත්වන දෙයක් පවා කීමෙන් ඇතැම් අය සතුටට පත් වේ. එම මිනිසුන් අන් අය අසතුටට දොම්නසට පත් කිරීමෙන් සතුටට පත්වේ. මෙය මානසික රෝගයකි. එයට පරපීඩා කාමුකත්වය නැත්නම් (Sadism) සාදිසමය යයි කියනු ලැබේ. එහෙත් අන් අය රිදවා ලබන සතුට ඉතාමත්ම තාවකාලිකය. මන්දයත් එම සතුට විශ්ව රීතියට විරුද්ධ සටනක් බැවිනි. මක්නිසාද යත් විශ්ව නීතියට අනුව සතුට හිමි වන්නේ සතුට පතුරන්නාට මිස අන් අයගේ සතුට විනාශ කරන්නන්ට නොවේ. එබැවින් ඔබට අන් අයෙකුගේ සතුට නැති කරන දේවල් කිරීමෙන් වැළකී සිටීමට හැකිනම් එය ඉතා උදාර ක්‍රියාවකි. තව ද එවැනි අය සමාජයේ ඉතා ජනප්‍රිය පුද්ගලයින් බවට පත් වේ. එවැනි අයවළුන් විශිෂ්ඨ පෞරුෂත්වයක් ඇති අය බවට පත් වේ. ඇතැම් අවස්ථාවල නොවැළැක්විය හැකි හේතූන් නිසා ඔබට යම් අයෙකු අසතුටට පත් වන දෙයක් කිරීමට හෝ එවැනි පණිවුඩයක් යම් අයෙකුට දීමට සිදුවේ. එවැනි අවස්ථාවක දී ඔබ විසින් කළ යුතුව ඇත්තේ එම ක්‍රියාව හෝ පණිවුඩය දීම නිසා ඇතිවන අසහනකාරී තත්ත්වය අවම වන පරිදි ක්‍රියා කිරීමය.

මෙතෙක් ලෝකයේ පහළ වූ සෑම ශ්‍රේෂ්ඨ ආගමික නායකයින් විසින් කර ඇත්තේ මනුෂ්‍ය වර්ගයාගේ සතුටට හේතුවන මාර්ගයන් පෙන්වා දීමය. එසේ පෙන්වා ඇති මාර්ග අතර, සුළු වෙනස්කම් තිබුන ද ඔවුන් සියළු දෙනාගේම අරමුණ වූයේ එකම කරුණකි. එනම් අප ජීවත්වන මේ ලෝකය සෑම සත්ත්වයෙකුටම ප්‍රියදයක, සතුටුදායක ස්ථානයක් කිරීමය. ඔවන් සෑම දෙනෙකුම ශ්‍රේෂ්ඨත්වයට පත්ව ඇත්තේ අන් අය සතුටින් තැබීම සඳහා මුළු ජීවිත කාලයම කැප කිරීම නිසා ය. තව ද මෙතෙක් ලෝකයේ පූජිත ජීවිත ගතකල ශ්‍රේෂ්ඨ තත්ත්වයට පත්ව ඇත්තේ ද, අන් අයගේ සතුට වෙනුවෙන් ඔවුන් විසින් කර ඇති අද්විතීය කැප කිරීම් සහ දායකත්වයන් නිසා ය. එබැවින් සෙස්සන්ගේ සතුටට හේතුවන දේ කිරීම උත්තම පුරුෂයෙකුගේ ශ්‍රේෂ්ඨ ගති ලක්ෂණයකි. එමෙන්ම එවැනි අයවළුන් සිය මුළු ජීවිත කාලයම සතුටින් ගත කරන අතර ඔවුන්ගේ නම් ඉතිහාසයේ අමරණීය වනු ඇත. අන් අය සතුටින් තැබීම සඳහා අපට කළ හැක්කේ කුමක් ද? එවැනි දේ කිරීමේ දී යම් යම් සීමාවන් ඇත්ද යන්න මීළඟට ඇතිවන ප්‍රශ්ණයයි. මා දකින අන්දමට එසේ කිසිම සීමාවක් තිබීමට නොහැකිය. මක්නිසාද යත් ඔබ අන් අයගේ සතුට වෙනුවෙන් කැපවන තරමටම ඔබගේම සතුට ද වර්ධනය වන බැවිනි. එහෙත් මෙහි දී සැලකිලිමත් විය යුතු සීමාවන් දෙකක් මම දකිමි.

1. අන් අය සතුටට පත් කිරීමේ දී විශ්ව නීතියට අනුව එසේ කළ යුතු ය. යහපත් ක්‍රම සහ වේද අනුව පමණක් එසේ කළ යුතු ය. උදා: ඔබට මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවෙකු හට මත්ද්‍රව්‍ය ලබාදීමෙන් ඔහුව සතුටට පත් කළ හැක. එහෙත් එමගින් ඔබ කරනුයේ එම පුද්ගලයාව විනාශය කරා ඇද දැමීමකි. එබැවින් එවැනි හිස් මාර්ග වලින් සතුටු කිරීමෙන් වැළකීම.
2. ඔබ විසින් යම් අයෙකුගේ සතුට සඳහා කරන දෙයකින් වෙනත් අයෙකු හට හානියක් සිදු නොවිය යුතු ය.

ඉහතින් සඳහන් කර ඇති සීමාවන් දෙක ඇතුලත අන් අයව සතුටින් තැබීම සඳහා ඔබ විසින් කරනු ලබන ඕනෑම කාර්යක් ශ්‍රේෂ්ඨ කාර්යයක්ම වන්නේ ය. එමගින් ඔබ ශ්‍රේෂ්ඨත්වයටත් වචනයෙන් කියා නිම කිරීමට නොහැකි තරමේ සතුටකටත් පත් වේ.

සෙස්සන් සතුටින් තැබීමට ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය මානසික පසුබිම සකස් කර ගැනීම සඳහා ඔබ විසින් අවබෝධ කරගත යුතු කරුණු කීපයක් ඇත. ඉන් පළමුවන කරුණ නම් අප නිර්මාණය වී ඇත්තේ යම් නිශ්චිත මෙහෙයක් ඉටු කිරීමට බව තේරුම් ගැනීමයි. විශ්ව ශක්තිය මගින් මේ මිහිපිට නිර්මාණය කර ඇති සෑම දෙයක්ම එසේ නිර්මාණය කර ඇත්තේ යම් ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා ය. එනම් මිහිපිට ක්‍රියාත්මක වන සහජීවනය නමැති රීතියට අනුව යම් කොටසකගේ ප්‍රයෝජනය සඳහා මිහිපිට

ඇති සියළුම දේවල නිර්මාණය වී ඇත. එහෙත් අපට වැරදී ඇත්තේ සහජීවනය නමැති සිද්ධාන්තය අමතක කොට වැඩ කිරීමට යාම නිසාය. අප වැඩි දෙනෙකුට එදිනෙද කාර්යයන්හි දී කිසි විටෙකත් අප අවට සිටින්නන් සිහිපත් නොවේ. දැඩි තෘෂ්ණාවත් ස්වාර්ථයත් නිසා අන් අය සතු සියළුම දේපොල ධනය සහ ඇතැම් විට ජීවත්වීමට ඇති අයිතිය පවා උදුරා ගැනීමට මිනිසුන් ක්‍රියා කරන්නේ එම නිසාය. මේ මිහිපිට අප ජීවත් වන පරිසරය පුරාම සැකය, බිය, ඊර්ෂ්‍යාව, වෛරය සහ ක්‍රෝධය පැතිරීමත් එම නිසාම මිනිස් සිත් වලින් සතුට පලායාමත් සිදුවී ඇත්තේ එම නිසා ය.

විශ්ව බලය විසින් විශ්ව නිර්මාණය වී ඇත්තේ එයට අයත් සියළුම සාමාජිකයින් හට සතුටින් ජීවත් වීම සඳහා අවශ්‍ය සියළුම සම්පත් සමගය. එම සම්පත් සියල්ල සහජීවනය මගින් පාරිභෝජනය කරනු ඇතැයි යන්න විශ්ව නීතියේ සිද්ධාන්තයයි. අවාසනාවකට මෙන් මිනිසාගේ ඇති දැඩි ගිජුකමත්, කෑදර කමත් නිසා මිහිපිට ඇති සියළුම සම්පත් පමණක් නොව, විශ්වයේ දුරින් පිහිටි ග්‍රහලෝක පවා සිය ආධිපත්‍යයට යටත් කර ගැනීමේ දුෂ්ට ප්‍රයත්නයක එල්බ ගෙන සිටියි. මිහිතලය පුරා පැතිර පවතින බිය සහ සැකයට හේතු වී ඇත්තේ මෙම කෑදර කමය. මෙම තත්ත්වය පොදුවේ මිනිස් සමාජයටත්, වෙන් වෙන් වශයෙන් තනි පුද්ගලයින්ගේ එදිනෙද ක්‍රියාකාරකම් වලටත් බලපා ඇත. මෙම අසාධාරණ සිතුවිල්ල නිසා පොදුවේ මිහිතලය මත සිටින සතුන්, ගස්වැල් ආදී සමස්ථ පරිසර පද්ධතියත් විනාශකර දමමින් සිය ආත්මාර්ථකාමී, කෑදර අවශ්‍යතායන් පමණක් ඉටු කරගැනීමට මිනිසා දරණ නිශ්ඵල ප්‍රයත්නය අවසාන වනුයේ ස්වභාව ධර්මයේ උදහසට ලක්වී දැඩි දඬුවම් අත් විඳීමෙන් පසුවය.

තනි තනි පුද්ගලයන් වශයෙන් ද අප එදිනෙද ක්‍රියා කරන්නේ මුළු මිනිස් සංහතියටම හානි සිදුවන තරම් දැඩි ආත්මාර්ථයකිනි. බොහෝ මිනිසුන් එදිනෙද ජීවිතයේ දී තමන්ගේ කටයුතු ඉටු කර ගැනීමටත් වඩා මුල්තැන දෙන්නේ අන්‍යයන්ගේ කටයුතු වලට බාධා පැමිණවීමටය. අප අතර අසතුට පැතිර යාමට ප්‍රධානම හේතුව වී ඇත්තේ එම තත්ත්වයයි. වෙනත් කෙනෙකුගේ දියුණුව දැක එය ඉවසා ගැනීමට නොහැකිව දුක් වෙන අය කෙතරම් අප අතර සිටිත් ද? ඒ අය දුක්වන්නේ තමන්ගේ කටයුතු අසාර්ථක වීම නිසා නොව වෙනත් කෙනෙකුගේ කටයුතු සාර්ථක වීම නිසා ඇතිවන දැඩි ඊර්ෂ්‍යාව නිසාය.

පුද්ගලයෙකු සිය සහජ හැකියාවන් ප්‍රයෝජනයට ගැනීමෙන් දියුණුවීමට උත්සාහ කරන්නේ නම් එය කිසිසේත්ම අසාධාරණ හෝ ආත්මාර්ථකාමී ක්‍රියාවක් නොවන්නේ ය.

එහෙත් ජීවන තරගයේ දී තමන් හා තරග බිමට එළඹ සිටින අන් අය අභිබවා යාමට මිනිසුන් විසින් උපයෝගී කරගන්නා උපක්‍රම ඉතාමත් නින්ද සහගතය. ඇතැම් විට එසේ තමන් හා තරග කරන පුද්ගලයන් මෙල්ල කර ගැනීමට නොහැකි වන විට ඔවුන් විනාශ කර දැමීමට පවා ඇතැමුන් පෙළඹේ එහෙත් එවැනි දේ වලින් යම් අයෙකු ලබා ගන්නා ජයග්‍රහණ වලින් ඔවුන්ට කිසි සේත්ම සතුටක් නොලැබෙනු ඇත. මෙහි දී අප පැහැදිළි කරගත යුත්තේ ඔබ අපේක්ෂා කරන්නේ සතුට නම් කිසිවිටෙකත් අන් අයගේ සතුට විනාශ කර සතුටක් ලබා ගැනීමට උත්සාහ නොකරන්න. මක්නිසාදයත් ලෝක ධර්මතාව වන්නේ සතුට ලැබෙන්නේ අන් අයගේ සතුට විනාශ කරන්නාට නොව, අන් අය වෙනුවෙන් සතුට නිපදවන්නන් හටය. සතුට බෝවෙන සුළු දෙයකි. බෙද දීමෙන් එය ආපසු ලැබෙනවා. වෙනත් කෙනෙකුට උදව් දීමෙන් හා ආදරය බෙද දීමෙන් සතුට ඔබ කරා නිතැතින්ම එනු ඇත. එබැවින් අන් අයට උදව් කිරීමෙන්, ආදරය බෙද දීමෙන් සහ ඔබට හැකි පමණ අන් අයගෙ සතුට වෙනුවෙන් ක්‍රියා කිරීමෙන් ඔබට ඔබේ මනස්තාපය සහ දුක ජයගෙන අළුත් කෙනෙකු බවට පත් වීමට හැකි වනවා. එයින් ඔබ ශ්‍රේෂ්ඨත්වයට පත් වෙනවා. සංතුෂ්ඨියට පත් වෙනවා. ලෝක ඉතිහාසයේ ශ්‍රේෂ්ඨත්වයට පත්වූවන්ගෙන් වැඩි දෙනෙක් එම තත්ත්වයට පත්ව ඇත්තේ මිනිස් සමාජය සතුටින් තැබීමට ඔවුන් කර ඇති මෙහෙවර නිසාය. ලෝක ප්‍රකට දේශපාලනඥයින්, සංගීතඥයින්, කලාකරුවන් සහ විවිධ සොයාගැනීම් සහ නිර්මාණ කළ අයවළුන් එම තත්ත්වයට පත්ව ඇත්තේ අන් අය සතුටින් තැබීමට ඔවුන් කර ඇති මෙහෙය නිසාවෙනි.

එදිනෙද ජීවිතයේ දහසකුත් එකක් ප්‍රශ්න වලට පිළියම් සොයමින් දසත දුවන මිනිසාට තවත් කෙනෙනකු වෙනුවෙන් වැය කිරීමට කාලයක් තිබේ ද? මා දකින පරිදි අප වැඩි දෙනෙකුගේ සිත්වල අසතුටට හේතුවන ප්‍රධාන වස්තු බීජය ද මෙයයි. එනම් සිය ජීවිතවල ඇතුල් පැත්තට පමණක් සීමා වූ පුද්ගලයාට සතුට ලැබීමට හැකි අවස්ථාවට වඩා අසතුටට හේතුවන දේ දැකීමට හා අත් විඳීමට සිදුවේ. ඔබගේ එදිනෙද කටයුතු වලින් හෙම්බත්ව ඔබගේ පෞද්ගලික ප්‍රශ්න ගැන සිතමින් කල්පනාවීම තරම් අසතුටට හේතුවන සහ නිෂ්ඵල ක්‍රියාවක් තවත් ඇත්ද? විශ්වය නිර්මාණය වී ඇත්තේ එකතැන පල්වීමට නොවේ. එය ඉතා වේගයෙන් ගමන් කරමින් චලනය වෙමින් හෝ භ්‍රමණය වෙමින් තිබේ. විශ්වයට අයත් සෑම වස්තුවකටම පොදු වූ ස්වභාවය නම් එයයි. එබැවින් එකතැන පල්වෙන සියල්ල ස්වභාව ධර්මයට ප්‍රතිවිරුද්ධ ආකල්පයන් ය. එබැවින් විශ්වය සහ ස්වභාව ධර්මය හා එක්ව එහි රිතියට අනුව ඉතා වේගයෙන් ගමන් කිරීම ආරම්භ කරන්න. එක් මොහොතක් වත් එකතැන පල්වීම සඳහා ඉඩ නොතබන්න. එකතැන පල්වෙන්නා සිතට අසතුටේ විෂබීජ ඇතුල් වන්නේ හරියටම එකතැන පල්වෙන වතුර වලක විෂබීජ ඇතිවන පරිද්දෙනි. එබැවින් ඉතා වේගයෙන් ගලායන ජල පහරක් ලෙසින් වේගයෙන් ගලායාමට ජීවිතයට ඉඩ සලසන්න. ඒ සඳහා ඉතාමත්ම සුදුසු මාර්ගයක් වන්නේ ඔබ නිකරුනේ ගත කරන කාලය යම් අයකුගේ යහපත සහ සතුට වෙනුවෙන් වැය කිරීමයි.

අපට අන් අයගේ සතුට වෙනුවෙන් කළ හැකි දේ මොනවා ද? ඔබගේ ආත්ම පරිත්‍යාගයේ තරම අනුව ඔබට අන් අය වෙනුවෙන් ඔවුන්ගේ සතුට හෝ යහපත වෙනුවෙන් බොහෝදේ කළහැක. එහෙත් මා මෙහි සඳහන් කරනුයේ පොදුවේ ඕනෑම කෙනෙකුට වැඩි වියදමකින් තොරව කළ හැකි දේ පමණි. මා එසේ කියන්නේ බොහෝ දෙනෙකු උදව් යන්නෙන් සිතන්නේ මුදල් හදල් හෝ උපකරණ ආදිය ලබාදීම යන්නයි. එය කිසිසේත්ම එසේ නොවේ. යම් පුද්ගලයකු හට මුදල් වියදම් කර අන් අයගේ සැපතට හේතු වන දේ කිරීමට හැකිනම් එය ඉතා අගනා ක්‍රියාවකි. එහෙත් සියළු දෙනාටම එම හැකියාව නැත. අන් අයට පිහිටවීමට හෝ උදව් කිරීමට මුදල් අත්‍යාවශ්‍ය අංගයක් නොවේ. එය අනිවාර්ය අවශ්‍යතාවයක් නොවේ. ඒ සඳහා අවශ්‍ය වනුයේ යම් අයකුට සිය

එදිනෙද කටයුතු වල දී එය කරගෙන යාමට පහසුවන ආකාරයට, ඔබට කළ හැකි යමක් කිරීමය. මේ සඳහා ඔබට කළ හැකි දේ පහතින් සඳහන් කරමි. ඔබ කාර්යාලයක වැඩ කරන අයෙකු නම් දිනපතා ඔබ වෙත ඔවුන්ගේ කටයුතු ඉටු කරවා ගැනීමට පැමිණෙන අයවලුන්ට නොපමාව එම කටයුතු ඉටු කරදීම සහ ඔවුන්ට ආචාරශීලී වීම, මෙ සඳහා ඔබට අමතර මුදලක් වැය නොවන අතර, යහපත් සිතුවිලි නිසා ඇතිවන අධික ප්‍රීතියක් පමනක් ඇතිවේ. එපමණකුදු නොව ඔබට ඔබේ යහපත් සේවය නිසා සමාජයේ විවිධ තරාතිරමේ පුද්ගලයින් හඳුනා ගැනීමටත් එමගින් ඔබට අවශ්‍ය විටෙක ඔවුන්ගේ උදව් උපකාර ලබාගැනීමටත් හැකිවනු ඇත. එය මිළ මුදල් වලින් ඇස්තමේන්තු කළ නොහැක. මේ අන්දමට දිනපතා ඔබ යෙදී සිටින රැකියාවේ දී ඔබට සෙස්සන් සතුටින් තැබීමට බොහෝ දේ කළ හැකිය. ඔබ රැකියාවසඳහා බසයෙන් හෝ දුම්රියෙන් ගමන් කරන්නකු විය හැක. එම අවස්ථාවල දී ද හැකි පමණ අන් අය සමග සහයෝගයෙන් කටයුතු කරන්න. බස් රථයට හෝ දුම්රියට ඇතුළුවෙද්දී ඒ සඳහා පොරකෑමෙන් කී දෙනෙකු තුවාල වී ඇත්ද? එමෙන්ම එවැනි අවස්ථාවල දී ඇද වැටීමෙන් සිදුවන හදිසි අනතුරු වලින් කී දෙනෙකු මිය ගොස් ඇත්ද? මෙවැනි අවස්ථා වල අපට සහයෝගයෙන් කටයුතු කිරීමට නොහැකි ඇයි? ඔබට ඔබ ගමන් කරන රථයේ වාඩිවීමට අවස්ථාවක් ලැබී ඇතැයි සිතන්න. එවිට ඉතා අපහසුවෙන් හිටගත යන්නකුගේ අතඇති පාර්සලයක් ගෙන ගොස් දීමෙන් නොඑසේ නම් ගැබිනියකු හෝ උදව් ඕනෑ අයකුට සිය අසුන දීමෙන් පිහිට වන්න. එයත් පරිත්‍යාගයකි. ආත්ම පරිත්‍යාගය සඳහා ඔබ පුහුණු විය යුත්තේ එසේ ය. ආත්ම පරිත්‍යාගයේ දී කිසි විටෙක පෙරලා කෘතවේදීත්වය අපේක්‍ෂා නොකරන්න. මක්නිසාද කෘතඥතාවය වනාහි උතුම් මිනිසුන් අතර පමණක් ඇති ගුණයකි. එය සාමාන්‍ය මිනිසුන් ගෙන් බලාපොරොත්තු නොවන්න. උදව් කිරීමේ දී පෙරලා කෘතඥතාව බලාපොරොත්තු වුවහොත් ඔබට සිදුවන්නේ නැවතත් අසතුටට පත්වීමටය. එබැවින් ඔබ කරන යහපත් කාර්යයන් සඳහා කිසිවිටෙක කිසිවක් බලාොරොත්තු නොවන්න. කිසිවක් බලාපොරොත්තු නොවෙමින් සිදුකරණ පරාර්ථ සේවයෙන් වැඩි තෘප්තියක් හා ශ්‍රේෂ්ඨත්වයක් ලැබෙයි. මිනිසුන්ගේ ගුණමකු කම ගැන ඉතා හොඳ නිදසුනක් බයිබලයෙහි ඇත. එනම් ජේසු තුමන් විසින් ලාදුරු රෝගීන් දස දෙනෙකු හට සත්කාර කළහ. එහෙත් ඔවුන් අතුරෙන් සිය කෘතඥතාවය පිළිගැන්වීම සඳහා නතර වූයේ එක් අයෙකි. සෙසු සියල්ල කිසිවෙකුට නොදන්වා පැන ගොස් තිබිණි. මනුෂ්‍ය ස්වභාවය එයයි. එනම් අකෘතඥ වීමයි. එබැවින් ඔබ යම් අයෙකුට යහපතක් කරන විට ඒ සඳහා පෙරලා කිසිවක් බලාපොරොත්තු වුවහොත් ඔබේ අරමුණ ඉටු නොවේ. මක්නිසාද මිනිසා කෘතඥවීමට තරම් වත් කාලය ගතකිරීමට නොහැකි සමාජ ප්‍රවාහයකට එක්වී ඇති බැවිනි. තව ද මිනිසා ස්වභාවයෙන්ම ආත්මාර්ථකාමී කෘතගුණ අමතක කර දමන්නකු බැවිනි. එබැවින් ඔබ අන් අයට උදව් කළ යුත්තේ හුදෙක් ඔබගේ ආත්ම තෘප්තියත්, පරම සතුටත් සඳහා වේ. අන් අයට සේවය කිරීමේ දී වෙනත් කිසිවක් නොපතන්න.

අපට වෙනත් පුද්ගලයෙකුගේ සතුට වෙනුවෙන් යම් කාලයක් වැය කිරීමට නොහැකි වී ඇත්තේ මන්ද? අපට එසේ වී ඇත්තේ දැඩි ආත්මාර්ථය නිසාය. දිනපතා ජීවන තරඟයේ යෙදී සිටින අපහට එක් තත්ත්පරයක්වත් වෙනත් කෙනෙකු වෙනුවෙන් ගත කිරීම සඳහා යොද ගැනීමට නොහැකි වී ඇත. ඔබට ඉටු කිරීමට පෞද්ගලික කටයුතු ඇත්නම් අන් අයට උදව් වීමට යා යුතු යැයි මම නොකියමි. එහෙත් ඔබට අන් අය වෙනුවෙන් ඉතා සුළු වේලාවක් හෝ ගත කිරීමට අපහසු නම් ඔබට සතුට ලබා ගැනීම නම් අපහසු වනු ඇත. මක්නිසාද යත් සතුටෙහි ප්‍රධානතම සාධකයක් වන්නේ අන් අය සතුටින් තැබීම නිසා ඇතිවන උදර සිතුවිලිය. තව ද අන් අයෙකු වෙනුවෙන් ඉතා සුළු වේලාවක් හෝ ගත කිරීමට නොහැකිව ඔබ දිව යන්නේ කුමක් සඳහා ද? ධනය, බලය හෝ කීර්තිය වැනි යමක් පසුපසය. ඔබ දිවයන්නේ. එහෙත් සතුටින් සිටීම සඳහා ධනය, බලය හෝ කීර්තිය පමණක්ම ප්‍රමාණවත් නොවන බවමින් ඉහත පරිච්ඡේදයකදී පැහැදිලි කර ඇත්තෙමි, ධනයෙන්, බලයෙන් සහ කීර්තියෙන් ආඪ්‍ය මිනිසුන් ඒවායින් සතුටක් නොලබන බව පෙනී යයි. එසේ නම් ඔබේ පරමාර්ථය සතුට නම් තමා ගැනම සිතමින් සිර වූ කුටියක වාසය නොකරමින් ඉන් බැහැරව පිය නැගිය යුතු ය. මිනිසුන් වඩාත්ම අසතුටට පත්වීමට හේතුවක් වනුයේ අනවශ්‍ය තරම තමා ගැන සිතීමය. එනම් නිතරම තමන් ගැනම සිතමින්, තමන්ට සිදුවිය හැකි නරක දේවල් ගැන සිතමින් කල් ගෙවීමය. මෙයින් මිදීමට කළහැකි හොඳම දෙය නම් ඔබ නිකරුනේ නැවීම සඳහා ගතකරන කාල අන් අය වෙනුවෙන් වැය කිරීමයි. එසේ කිරීමෙන් අවශ්‍ය නම් ඔබට ධනයත්, බලයත්, කීර්තියත් යන තුනම ලබාගත හැක. ඒවායින් ඔබට අවශ්‍ය නම් සතුට ද ලබාගත හැක. එහෙත් ඔබ එවැනි දේ ගැන කිසිදු තැකීමක් නොමැතිව ඔබගේ කාලය, ශ්‍රමය සහ හැකිනම් ධනයෙන් අන් අයව සතුටින් තැබීමට ක්‍රියා කරන්නේ නම් එය ශ්‍රේෂ්ඨතම ක්‍රියාවකි. බුදුන් වහන්සේ, ජේසු තුමන්, මහමත් තුමන් වැනි ආගමික නායකයන් ද ඒබ්‍රහම් ලින්කන්, මහත්මා ගාන්ධි වැනි ලෝක නායකයන් සදා ශ්‍රේෂ්ඨත්වයට පත් වී ඇත්තේ ඒ නිසාවෙනි. එනම් ඔවුන් සිය පෞද්ගලික ජීවිතයේ හැම දෙයක්ම අනුන්ගේ සතුට සහ යහපත වෙනුවෙන් කැප කිරීමෙනි. සිය මුලූ ජීවිත කාලයම තමන්ගේ කටයුතු ගැන පමණක් උනන්දු වූ කිසිවෙකු හට මෙවැනි ශ්‍රේෂ්ඨත්වයකට කිසි කලෙක පත්විය හැකි ද? මා දන්නා තරමින් එසේ ශ්‍රේෂ්ඨත්වයට පත්වූ අයෙකු නැත. ලෝකයේ ඉතිහාසය ලිවුවත් එවැනි අයවලුන් සඳහා පිටු නාස්ති කිරීමට ක්‍රියා කර නැත. අපගේ පරමාර්ථය සතුට සොයායාම බැවින් ශ්‍රේෂ්ඨත්වය ගැන කතා කිරීමට නොවෙහෙසෙමි. එහෙත් ශ්‍රේෂ්ඨ සිතුවිලි ඇති අයවලුන් කරා නිතැතින්ම සතුට ගලා ඒම සිදුවේ. අන් අයගේ සතුටට බාධා කරන්නන් හට අසතුටත්, අන් අයගේ සතුට වෙනුවෙන් ක්‍රියා කරන්නන් හට සතුටත් ඇතිවීම විශ්ව නීතියයි. එබැවින් ඔබට සතුට අවශය නම් සෙස්සන්ගේ සතුට සඳහා කැපවන්න.

(ඉතිරි කොටස ලබන කලාපයේ)

එස්සී කරුණාරත්න, ආර්එස්පී, ශ්‍රීලපාහ
මේජර්
කා.නි, අණදෙන නිලධාරී
4 ශ්‍රීලපාහ

# මනෝ විද්‍යාත්මක යුද ශිල්පය (Psycological war fare) හා වර්තමාන යුද පසුබිම

ඉතාමත් සංවේදී විද්‍යුත් තාක්‍ෂණයත් හා ගැටෙමින් වෙනස් වෙමින් හා දියුණු වෙමින් දිනෙන් දින ඉදිරියට ඇදෙන ලෝකයේයුද තාක්‍ෂණය මේ තාක් පැමිණි ගමනේ දී සොයා ගත් ප්‍රබලම අවිය කුමක් ද? මෙය අද සෑම යුද බලවතකුම තුළපිළිතුරක් නොලබා ඇති ප්‍රශ්නයකි. තම රටේ යුද ශක්තිය හෝ හැකියාව අනෙක් රටේ ශක්තියට වඩා වැඩිකර ගැනීමේ අතෘප්තිකර චේතනාව හුදෙක්මහ හීනමානයක් බව ඔවුන් කිසිසේත් නොපිළිගනී. ලොවවටා අද පවතින නොයෙකුත් යුද තත්ත්වයන් දෙස බලන්න, කිසිදු රටක් ඔවුන් සතුව ඇති බලවත්ම හෝ දරුණුම යුද ශක්තිය (දෙවන ලෝක සංග්‍රාමයේ දී ඇමරිකාව ජපානයේ හිරෝෂිමා නාගසාකී වලට හෙළූ පරමාණු බෝම්බවලට පසු) මෙතෙක් පාවිච්කර නැත. එවන් දරුණු අවි අයුධ එකිනොට විරුද්ධව පාවිච්චි කරනු ඇතැයි සිතා මනඃකල්පිත වාතාවරණය මවාගෙන හුදෙක් ආර්ථික අතින් පිරිහුනු රටවල් ද අද ලෝකයේ එමටය. කරුණු කොයි අයුරින් වුවත්, අද ලෝයේ ඉතා දියුණු යුද තාක්‍ෂණයෙන් පිරිපුන් වී ඇති බව අප සැමට නොරහසකි.

සම්මත යුධ ධර්මතාවය (Conventional war) ලෝකයේ පසු පෙළට ඇද වැටීමත්. අසම්මත යුධ ධර්මතාවය (Unconventional war) ඉදිරියට පිවිසීමත් මගින් අපට පෙන්වා දෙනුයේ ජාතීන් අතර අභ්‍යන්තරික ගැටළු වල උග්‍රතාවයයි. බල අරගල, ජතිවාදී අරගල, ආගමික අරගල, දේශසීම අරගල, නිදහස් අරගල, කම්කරු අරගල හ කොමියුනිස්ට් මතධාරී අරගල මින් ප්‍රමුඛතාවයක් ගනී. අද ලෝකය දෙස ඇස් හැර බලන ඕනෑම කෙනෙකුට පෙනෙන පැහැදිලි ප්‍රතිරූපය නම් රටවල් තුළ පවතින දේශපාලනකි නොසන්සුන් තාවයයි. මෙම දේශපාලනික නොසන්සුන්තායන්ගේ ප්‍රතිඵලය වනුයේ අසම්මත යුද්ධයයි. එකම ජාතියකට අයත් එකම රටක පුරවැසියන් පවා එකිනෙකා මරාගැනීමේ ප්‍රවණතාවයට අද ලෝකය යොමුවී ඇත. එසේ නම්, අති බිහිසුණු යුද ආයුධ වලින් ඵලක් තිබේ ද? කුමක් ද විසඳුම?

බලවත් රටවල් එකිනෙකා අභිබවා යෑමේ යුධ අවි තරගයේ මුහුණුවර වෙනස්කරමින් ප්‍රථම වරට අමරිකා එක්සත් ජනපදය යුද තාක්‍ෂණයේ නව ප්‍රවණතාවයක් 70 දශකයේ සොයා ගැනිනි. ඇමරිකා එක්සත් ජනපදය සම්මත යුද ක්‍රමයෙන් මිදී වියට්නාමයේ කොමියුනිස්ට් ගරිල්ලන් හා දීර්ඝ එසේම දරුණුම අසම්මත යුද්ධයකට මුහුණ දෙමින් මෙම නව ප්‍රවණතාවයට ප්‍රවිෂ්ඨ විය. වියට් කොන්ග් ගරිල්ලන්ගේ දමනය කළ නොහැකි වූ චිත්ත ධෛර්ය හා ඇමරිකාවේ ප්‍රබල යුද තාක්‍ෂණය කෙසේ එකිනෙකා පරයා යයි ද යනු එවකට මුළු ලොව දෑස් දල්වා බලා සිටියහ. පුරා දශකයක් වැනි කාලයක් ලොව ප්‍රබලතම යුද බලවතා යැයි හඳුන්වනු ලැබූ ඇමරිකානුවන්හට මෙම වියට්නාම් යුද්ධයෙන් ප්‍රබල පරාජයක් අත් වින. මෙය ලොවටම නොරහසකි. එසේ වුව ද, ඇමරිකානුන්ට මෙම පරාජය තවත් පාඩමක් පමණක් විය. එය ඔවුන් ලද හොඳම අත්දැකීම යැයි සැලකූ ඇමරිකානු යුද විශේෂඥයෝ වියට්නාම් යුද්ධය වැනි අසම්මත යුද්ධයක් ජයගත හැකි මාර්ග සෙවීමට පෙළඹිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1974 පමණ වන විට මනෝ විඥානාත්මක යුද ශිල්පය (Psycological war-fare) අත්හද බැලිනි.

'බිහිසුණු අවි ආයුධ වලින්මපමණක් සතුරා දමනය කළ හැකිද?' යන්න ප්‍රශ්ණයට පිළිතුරු වශයෙන් මෙම නාවික යුධ ශිල්පය ලොවට මුල්වරට හඳුන්වා දුන්නේ ඇමරිකාව පමණක් නොව, නැපෝලියන් බොනපාට්ගේ පටන් හිට්ලර් ක්වා ලොව පහල වුණු නොයකුත් යුද නායකයින් මෙම මනෝ විඥානාත්මක යුද ශිල්පය යම්තාක් දුරට හෝ පාවිච්චි කර ඇති බවට පැහැදිලි සාක්ෂි එමටයි. හිට්ලර් විසින් නට්සි හමුදවේ ක්‍රියා කලාපයට නැගෙනහිර යුරෝපයේ සහය ලබාගැනීමට ඔහු විසින් නනා ප්‍රකාර පණිවුඩ ජනමාධ්‍ය තුළින් විසුරුවා හැරිණි. එසේම ඔහුට විරුද්ධව බ්‍රිතාන්‍ය ප්‍රමුඛ පොදු සන්ධානයේ රටවල් ඔහුගේ කෲර ක්‍රියාකාරකම් ජනමාධ්‍ය තුලින් ලොවට හෙළි කළහ. මේ දෙපක්‍ෂයම උත්සාහ දැරුවේ ඔවුන්ගේ පණිවුඩ මගින් මධ්‍යස්ථිකයන්ගේ මානසිකත්වය වෙනස් කර එමගින් ඔවුන්ගේ ප්‍රයත්නයට වාසියක් ලබා ගැනීමට නොවේ ද?

එසේ වුව ද ඇමරිකානු හමුද වියට්නාමයේ දී මුහුණදුන් වාතාවරණය එයට මදක් වෙනස් විය. වියට්නාමයේ දී අන්තපරාජීය තත්ත්වයකට මුහුණදුන් ඒ සුපිරි බලවතා විසින් මිනිස් සිත දමනය කිරීම නව යුද ශිල්පයක් ලෙස අත්හද බලන ලදී. උතුරු වියට්නාමයේ වියට්කොන්ග් ගරිල්ලන්ගේ හා ඔවුන්ගේ පක්‍ෂපාතීන්ගේ සිත් මර්ධනය කිරීමෙන් එම යුද්ධයෙන් ජය ගැනීමට ඔවුන් කරුණු අත්හදා බැලීය. ඩොලර් මිලියන ගණන් වටිනා මිනිස් නාශක බෝම්බ සිය ගණන් හෙළූ අහස්යානා මගින්ම ඒ වෙනුවට මිලියන ගණන් මනෝ විද්‍යාත්මක ක්‍රියා පත්‍රිකා ගුවනේ සිට හෙළූහ. නා නා ප්‍රකාර ගුවන් විදුලි විකාශන මගින් මව් ක්‍රියා පණිවුඩ උතුරු වයට්නාම ජනතාව අතරට යැවූහ. දකුනු වියට්නාම ජනතාව අතරට බටහිර සම්ප්‍රදයයන් එක් කිරීමෙන් වියට්නාම් ජනතාව අතර උතුරු - දකුනු භේදයක් ඇති කරවීමට සමත් විය. එසේම උතුරු වියට්නාමය එවකට කොමියුනස්ට් චීනයෙන් ලද සහායෙන් කළ යුද්ධයේදී ඔවුන් අඳුරු ආගාද තුළ ජීවත්වන ජන කොටසක් ලෙසට ඒත්තු ගැන්වීය. එමගින් 70 දශකයේ මැද භාගය වනවිට යුද පරාජය නමැති කැලලින් බේරී මහත්වරුන් සේ වියට්නාමයෙන් ඉවත්වීමට ඔවුනට හැකිවිය. ඔවුන් එද ආරම්භකල ම වි ක්‍රියා වල ප්‍රතිඵල අද වියට්නාමයෙන් පැහැදිලිව දැක ගත හැකිය. අතුරු වියට්නාම් ජනතාව දකුණට සංක්‍රමණය වීම හා ක්‍රම ක්‍රමයෙන් වියට්නාමය නපතිවාදය නමැති නව සංකල්පය ඔවුන්ගේ පාලන ප්‍රතිපත්තිවලට ඇතුළත්කර ගැනීම මෙයට තිදසුන් ය. මෙය ඇමරිකනු සාර්ථක ම වි ක්‍රියාවන්ගෙන් එක් නිදසුනක් පමණි. තව ද, සෝවියට් අධිරාජ්‍යයේ

කඩා වැටීමට මූලාරම්භය ද ඇමරිකානු සාර්ථක ම වි ක්‍රියා දාමයන් බවට අද සාක්ෂි ඇත. කොමියුනිස්ට්වාදයට වඩා ධනපතිවාදය සාර්ථක බව ඒත්තු ගැන්වීමට දශක කීපයක් පුරා ඇමරිකානුන් විසින් නානා ප්‍රකාර ම වි ක්‍රියා සෝවියට් රුසියාව වෙත එල්ල කරනු ලැබීය. ඉතා දරුණු යුද අවි භාවිතාකර දැඩි විනාශයකින් කෙටි කාලයක දී ලබාගන්නා ලද ජයග්‍රහණයකට වඩා විනාශයකින් තොරව, දෙපක්ෂයේ ම දේපල හා ජීවිත සුරක්ෂිත වෙමින් සූක්ෂම ලෙස සැලසුම්කර සතුරාගේ සිත් දමනය කිරීමෙන් ලබා ගන්නා දීර්ඝ කාලීන විසඳුම හුදෙක් ප්‍රතිඵලදායී බව මෙමගින් ඔවුන් ලොවට පෙන්වා දුනි.

### මනෝ විද්‍යාත්මක යුධ ශිල්පය යනු කුමක් ද?


අද ලොව පවතින යුද අර්බුද හා අරගල සැමකක්ම මූලාරම්භය එක් එක් ජාතීන් අතර ඇති වූ අවිශ්වාසය, සැකය, හා හුදු බියයි. ඕනෑම හමුදවක හෝ යුධ සංවිධානයක සෙබළෙකු ප්‍රථමයෙන් මුහුණ දී ඇත්තේ සිවිල් පුරවැසිභාවයටයි. ඉහත කී කරුණු හේතුවෙන්, යම් ප්‍රකෝපකාරී අදහස් ඔවුන්ගේ සිත් තුලට ඇතුල් කිරීමෙන් (Influening the human mind) ඔවුන් තවකෙකුට විරුද්ධව යුද අවියක් අතට ගනී. පවත්නා රජයේ පිළිවෙත් වලට එරෙහිව එක කොටසකුත් ඊට පක්ෂව තව කොටසකුත් ඒ දෙපක්ෂයටම සහායට තවත් පිරිසක් මේ අර්බුදය වටා එක් රොක්වනු ඇත. අද ලොව පවතින ධර්මතාවය ය නොවේ ද?

මේ සියළුම අර්බුද වලට මූල මිනිස් සිතයි. එකෙක් තව කෙනෙකුගේ සිත උද්දීපනය කර තම අරමුණු ඉටුකර ගැනීම මෙහි මූල ධර්මයයි. සියුම් ලෙස සොයා ගන්නා ලද තම සතුරු පක්ෂයේ හෝ ආධාර අපේක්ෂිත ජන කොට්ඨාශයේ ප්‍රායෝගික අවශ්‍යතාවයන් ආයුධයක් ලෙස භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන අදහසක් හෝ පණිවුඩයක් නිවැරදි මාධ්‍ය තුලින් එම ජන කොට්ඨාශය තුළට යැවීමෙන් ඔවුන්ගේ සිත් උද්දීපනය කර තම අවශ්‍යතාවය සූක්ෂම ලෙස ඉටුකර ගැනීම යනු ම වි ක්‍රියා යන්නෙහි නිවැරදි පැහැදිලි කිරීම වේ. එසේම, ම වි ක්‍රියාවන්ගේ ප්‍රතිඵල ක්ෂණිකව දැකිය නොහැක. මෑත කාලයේ ලොව සිදුවූ විශාලතම යුද්ධය 'ගල්ෆ් යුද්ධය' දැක්විය හැක. මෙම යුද්ධය භෞතික වශයෙන් ඇරඹීමට මාස 06 කට ප්‍රථම සිට ඇමරිකාවවිසින් ඉරානයට විරුද්ධව ම වි ක්‍රියා ආරම්භකර තිබුණි. මෙහි ප්‍රතිඵල යුද්ධ ඇරඹීමත් සමගම දැකිය හැකි විය. දහස් ගණන් ඉරාක භටයෝ පොදු සංවිධානයේ හමුදවන්ට භාර වුනි. යුද්ධයට මාස 4 කට ප්‍රථම ඇමරිකාව විසින් අධිබල ගුවන් විදුලි සේවයක් සෞදි අරාබියේ ඉදි කෙරිණි. එසේම කුඩා ට්‍රාන්සිස්ටර් රේඩියෝ ලක්ෂ ගණනක් ගුවනින් ඉරාක ප්‍රදේශ වත හෙළූහ. ඉන්පසු ඔවුන්ගේ ම වි ක්‍රියා පණිවුඩය ගුවන් විදුලිය ඔස්සේ ප්‍රචාරය කෙරිණි. බටහිර පොප් සංගීතය මගින් යුද පෙරමුණේ දුෂ්කර යුද්ධයකට සැරසෙමින් සිටි ඉරාක සෙබලුන්ගේ සිත් අවුල් කරන ලදී. බටහිර ලෝකයේ යම් යම් නිදහස් ව්‍යායාමයන් එම මාධ්‍යය ඔස්සේ ප්‍රචාරය කිරීමෙන්, තමන් දරුණු යුද ආධිපත්‍යයකට වහල්ව සේවය කරන කොට්ඨාශයක් බවට ඒත්තු ගැන්විය. ප්‍රතිඵලය කුමක් වීද? ඇමරිකාව ප්‍රමුඛ සංවිධානයේ යුද සේනාවන් පහසු ජයක් අත්කර ගත්හ.

ඕනෑම මට්ටමක ම වි ක්‍රියාවක සාර්ථකත්වය රඳ පවත්වනුයේ මෙම ඉහත ප්‍රකාශය නොහොත් ම වි ක්‍රියා යනු කුමක් ද කියා නිසි ලෙස අවබෝධකර ගතහොත් පමණි. එසේම විවිධ මට්ටම්වල ම වි ක්‍රියාවන් එකිනෙකා හා ගැටීමක් ඇති වුවහොත් ඉන් නිසි ප්‍රතිඵල ලබාගත නොහැක. උදහරණ ලෙස යම් රටක් තම සතුරු පක්ෂය පරාජය කිරීමේ අදිටනින් ම වි ක්‍රියා උපයෝගී කර ගන්නේ නම් එහි පහත ප්‍රභේදයන්ගේ පැහැදිලිතාවයක් තිබිය යුතු ය.

1. දේශපාලනික ම වි ක්‍රියා (Political psy Ops)
2. හමුදමය ම වි ක්‍රියා (Militry psy Ops)
3. ස්වාධීන ම වි ක්‍රියා (Natural psy Ops)

ඉහත ප්‍රභේද තුනේම ගැබ්වී ඇත්තේ එකම ජාතික අවශයතාවයක් (National requirement) නම් එය ජාතික සැලැස්මක් මත (Nation I plan) සාර්ථක ලෙස ක්‍රියාවට නැගිය හැක. (රූපය - 1 බලන්න)




රූපය 1

ඉතිරි කොටස ලබන කලාපයේ

ජේ. ආර්. කුලතුංග ශ්‍රීලපාහ
සමිජර්
සා.නි. අණදෙන නිළධාරි
8 ශ්‍රීලපාහ

# උතුරේ හා නැගෙනහිර ඉපැරණි බෞද්ධ නටබුන් ආශ්‍රිත සංග්‍රාමික වටිනාකම් හඳුනා ගනිමු

අපේ රටේ ඉතා පැරණි අවදියේ පටන් පැවත දැනට නටබුන්ව තිබෙන උතුරු නැගෙනහිර බෞද්ධ සිද්ධාස්ථාන පිළිබඳව 1982.07.01 දින එවකට පුරාවිද්‍යා කොමසාරිස් වූ එම්. එච්. සිරිසෝම මහතා විසින් සහතික කරනු ලැබ ප්‍රකාශයට පත්කරනු ලැබූ සිතියම මෙහි දැකවේ.

මේවායින් බොහෝමයක් අතීත හෙළ රජ දරුවන්ට සංග්‍රාමීයව උපකාරී වූ ස්ථාන වල පිහිටි බව කරුණු විමසා බැලීමේ දී මනාව වැටහේ. නිදසුනක් ලෙස අතීතයේ දී කොට්ඨසාර දිසාව ලෙස ප්‍රකටව පැවැති කොට්ටියාර හෙවත් වත්මන් මූතූර් - සේරුවිල ප්‍රදේශය අතීතයේ රජවරුන් විසින් සංග්‍රාමීයව මනාව ප්‍රයෝජනයට ගෙන ඇත. මේ පිළිබඳව කදිම නිදසුනක් සී. සිරිල් මැතිව් ඇමතිතුමාගේ 'සිහිළුනි බුදු සසුන බේරා ගනිව්' නම් ග්‍රන්ථයේ 171 වෙනි පිටුවේ පහත සඳහන් ඡේදයෙන් දැක්වේ.


'..... රජරට පාලකයා වූ වික්‍රමබාහු 1113 දී පමණ ආක්‍රමනික වීරදේව අතින් මන්නාරම අසල දී පැරදී පොලොන්නරුවට පලා ගොස් තමාගේ වටිනා වස්තූන් රැස්කරගෙන වහාම කොට්ඨසාර කරා පැන ගත්තේ ය... එහි දී ආක්‍රමණික හමුදවන් රවටා මහ වගුරු කැලෑවකට යවා ඔවුන් සමූලඝාතනය කිරීමට ඔහු සමත් විය. 1 වන පරාක්‍රමබාහු හා දෙවන ගජබාහු අතර යුද්ධවල දී කොට්ඨසාර දිසාව කැපී පෙනුනි. පොළොන්නරුව පරාක්‍රම බාහුගේ හමුදව අතට පත් වූ පසුව ගජබාහු වහාම පලා ගොස් කොට්ඨසාර කරා පැන ගත්තේ ය. ගජබාහු කන්තලේ දී මියගිය විට ඔහුගේ දේහය ඇමතිවරුන් විසින් කොට්ඨසාර කරා ගෙන යන ලදුව රෝහණයේ මානාභරණට හමුදව සමග පැමිණ රජරට භාර ගන්නා ලෙස ආරාධනා කරන ලදී. ආචාර්ය පරණවිතාන මහතා, කොට්ඨසාර යන ස්ථානය වර්තමාන කොට්ටියාර් හැටියටත් කොට්ඨසාර දිසාව වර්තමාන කොට්ටියාරම් පත්තු හැටියටත් හඳුනා ගනී

එද රජරට පාලකයා වූ වික්‍රමබාහු 1113 දී පමණ ආක්‍රමණික වීරදේව ගේ හමුදවන් රවටා වගුරු කැලෑවකට යවා සමූලඝාතනය කිරීමත් මෙද 1990 දෙවන ඊලාම් යුද්ධය ආරම්භයේ දී කොටි ත්‍රස්තවාදීන් විසින් කට්ටපරිච්චාන් හි වගුරු බිමක දී කොටුකරගෙන අප හමුදවේ කොමාන්ඩෝ සෙබළුන් 32 ක් පමණ ඝාතනය කර දැමීම ද අප විසින් සන්සන්දනාත්මකව සලකා බැලිය යුතු ය. එසේම කොට්ඨසාර දිසාවේ දකුණු දිග පෙදෙස වන අංගොඩ විල්ලු/කුම්භනාච්චි පෙදෙස අද මේ දක්වා ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට යටත්ව ඔවුන්ගේ රැකවරණයට යොදගෙන ඇති ආකාරය ඒ හා ප්‍රදේශයේ ඓතිහාසික සංග්‍රාමික පසුබිම සසඳා බැලීම වැදගත් වනු ඇත. එද දුටුගැමුණු මහරජුගේ සේනාව විසින් යටත් කරනු ලැබූ එළාරගේ ප්‍රධාන කඳවුරු දෙකක් වන කොටුසර (කොට්ඨසාර) හා කුම්භගාම (කුම්භනාච්චි) මේ ප්‍රදේශය ආශ්‍රිතව පැවැති බව ද සඳහන් වේ. එසේම වළගම්බා රජු වරක් යුද්ධයෙන් පැරදී පලා යාමේ දී ජාතියේ අනාගතය වෙනුවෙන් ඔහුගේ ජීවිතය බේරා ගැනීම සඳහා සෝමා දේවිය ස්වේච්ඡාවෙන්ම සතුරන් අතට බිලි වූයේ ද මෙම අංගොඩවිල්ලූ කුම්භනාච්චි ප්‍රදේශයේ දීය. වලගම්බාවන් නැවත ජය ගැනීමෙන් පසුව සෝමා දේවියට උපහාරයක් වශයෙන් ගොඩනැංවූ හා පසු කලෙක දී බුදු හිමියන්ගේ දක්‍ෂණද දළදාවන් තැන්පත් කලා වූ සෝමාවතී මහා සෑය මේ අංගොඩවිල්ලු/කුම්භනාච්චිය අසල නටබුන්ව ගොස් ඇත. මෙම ස්ථානය මේ සමග ඇති සිතියමේ අංක 211 වශයෙන් සටහන්ව ඇත. දැනට පොලොන්නරුවේ තිබෙන සෝමාවතිය 'එගොඩ සෝමාවතිය' වශයෙන් ද අංගොඩවිල්ලු / කුම්භනාච්චියේ නටබුන් 'මෙගොඩ සෝමාවතිය' ලෙස ද අදටත් සලකන සෝමපුර, සේරුනුවර හා සේරුවිල ප්‍රදේශවල වැසියන් සැබෑ සෝමාවතිය ලෙස අදටත් සලකනුයේ නටබුන් අංක 211 වශයෙන් සිතියමේ පිහිටි 'මෙගොඩ සෝමාවතියයි'.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දකුණු දිග ඉතා වැදගත් පැරණි බෞද්ධ සිද්ධස්ථාන මෙසේ ත්‍රස්තවාදී බලකොටු බවට පත් වෙද්දී දිස්ත්‍රික්කයේ උතුරු දිග ප්‍රධාන බෞද්ධ සිද්ධස්ථාන නටබුන් ප්‍රදේශ ද ත්‍රස්තවාදී බලකොටු බවට පත්ව ඇත. දකුනු දිග අංගොඩවිල්ලු/කුම්භනාච්චි මෙන්ම උතුරු දිග තිරියාය ආශ්‍රිත වන පෙදෙස ද ඉතා වටිනා සංග්‍රාමීය පෙදෙසක් බව අපට වඩා ත්‍රස්ථවාදීන් විසින් අවබෝධ කරගෙන තිබීම ඊට හේතුවයි. බුදුහිමියන්ගේ පළමු උපාසකයින් වන තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන් විසින් බුදු හිමියන්ගේ කේශ ධාතු රැගෙන කුච්චිවෙලියෙන් ගෙඩබැස තිරියායට ගොස් එහිදී මහත් භක්තියෙන් ඒ කේෂ ධාතු තැන්පත් කරන ලදුව ගිරිහඩු මහ සෑය ඉදි විය. මේ ප්‍රදේශය මේ අනුව සිංහල බෞද්ධයාගේ ප්‍රධානතම පූජනීය ස්ථානයක්ව අතීතයේ දී පැවතුනා වුව ද ප්‍රදේශයේ සංග්‍රාමීය වාසිය අපට වඩා හොඳින් කොටි ත්‍රස්තවාදීන් විසින් අවබෝධ කරගෙන ඇති බැවින් අද එම ප්‍රදේශය ත්‍රස්තවාදී තිප්පොලවල් බවට පත්ව ඇත. දිස්ත්‍රික්කයේ උතුරේ හා දකුණේ සීමා වල පිහිටි මෙම ස්ථාන වලට අමතරව දන්ත කුමරු හා හේමමාලී කුමරිය විසින් දන්ත ධාතුන් වහන්සේ රැගෙන ලක්දිවට ගොඩබට සේරුවිල අසල ඇති ලංකාපටුන අද ඉලංගතුරේ මොහොත්තුවාරම් නමින් කොටින්ගේ ප්‍රධාන ගමන් මාර්ගයක් බවට පත්ව ඇත. ඒ පමණක් නොව මහ පැරකුම්බාවන් විසින් බුරුම රට ආක්‍රමණය කරලීම සඳහා ලංකාධිකාරී කිත්ත සෙනෙවියා යටතේ ස්වකීය නාවික හමුදව පිටත්කරලු පල්ල වංකය හා ගල් වරාය අද දවසේ පොඩවකට්ටු හා කල්ලරාව නමින් ත්‍රස්ත තොටුපොලවල් බවට පත්ව ඇත.

තවත් නිදසුන් බොහෝ සෙයින් දැක්විය හැකි වුව ද ලිපිය කෙටි කරමින් අවසාන වශයෙන් කිවයුතු හා අවධාරණය කළ යුතු එක් කරුණක් සඳහන් කරමි. එනම් අද යුද්ධයේ දී කාලතුවක්කු හා ගුවන් යානා ආදිය යොද ගැනුන ද අවසන් වශයෙන් නියම ලෙස භූමිය අත්පත් කර ගැනීමට නම් දෙපයින් ගමන් කරන පාබල සේනාංක මගින් ජයග්‍රහණය ලබාගත යුතු, එද ඇත්, අස්, රිය, පාබල හමුදවට සංග්‍රාමීය උපකාරී වූ වැදගත් වූ යම් භූමි භාගයක් වේ ද අද පාබල සේනාංක වලට ද එම භූමිය එද වගේම වැදගත් වන්නේ ය. එබැවින් දැනට කෙරෙන මේ යුද්ධයේ දී අපේම මුතුන් මිත්තන් වූ පණ්ඩුකාභය. දුටුගැමුණු, වලගම්බා, විජයබා මහ පැරකුම්බා ආදී අපේම විරුවන් අපේම මිනිසුන් සමග එක්ව අපේම රට තුළ යුධ ජයග්‍රහන ලබාගත් අයුරු හැදෑරීම බොහෝ ප්‍රයෝජනවත් වනු ඇත. එවිට එම යුධ ජයග්‍රහණයන් හා මෙහි දැක් වූ සිතියම් සඳහන් සිද්ධස්ථාන අතර ඇති සබඳතාවන් පැහැදිලි වනු ඇත. එම සිද්ධසථානයන් මුදවාගෙන නැවත අප යටතට ගෙන වැඩි දියුණු කරලීමේ වැදගත්කම අවබෝධවනු ඇත. මෙතෙක් කල් අප විසින් මෙවැන්නක් හදරා කල්පනා කර බලා නොතිබුන ද කොටි ත්‍රස්තවාදීන් විසින් එවැනි හැදෑරීමක් කර ඇති බව කොටින්ට එරෙහි සටනේ දී මෙම ස්ථානයන්ගේ තාමත් ප්‍රබල කෙටි බලකොටු තිබීමෙන් මනාව වැටහේ.

**චන්ද්‍රානන්ද ජයතිලක**
මේජර් - 14 (සෙව්) ශ්‍රීලපාහ
2 වන අණදෙන නිලධාරී - 14 (සෙව්) ශ්‍රීලපාහ




### යාපනය දිස්ත්‍රික්කය

01 සමන්තුරේ (දඹපොලපටුන)
02 ගොටමළුවත්ත (කට්ටුපුලම්)
03 චීරාලෙයි
04 කඳුරුගොඩ (කන්ත රෝදය)
05 චුන්නාකම්
06 වඩ්ඩුවා කඩ්ඩු
07 උඩුවිල්
08 කොඩ්ඩියා වට්ටෙයි
09 මල්ලාකම්
10 වව්නිකුලම්
11 පුන්තූර්
12 මහියා පිට්ටි
13 නිලවරේයි
14 පුළලී
15 වල්ලිපුරම්
16 නාගදීපය
17 නාග විහාරය
18 අල්ලෙයි පිට්ටි
19 ඩෙල්ෆ්ට්
20 උරුතිරුපුරම්
21 තිලගොව්ව්

### මන්නාරම් දිස්ත්‍රික්කය

22 උරුවිල්
23 ගරුම්පුලියන්කුලම්
24 තිරුකැට්වෙරම්
25 පොන්නාර වන්නි

### වව්නියා සහ මුලතිව් දිස්ත්‍රික්ක

26 පන්තිතුදිරුප්පු
27 වෙන්තුවුලෙයි
28 උත්පල්නට්ටු
29 පතියන් කුලම්
30 ඉලෙන් තීරන් කුලම්
31 වෙල්ලියා විල්ලු
32 මොල්ලියාවල
33 කඩ්ඩමලෙයි
34 කොග්නරයන්කුලම්
35 ඉලුප්පන් කුලම්
36 කනකරයාන් කුලම්
37 තරුන්දන් කුලම්
38 කුරුන්දමූර්
39 මෙන්තුකුලම්
40 වටවින්තිකුලම්
41 තන්ඩුරමුඩ්ඩෙයි
42 සින්නපුවරසන් කුලම්
43 පුවරසන් කුලම්
44 මිකාළුවෙන්න් කුලම්
45 පන්නන් තම
46 තම්බකරාමලෙයි
47 තොව්ල්පුලියම් කුලම්
48 පලෙයි මොඩ්ඩෙයි
49 වෙඩික්කිනර්වලෙයි
50 තුකුමරන්කඩ්
51 නෙදුන්කරති
52 පෙරියමර ඉල්පෙයි
53 අරියමාදු
54 පෙරියකුලම්
55 වඩමආරච්චි
56 නෙදුන්කරනි
57 ඔඩවෙලිකුලම්
58 පිළිකුලම් ෆාම්
59 යටකුදුගාය
60 මළකෙයි
61 රජමිත්තක
62 නාතන්නාර
63 දූලනාගලෙණ
64 මහතලිතගම
65 ඩොලර් ෆාම්
66 මූර්ත මඩු
67 සෝනල්නිරවිය
68 තඩුබල ගම
69 කොකිලායි
70 කොකිලායි
71 තඹදූලම්
72 ඉරනෙයි
73 වඩමාරච්චි
74 චින්නපුරසම්කුලම්
75 බුරුන මඩු
76 ලුනුවරනගල
77 නොච්චි මොඩ්ඩෙයි
78 තපස්ස වෙලිය
79 ඕමන්තෙයි
80 තිරවිය
81 චිරප්පන්මඩුව
82 ගනිමරිප්පු කුලම්
83 ඔඩුවෙට්ටිකුලම්
84 පෙරියපුලියන් කුලන්මලෙයි
85 ඉරුපොතාන
86 නාම්බන් කුලම්
87 මාමඩුව
88 තිර විහාරය
89 මහ නාමවන් කොඩිය
90 මුදලිය කුලම්
91 ඔඩියමලෙයි
92 මඩුකන්ද බැඹුම්ගල
93 මන්නාකන්දල්
94 අලව්විලා (ඉරට්ට පෙරියකුලම්)
95 වොන්ගල
96 තරදී කුලම්
97 ඇටඹ ගස්කඩ
98 කරදින් කුලම්
99 මන්ත්‍රී විහාරය
100 මින්ඩු කන්ද
101 සමලන් උලම
102 නෙලුන් කුලම
103 වාඩින් කුලම
104 වෙහෙර බැන්ද වැව
105 හීවක් කුලගම
106 පාවක් කුලම
107 පාවක් කුලම
108 පාවක් කුලම
109 රාජ දොරේනේ ඉඩම
110 කෙට්ටි කුලම්
111 මොහොටන්කුලම
112 කලාරු
113 කලාරු අම්බා
114 මැණික් ෆාම්
115 ඉන්ටර් වක්ස් ෆාම්
116 අප්පා පිල්ලෙයිගේ ඉඩම
117 මුදලියාර් කුලම්
118 මොහොන්ටන් කුලම්
119 තන්නිමඩුව
120 වරිකොට්ටු උරු
121 කොන්නරයන් කුලම්
122 මහ උක්කුලන් කුලම්
123 ඉරට්ටෙ පෙරිය කුලම්
124 ගලකිරියාගම
125 පඩිවෙට්ටි කුලම්
126 හෙමයිලන් කුලම්
127 කළුකුන්දන් මඩුව
128 අලු ගල්ල
129 කල් තාන්නන් කුලම
130 උප්පුකුලම
131 පුහුල් මොටේ (පුල්මුඩෙ)
132 තිවුලන් කඩවල්
133 තිරියාය වනය
134 තිරියාය බුද්ධ ප්‍රතිමාව පෙදෙස
135 කුන්නවේලි අසල
136 මිදුවන් කුලම
137 සෙම්බිමලේ
138 කුන්නවේලි
139 කල්ලම්පත්තු
140 ගල් මඩුව
141 තුක්කවේලි අසල
142 පුලන් කුලම
143 විහාර බැඳි කන්ද
144 පස්වෙනි සැතපුම් කණුව අසල
145 අලන් කුලම්
146 පුල්ලියාන් කුලම
147 උතුරු ගට්ටුකුලම් පාත්
148 රන්ගිරි උල්පොත
149 තෝවරන් කඩවල

### ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

150 රිදී කන්ද
151 රිදී කන්ද
152 තමරවලව
153 වාරන්වාඩිය
154 කුඹුක් වලව
155 විල්පත කුලම
156 කුඹුක් වලව
157 මහදිවුල්වැව
158 මොරවැව
159 කිඹුල්පෙතියාව
160 මොරවැව
161 තප්බාලෙන් විහාරය
162 නාමල්වත්ත
163 මොරවැව
164 පරන්පන් ජානි
165 10 වෙනි සැතපුම් කණුව අසල
166 කවි සුනෙයි
167 විල්ගම් වෙහෙර
168 බොක්කුව අසල (153/13)
169 අන්දන් කුලම
170 කල්ලන් පන්තුව
171 කල්ලන් පන්තු හේන අසල
172 තේක්ක වත්ත
173 ගල්වැටියාව
174 මඩලන් ගමුව
175 ලංකා පටුන
176 සාම්පූර්
177 මූතූර් නටබුන්
178 මූතූර් නටබුන්
179 තෝපූර්
180 පූනේලා වැව
181 කන්තලේ (පෙට්ටුල් සෙඩ් අසල)
182 වේලූන්න
183 රාජ අසල
184 මෛත්‍රී වැව
185 කන්තලේ
186 කන්තලේ
187 කන්තලේ
188 වනේල
189 හීන් ගග (නටබුන්)
190 කන්තලේ
191 පට්ටි කිඹුල්
192 මන්ඩලගිරි විහාර
193 සේරුවිල
194 සෝමපුර දක්ෂිණාරාමය
195 සෝමපුර දක්ෂිණාරාමය
196 ආරාම කන්ද
197 කල්ලාර
198 පාවනෙයි
199 සේරුනුවර
200 විල්ගම්වෙහෙර
201 තිලිවෙඩ්ඩි
202 කන්තලේ
203 නිලහෙලගම
204 දෙහිමන්න
205 පල්ලෙවෙල
206 මාන්කුලම
207 තිරුමන්කුලම
208 වේරුගල්
209 තොන්න වෝලෙයි
210 පොරමඩු
211 තොඩනාව්ව්

### මඩකලපුව දිස්ත්‍රික්කය

212 තවුඩාගල
213 පට්යන්නගමලෙයි
214 කරුවකු කුලම්
215 ආකරාන
216 දම්බෙදියද්දගල
218 මාවොඩ්ඩි
219 නෙලුගල
220 කෝපාවලි
221 තියන්නල්ලිකුලම්
222 තිරිමුට්ටි පොලපන්සල
223 කොට වෙහෙර
224 හිරුගල
225 ලංකා විහාරය
226 රොට්ටෙ පන්සල
227 කින්නර ගල
228 මන්නල ඔය
229 ඔඹරනන්තලාව
230 සාන්ත මලෙයි (රහත් ගල)
231 පුලුකුනාව
232 පුල්ලුමලේ
223 වැන්වන් කොවිල

### අම්පාර දිස්ත්‍රික්කය

234 රාජගල
235 බක්කිල්ල
236 සමනලගල
237 කඳුරුගොඩ
238 පරණගම - බක්කිල්ල
239 නෝනාගොල්ල
240 වෙහෙර පුදුම
241 පාල්ලන් ඔය
242 සමන්තුරෙයි
243 බුද්ධන්ගල
244 කවුවන්නල
245 මලයාඩිකන්ද
246 කොක්නාහර ජනපදය
247 ගනේගම පන්සල
248 තිඹුලේ ගම
249 පතන්ගොඩ (පන්සල)
250 ඉලුක්පිටිය
251 වාවින්න
252 දික්පිටිය
253 කොට වෙහෙර
254 දීඝවාපිය
255 මුල්ලිකුලම්මලෙයි
256 කන්පිකුඩියාරු
257 තීරමලෙයි
258 මෝරන්වත්ත
259 වම්ම කුලම
260 කලි පොතාරු
261 මාන්පොට
262 සත්ගමින් කන්ද
263 රත්ගම්
264 කුලන්නුගේ
265 ඇත්ගල
266 කිරිවැටියාරු
267 පොතුවිල්
268 මුදුමහ විහාරය (පන්සල)
269 වක්නාව
270 ලාහුගල (කොට වෙහෙර)
271 මගුල් මහ විහාරය
272 පයරම්පොල
273 ලාහුගල
274 තිලගිරි ජනපදය
275 රත්‍රාවෙල පන්සල
276 කුඩුම්බිගල

# තල් අරඹේ සිට!



සැකසුම:
**මේජර් ඩීඑම් විජේරත්න ශ්‍රීලපාහ**

### හිතවත් පාඨකය !

උතුරේ හා නැගෙනහිර බංකරයේ රාජකාරියේ යෙදී සිටින ඔබ වෙත නිරතුරුවම ගලාඑන කවි සිතිවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන්ව ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් 'තල් අරඹේ සිට' වෙත ලැබීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න

සංස්කාරක, 'තල් අරඹේ සිට', වයිට් හැකල් සඟරාව, රෙම ශ්‍රීලපාහ, හමුද ජනපදය, පනාගොඩ



## දයාබර සෙබලුනේ...

සාමයේ සුදු නෙළුම්
දේශයේ පිපියන්.....
සුදු පරවි රෑන් විත්
අහස් කුස සරසපන්....
යුද්ධය තුරන් වී
සාමය පැතිරියන්....
සාමයේ පහන් වැඹ
මුළු රටම බබලපන්....

සෙ/113417
**ආසෙ ජයවීර ජේඑම්ආර්**
**8 ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම**

## පව් සෝදනු වස් නොව

ඉමහත් වෑයමින් රකින හදවත
දැවී අළුවන්නට ඉඩ නොදී
විඩාබර සියොලඟ
කරවටක් බොරදියේ බැස
දෝවනුයේ
පෙර බමුණු සිරිත් ලෙස

කාමසුකල්ලිකානු කිසිදක නොදටු අපි
මෙය නේරංජනාව යැයි සතුවාද නුඹ
සැඩ පහර ඉදිරියේ දැක
පසෙකට වන්නට සිතුන මුත්
ලැබෙයි අණ පෙරමුණට
ඉහලින් අප දියට බස්වා
පහළින් කුනිස්සෙකුට පවා යා නොහැකි
ලෙස
දැල් බැඳි අලෙන් ඇසෙයි සිනාසෙන හඬ

ඉමහත් වෑයමින් රකින හදවතඉහලින් අප
දියට බස්වා
පහළින් කුනිස්සෙකුට පවා යා නොහැකි
ලෙස
දැල් බැඳි අලෙන් ඇසෙයි සිනාසෙන හඬ

සෙ/5ඩී01571
**සාසෙ රංජිත් කුමාරසිංහ ඒජී**
5 ශ්‍රීලපාහ ඩී කණ්ඩායම
යුහ කඳවුර
කුච්චවේලි

## රැකගමු මව්බිම

සාමයේ මල් ඒ සුවඳ
ලක් බිම පුරා පැතිරේවා
යුද්ධයේ ගිනිදැල් මැකී
සාමයේ පරවියන් අප අතරට ඒවා
සිත් තුල සතුට පුබුදු වී
එකමුතු බව වැඩි වේවා

සෙ/11316 2
**ආසෙ ජයසිංහ එම්පී**
**8 ශ්‍රීලපාහ - "ඩී" කණ්ඩායම**




## සෙබළකුගේ සිතුවිලි

උතුරු නැගෙනහිර වෙන් කර තබන්නට
කොටියනෙ එපා කිසිවිටකදී සිතන්නට
සිංහල ලෙයක් ඇති සිංහල කොල්ලන්ට
මව් කිරි වල හයිය ඇත රට රකින්නට

යුධ අවි සුරතට ගෙන නිතරම කල් ගෙවන
සතුරාට මුහුණලා නිතරම කල් ගෙවන
බාදක බිඳන් තබනා මේ පය පෙරට
ආපසු ගන්නේ සාමය ඇති වුන කලට

සෙ/121772
ආසෙ රණසිංහ ඒඑල්
8 ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම

## COME TO SAVE MOTHERLAND

Setting son donsen't let
come to obvious tommorrow
No gods any where
It's devile paradise

Terror infiltrates
since it's fanceless
what happenes? who knows?
when will the peace come?

War is adverse
set fire young lives
No mercy in bullets
penetrate young hearts
Who makrs this worst
not the question comes
why you are not coming
to save motherland?

C/54153
2/LT CHANDRESEKARA SLLI
D coy 8 SLLI
EPS

## උතුරට ගිය හිමියන්ට

දින සති ගෙවී යයි විගසින් අතීතෙ ට
මනසින් දුක් විඳින්නේ ඔබ දැකගන් ට
හදුනක් නොමැති විට ලියැවන මා නම ට
ගත ගිනි ගොඩක දැවෙනවා ඒ වේලාව ට

මසකට එක වරයි ඔබ මා දැකගන් නේ
දවසට සිය වරක් මැරි මැරි උපදින් නේ
මනසට සුවය ලහ ඇති විට දනවන් නේ
සඳහට කවද ද ඔබ මා ළඟ නවතින් නේ

නුදුරේ රුදුරු වෙඩි හඬවල් ඇහෙනව ද
අඳුරේ සිටින විට නිදිමත දැනෙනව ද
පැදුරේ සතුරු ඉව අල්ලා බලනව ද
මිහිරේ අවිය සුරැකිව ලඟ තියෙනව ද
රට දැය සමය බේරා විගසින් එන් න
නිදහස් නිවහල්ව හෙට දින ගත වන් න
මතු පරපුරට හැකිවන සේ වැජඹෙන් න
හිමියනි ඔබ ගෙ ගත සවි බල වැඩිවෙන් න

යාපා පටුන ජය ගැනුමට හැකිවේ වා
එඩි බල පපා තව ඉදිරියටම යේවා
හෙණ සැර අකුණු මෙහෙයුම් තව සැර වේවා
"ජය සිකුරුමයි" කොටි බල මුළු සුන් වේවා


කරුණා රණවීර ද සිල්වා
පොළොන්නරුව (බිරිඳගෙන්)
15 ශ්‍රීලපාහ
බී කණ්ඩායම
පලෙයි හි සේවය කරන සැරයන් මේජර් ද සිල්වා යූඩීජීඑ වෙනුවෙනි

## ඇයට වැඩියෙන් ආදරෙයි ටී පනස් හය මා නුඹට

අනේක දුක් ගැහැට විඳ....
දහසකුත් පැතුම් මැද....
රුපුණුවන් නසා ලන්නට....
මගේ තනි නොතනියට....
චිත්ත ධෛර්ය නගා තැබුමට...
නිරතුරුව මගේ දිවි රැකීමට...
සුව යසස විමසුවේ සිය බිරිඳ නොව....

ඇය ද මා හා බහින් බස්විය...
නොවුනි වෙනසක් ඔබ සද මට....
විවිධ අදහස් හේතුවෙන් ඇය....
ගිය ද දිනකදී මගෙන් සමුගෙන....
නිදි යහනෙ නිරතුරුව හිඳ....
දිවිරකී නිබඳ ඔබ ලංව මා උණුසුමට..
ඇයට වැඩියෙන් ආදරෙයි ටී පනස් හය මා නුඹට

සෙ/302447
කෝප්‍රල් වීරසිංහ එස්
10 ශ්‍රීලපාහ පාලන කණ්ඩායම
512 බලසේනා මූලස්ථානය,
යාපනය




# සෙබළාගේ යුතුකම

ජීවිතයේ තරුණ සමය ලක් මව වෙනුවෙන්
පරිත්‍යාගයෙන් යුතුව
කාලය ගෙවන මේ තිම්තයේ
මාගේ උපන් දේශය
රැකීමට දරන උදර මෙහෙවරයි
දෙමාපියන් හා  නෑදෑ හිතවතුන්
තනිකර දමා යුධ බිමේ තනි වූ මා
කාලය ගෙවෙන මොහොතක් පාසා
සිහි කරන්නෙමි මේ මගේ
තරුණ සමයේ පරම යුතුකම බව

**සෙ/304358**
**ලාකෝ ලාල් කුමාර ආර්එම්ජී.**
6 ශ්‍රීලපාහ, මැද මූලය, තිසාවැව,
අනුරාධපුරය

රළු තුරන තිකටෙ තබාගෙන
දුක් සුසුම් හරිමින් දිවා රෑ දෙකේ
කඳුළු බොන දයාබර අම්මේ
අද දින දුක් වුවත් මගේ පුතා රණබිමේ කියා
නොහඬන්න නොතැවෙන්න.

ඔබ පෙවූ ලේ කිරිකර
එඩිය ගෙන මගේ සිතට
සුරතෙ රැදි ගිනි අවිය ගෙන සතුරන් නසන්නට
යන්නෙමි පෙරමුණට රණ බිමෙ

සතුරන් සොයාලා දීග් විජය පතුරාලා
සියලූන්ගේ රණ වික
මි පෙන්නලා
නුඹව පුද්නනට එන දිනය අතලහයි
එතෙක් ඉවසන්න මගේ දයාබර අම්මේ

**සෙ/309764**
**සාසෙ සුමිත් බණ්ඩාර එන්එම්**
**6 ශ්‍රීලපාහ, බී කණ්ඩායම, 094 බසේමු**
**වව්නියාව**

# නිදහස් ලොවක යළි අප හා එක් වන්න

රිවිරැස සහ සත්ජය හිදි මිය ගිය සෙබළ සොයුරනේ
නෙත පිනවූ ඔබේ හඬ නොඇසේය නොපෙනේය
ජීව මානව දැන් අපට එනමුදු කෝප්‍රල් කීර්තිරත්න,
කෝප්‍රල් නවරත්න, සාසෙ ජයවීර, සාසෙ සුමිත්තකුමාර,
සාසෙ චමින්ද, සාසෙ විජේසිරි, සාසෙ පෙරේරා යන
නාමය නිරතුරුවම හදවතෙහි ලැගුම්ගෙන ඇත සද
කල්හිම.

රටත් ලාංකීක දේශයත් ලෙයින් පෝෂණය කර
ජීවිත වලින් ජීවය කැවූ ආදරණීය රණ විරුවනි ඔබේ
ජීවිත පරිත්‍යාගයට සැබෑ අරුතක් අප ලබා දෙන්නෙමු
දේශයට ජනතාවට නිවහල්භාවය ලබා දෙන්නෙමු
ඔබ පැතූ ලොව ගොඩ නගන්නෙමු දිවි පුදන්නට අපට
ශක්තිය ලැබුනේ ඔබගේ ලේ වලිනි ජීවිත වලිනි අප ආ
මාවත අපේ පරපුරේ රණවිරු සිය ගණනකගේ ලේවලින්
පෙඟී ගිය එකක් හෙට අප යන මාවත තවත් දහසක්
ගණනකගේ ලේ වලින් තෙත් වෙයි. 'ජාතියේ නිදහසේ
නාමයෙන්, දේශයේ නිදහසේ නාමයෙන් අප යා යුතු එකම
මග එයයි. අප යන මාවතෙහි කොයිතරම් බිම්බෝම්බ,
බාධක තිබුනත් අපේ බලාපොරොත්තුව සපුරා ලන්නෙමු
රටට 'සාමයේ' නාමය ලබා දෙන්නෙමු කෙටි රකුසන්
පලවා හරින්නෙමු.


සතුරන් නසන්නට යුධ බිම වෙත යන්න
ඔබ වන් පුතුන් තවතව මතු බිහි වන්න
හැකි වෙයි අද හෙටම යුද්ධෙන් ජය      ගන්න
නිදහස් ලොවක යළි අප හා එක් වන්න

**සැරයන් චන්ද්‍රරත්න එච්ජීවීකේඩී**
**7 ශ්‍රීලපාහ**
**"බී" කණ්ඩායම**

# යුද්ධයේ නිමාවක් වේද?

යුධ බිමේ මල් පිපුනා - තුටු කඳුළු ගැලූවා
සිනාහරැලි ඇදී වියැකි ගියා
සිහිව මිතුරන් - මියැදුන යුද බිමේ.....
ඔබ හෙලු ලේ කඳුළු
රණ බිමේ මල් ලෙසින් පිපුණත්....
යුද්ධයේ නිමාවක් වේද....!
පතම් නිබඳවම නේක මල් පිපෙන්නට
යුද බිම් වසා පැතිරි
ලේ කඳුළු පුදනු නොහැකිව....

**සෙ/302795 ලාකෝ ගාමිණී ඊඑචීඑම්ආර්**
**10 ශ්‍රීලපාහ - පාලන කණ්ඩායම**




# රණ බිමෙන් තම දයාබර මවට

දස මසක් කුස දරා - සෙනෙහස් දීය පොවාලා
ආදරයේ අනුහසින් - පුතු ලොවට බිහි කලා
සිප් සතුර උගන්වා - නැණ නුවන පහදලා
මිහි දැයට දිරි දෙන්න - දිරි පුතුන් බිහි කලා

**සෙ/15787 සාසෙ රත්නායක ආර්එම්ටී**
**10 ශ්‍රීලපාහ - "ඒ" කණ්ඩායම**

# සෙබළ සිතිවිලි

පත්හිඳ දැත මත රැඳුන විට
පද වැලක් එක්වුනා සුදු කොළයකට
හද සසර නිමා කර බැලු හැම වාරෙකට
කුරුටු ගැ ඒ ගිය නිමාවිය සදවට

**සෙ/301028 සාසෙ කමලසිරි ඩබ්ළිඑල්**
**10 ශ්‍රීලපාහ - "ඒ" කණ්ඩායම**

# සෙබළ සිතිවිලි

සොල්දදුවෙක් ලෙසින්
පැමිණියෙමි උතුරට....
රට රකින හෙළ විරුවෙක් ලෙසින්
ගිනි අවිය ගත්තා සුරතට....
ජීවිතය නොතකා වෙහෙසුනා
නගන්නට සාමය....
එහෙත්... කෝ සාමයක්
නොපෙනුනෙමි තාම මට....

**සෙ/302795 ලාකෝ ගාමිණී ඊඑච්එම්ආර්**
**10 ශ්‍රීලපාහ - පාලන කණ්ඩායම**

# සෙබළ සිතට දිරිය දෙන්න...

රැදුරු ගිනිදැල් පවන් සුළඟින් හමාවිත් නිවි නිවී          යනවා
උතුරු යාපා පටුන තුළ දැන් සාමයේ මල් පිපි          එනවා
ගතින් කොතෙකුත් වෙහෙස වුවත් දේශයට නව පනක්          දෙනවා
නොබෝ දිනකින් සිහල රටතුළ නිදහසේ දොර විවර          වෙනවා

කලක් සතුරන් අතේ තිබුනත් උතුරු කොණ යාපනය          කොටුවේ
කිසිදුවිට නැහැ දමිළ මිනිසට සිහල විරුවන් උරන          ඌවේ
සැමගේ නිසහස සලස ගන්නයි මෙහෙයුමක් අරඹන්න          සිතුවේ
එයයි 'රිවිරැස' පළමු අදියර රුදුරු සටනක අරුත          පැවේ

ප්‍රබල වෙඩි වරුෂා මැදින් ගොස් සෙබල නෙත ගැටෙනා          සැනින්
නසා දැමුමට සිහල විරුවට හැකි වුනා උතුරේ          කොටින්
තවත් විටකදී ග-වන් හමුද පහර දුන්නා නේ          උඩින්
මෙවන් බළ මැද හතර පැත්තට දීවේ කොටියන් මර බයින්          බයින්

එද පැරකුම් විජය ගජබා නරිදුවන් රටදැය          රකින්නට
වෙහෙසවී වැඩ සිදුකලා එය අදත් ඇත සැමටම          දකින්නට
සැනින් සිදුවන සියළු උවදුරු බිඳ දමා සාමය          රකින්නට
අදත් එක්වී සිටි සැම දෙන දැයේ සම්පත ගැන          සොයන්නට

දහසකුත් පැතුමන් හදට ගෙන තල්වැටේ මායිමට          වීලා
කරණ යුතුකම් කොටස මැනවින් ඉටුකරණ බව ගතින්          පාලා
රටෙහි සාමය සැමගේ නිදහස රකින සෙම්පති ඔබයි          සෙබලා
සිංහලේ රජවරුන් විලසින් පෙරට යමු අපි එකට          බැඳිලා

**සෙ/304017 ලාකෝ පියසේන සේනාධීර ඒඩබ්**
**බළඇණි මූලස්ථානය**
**II වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදුව**
**යුධ හමුද කඳවුර, අරියාලෙයි, නුවර පාර, යාපනය.**

## සෙබල සොයුරාගෙන් සෙබල සොයුරෙක් වෙත

තල් අරඹේ කල් ගෙව්වත් අමතක          නොමවේවා
ගෙදර සිටින සැම සතුටින් වැජ          ඹේවා
අපට උරුම මව් භූමිය රැක          දේවා
හිත්පතිත් නැති කොටියට රට නොම          දේවා

**සෙ/307186 සාසෙ සමරසිං කේඒ**
**11 ශ්‍රීලපාහ "බී" ඛණ්ඩායම - අරියාලය**




# "කවදද යුද්ධය නිම වන්නේ"

අමු තල් කොලින් මැදි මහ පවුරක් උසට
රක්නා අපගේ මව්බිම නිරතුරුවම
උදේ ඉඳන් ර වෙනතුරු නිදි මරා
සතුරා එනතුරු මග බලමින් වුන්නේ

බැ ඉවසන්න බැ ඉවසන්න මගේ මව්බිම
අද මම හමුදවට බැඳි යුධ සෙබළෙකු ලෙසින්
ආවා පෙරට රට රැකුමට සෙබළෙකු ලෙසින්
පැවා සවිය මතු රැකෙන්නට මගේ මව්බිම

සෙ/309282 සාසෙ අබේවර්ධන කේඑ්ජී
11 ශ්‍රීලපාහ - බී කණ්ඩායම අරියාලය

# සුන්දර ලක්මව

ජීවිතය යෞවන කාලය යුධ බිමට
කැප කරන්නෙමි ලක් මව රැකුමට
මුලු රටටම විත කරන සතුරා නසන්නට
දිවිය පුද රැකගන්නම් මගේ ආදරණීය රට

ලස්සන සරුසාර වූ මගේ රට
කුඩා කල සිට මා හැදුන වැඩුනු රට
නොදෙන්නෙමි මේ රට දෙකට කඩන්නට
කොටියන් නසා රැක ගන්නම් මගේ රට

සෙ/1216 36
ආසෙ ෂෙල්ටන් උඩවත්ත
11 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම - අරියාලය

# දයාබර අම්මේ

නිසන්සල රටාවට
ජීවිතය ගලන විට
විසිතුරු වූ මායා දැල්
දැස් අග වෙලෙන විට
රැකවරණයට වී සදකල්
ඉනු මැනවි මා ලඟින්
උපදිනමතු මතුත්
ඔබ වෙයන් මගේම මැණි

සෙ/306142 ලාකෝ ආනන්ද පීජී
7 ශ්‍රීලපාහ. බී කණ්ඩායම

# ආදරණීය අම්මා වෙතටයි.

සම්මා සම්බුදු ගුණය සහ මව් ගුණ ගැයුම
නිම්මා නොවේ සිහිවෙයි හෙළ පස කියුම
නම්මා සිරස නවමින් මුව මුර පියුම
අම්මා වෙත ලියමි යුධ බිමේ සිට ලියුම

නෙත් යස ඉසුරු තිබුණත් මෙහි හැම තැනම
තික්ව ගුණ දහම බරවෙයි විපතටම
දුක් කරදර ඇතත් අම්මේ පෙර සිටම
යුධ බිම පරාදීසයක් මේ මට සදහටම

දස මස කුස හොවා මා හැදූ වැඩූ අම්මේ
මව්කිරි වලින් මගේ ගත සවියයි අම්මේ
සිහලෙන් ලෙයින් ජීවත් වන්නට අම්මේ
ඔබේ පුතු අවි දරා යුද වැද ඇත අම්මේ

සතුරෙක් අතිං මා මිය ගිය විට අම්මේ
ඔබ දුක් නොවනු ඒ ගැන සිතමින් අම්මේ
තිදහස් ලක් මවට ගරු කරමින් අම්මේ
මා වැනි පුතුන් තව බිහිවනු ඇත අම්මේ

සෙ/309333 සාසෙ මහින්දපාල ජේඑම්
11 ශ්‍රීලපාහ - බී කණ්ඩායම - අරියාලය

# සෙබල සිතින් පෙම්වතියට වදනක්

පාට දේදුනු සැදෑවේ ලියූ
මේ කතාවක් වන ආදරේ
සිතින් සවනට
නිහඬ ස්වරයෙන්
ගීතයක් වන ආදරේ
නිදි නොමැති රැ
කල්පනා ලොව
සිහිනයක් වන ආදරේ
හිරු තැන් මැද
පිනි බිඳක් ලෙස
වියැකිලා යයි ආදරේ
රත්තරන් හීන දැක දැක
කැදැල්ලක් තනන්නට
පාරමී පිරූ අහිංසක නෙතු දෙකට
කඩඳුලු තැවරූ ආදරේ.....

සෙ/00466
කෝප්‍රල් වීජේරත්න බීඑම්.
9ශ්‍රීලපොහ. "සී" කණ්ඩායම
අච්චුවේලි - පලාලි

# මගේ මැණියන්ට

අම්මාගේ දෙපා වැද ගෙදරින් පිටුපාලා
තිසරණ සරණ යන බව ඇය පැවසුවා
අම්මා කී වදන් හැමවිට රැව්දේවා
මගේ සිත අද ඇය ගාවයි මම උතුරට ආවා

අද මා සමග බංකරයේ සිටිනා මිතුරා
හෙට එයි අඩි හතේ පෙට්ටියේ අසුරා
ලෝකය කුමක් කීවත් මව්නි අද දරුණුයි සතුරා
පව් මිස පින් නැත අද නැසුවට සතුරා

නිදි නැතිව බංකරයේ සිටිනා විට
පිට පිට වෙඩි හඬක් ඇසුණා ඉදිරි පිට
වෙඩි හඬ මැද මා පිය මැන්නෙමි ඉදිරියට
ගිනියම් වූ උණ්ඩයක් වැටුනෙමි මගෙ වම් අතට

සෙ/307630 සායෙ ලාල් ඩීපී
11 ශිලපාහ - "බී" කණ්ඩායම, අරියාලය

# සෙබළ සිතුවිලි

තල් ගස් අතරින් සඳ එබිකම් කර
මව්බිම රැකුවේ කා නිසාදෝ
පසලොස්වක එනද පිච්ච මලක් ගෙන
පන්සල් යන්නට හැකි වේදෝ

අත රැදි ගිනි අවි ඉවත හෙලන්නට
දවසක් අප හට යළි එවිදෝ
සාමයේ දොරගුලු විවර කරන්නට
මේ ලොව කා හට හැකි වේදෝ

සෙ/305998 ලාකෝ විජේකුමාර
එච්ආර්එස්
7 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම

# ආදර අම්මාට

ආදර අම්මා අද උතුරෙයි මා ඉන්නේ
යුධ ගිනි මැදින් ඔබ නිතරම සිහිවෙන්නේ
ජීවිතේ කැප උනත් මව් බිම නැ දෙන්නේ
අම්මේ ඔබට කඳ සුරිඳුන් රැක දෙන්නෙ දෙන්නේ

තිබුනත් හිතක් අවුරුද්දට ගෙදර එන්න
තිබුනේ නැහැනේ යුධ අවි බිම තබන සිත
ඉඩ ලද විගස එන්නම් අම්මේ එදින
එදිනට බත් කටක් සුරතින් කවනු මැන

සෙ/303014 ලාකෝ රාජපක්ෂ ආර්එම්ජී
7 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම

# බංකර කවි මා නෙතින් දුටිමි

සටන් බිමේ බංකරයේ අවි අමෝරා සිටින හුදකලා මොහොතක. පාලුව, තනිකම මගහරවා සෙබලාගේ සිත් තුල ජනිත වන හැඟීම් ප්‍රකාශ කිරීමට අයෙක් නොමැති මොහොතක ඔහුගේ නෙත ගැටුනේ තාවකාලික බංකරයේ බිත්තිය සහ අඟුරු කැබෙල්ලයි. එහි ගැබ්කොට ලියූ කවි සහ අදහස් කොපමණ නිවහල් ද, එඩිතර හස්තයට දිවෙන සිතට අසීමිත අදහස් කෙසේ එකතුවී දැයි මට සිතින. එය පිවිතුරු ය. එම රණවිරුවා ඔහුගේ අදහස් ප්‍රකාශ කළ අන්දම මා මෙසේ දුටුවෙමි.

ජීවිතය ඇති තුරා - ඔබ මගේ යැයි කියා
නොගැයුවෙමි කිසි දිනෙක - ප්‍රේමයේ ගීතිකා
ජීවිත හුදකලා - මාවතේ තනි වෙලා
රැඳෙමි මම එදවසට- ඔබ පමණි වාසනා

ඔමුට එදවස කෙසේ නම් ලත්වී නොහැකිය අපට එයකීමට, කෙසේ හෝ එම සෙබලාට යමක් තේරී ඇති බව එම කවෙන් පෙනේ. සෙනෙහසට ජාතියක් හෝ ආගමක් නැත. බේදයක් ද නොවේ එය සැමද තරුණය.

පණවගේ හිටිය මගෙ ආදර සුදු කෙල්ල
මා වෙත යොමු කරන්නෙ දැන් එරවිල්ල
අඩවන් වූ දිවිය මට නැත සැනසිල්ල
දෙව්දුනි රයිපලය කළ මැන මට එල්ල

යුද බිමේ සිටින යුද සෙබලාට ආදරවන්තිය ගෙන් ලැබෙන ලිපිය ඉතා අගනා මැණිකකි. එම ආදරය වෙනතකට යොමු වී ඇති විටෙක ඇති වන හැඟීම් මේ යයි කිව නොහැක. ගෙදරින් ලැබෙන ලිපිය මවගෙන් ලැබෙන ලිපිය ඔහුට රටක් රාජ්‍යයක් ලැබුනා මෙන් පෙනේ. වෙනස් වන ලෝකයේ නොවෙනස් වන එකම ආදරය මවගේ ආදරය බව ඔහු දනී. ත්‍රිවිධ හමුදවේ සෙබලාගේ ආදර කෙල්ල සද අනාතයි යනුවෙන් ඔහු ලියුවේ අවිවේකය සෙබලාට උරුම වී ඇති බව දැනී විය හැක. මේ අතර, දෙවියන් පුදා යුද බිමට යන සෙබලා නොයෙක් වද වේදනා විඳ පාද, ජීවිත පවා අහිමි සද තමා බලාපොරොත්තු ඇති කළ ආදර බිරිඳ වැන්දඹුවක් බවට පත් විය හැකි මුත්, චේතනය තමාත් වැඩි නොවුයේ මන්ද යනු දෙවියන්ට මෙසේ ප්‍රකාශ කරයි.

ගෙදර දෙව්දුනි යදින සුරිඳුන් නිතර සිහිකර යුදට යන්නේ
නොයෙක් වද වේදනා විඳ විඳ පාද ජීවිත අහිමි වන්නේ
දරුවො සහ ප්‍රිය බිරිඳ 'වැන්දඹුවකව' සදහට දුක් විඳින්නේ
මෙවැනි අපගේ 'චේතනය' ඇති තාම දෙව්දුනි වැඩි නොවන්නේ

එක්වීමේ දී මුවින් සිනාසී - වෙන්වීමේ දී නෙතින් නොව හදවතින් හඩන්න යයි කියන මොහු 'මව් බිම වෙනුවෙන් දිවිදීම සදකල් ජීවත්වීමයි' කියයි. මෙම වීරෝධාර රණ විරුවන් මෙලක් පුතුන් කිසි දිනෙක පැරදී නිවට විය නොහැකි බවත්, ජීවිතය ලක් දෙරණ තුළ සැහවුවත් මව් බිම පර සතුරන්ට නොදෙන බව කියන්නේ අභිමානයෙනි.

තුවක්කුවට, කඩුවට, ගිණි බෝම්බෙට
මෙලක් පුතුන් පැරදී නැත කිසි දිනක
තවත් නිවට වනු බැහැ අම්මේ අපට
මලත් නොදෙමි මව් බිම පර සතුරන්ට

මේවා බංකර බිත්තියට අඟුරු කැබැල්ලකින්, එක් කලත්, කොපමණ එඩිතර හැඟීම් ඔහු තුළ ඇද්ද යනු නම් කෙසේ කිව හැකි ද? මෙම කවිය කෙතරම් විරෝධාර එඩිතර රණවිරුවෙකුගේ අදහස් හෘද සාක්ෂියට එකහව ලියා ඇති බව හැඟේ. එම හැඟීම් අතීතයට ද, වර්තමානයට ද, අනාගතයට ද ප්‍රයෝජනවත් විය හැක.

'ජීවිතයේ යථාර්තය හඳුනා ගත හැක්කේ සුපිපි මල් කැකුලකින් නොවේ. හමන ඉම්හිරි සුවඳකින් ද නොවේ. බුරා බුර නැගෙන ගිනි දැල් වලට මැදි වූ ජයග්‍රහණය කරා ඉදිරියට ඇදෙන යුද සෙබලෙකුගේ යසෝගීරාවකින් බව ප්‍රකාශ කරන මෙම විරුවන් ආහාරය පවා නොතකා රට රැකුමට වෙහෙසන අන්දම මෙසේ කියයි.

අපි වැරදි යයි කීවත් සමහරුන් රටේ
බත් ටික පවා කන්නෙත් හිඳ මරුගෙ කටේ
ආවත් කොතෙක් බිහිසුණු බලවේග රටේ
රැකගමි කෙලෙස හෝ මගෙ ලක් පබලු ඇටේ

ලක් මව රැක ගැනීම ඔහු සතු කාර්යයි. එයට ඔහු දිවුරුම් දී ඇත. එය ඔහුගේ යුතුකමයයි අභිප්‍රාය වී ඇත. වෙනත් බංකරයක ලියා තිබූ මෙම කවිය දෙස ද නෙත ගැටිණ.

රැයක් නිදි යැමට - වේලක් රසට කෑමට
බිරිඳ සැනසීමට - තුමණි අවසර ගෙදර යැමට

බත්කරයේ සිටින සෙබලාට නින්දක් නොමැත. ආහාරයෙන් හිඟයක් නොවුවත් මවගෙන්, බිරිඳගෙන් බත් කටක් කන්න කොපමණ සතුටු විය හැකි ද, විවාහකයෙකු නම් ස්වාභාවික හැඟීම් ඔහුට ද ස්වාධීන විය හැක. එසේ හෙයින් මෙසේ කවියට නැගුවා දැයි හැඟේ. මෙවැනි කවි බොහෝ එකතු කල මා ඉන් බිඳක් 'වයිට් හැකල්' සහරාවට එක් කිරීමට අදහස් කලෙමි. සාමාන්‍ය ජීවිතය හා හමුද දිවිය අතර පරතරයක් දකින සෙබලා රාජකාරියේ යෙදී සිටින විට තනි සිතට දැනෙන, හැහෙන, තෙරපෙන අදහස් අඟුරු කැබැල්ලෙකින් බිත්තිය සරසයි. කල්පනාවෙන් ඒවා කිය වූ මා යාපනය, පලාලි, වාසවිලාන්, කන්කසන්තුරය, අලිමංකඩ, පොයින්ට්පේද්‍රු මේ සියලූ ස්ථාන වලදී එකතු කළ සෙබළ කුරුටු ගී බිඳක් ඔබගේ ආශ්වාදය සඳහා පිටුවක් සරසන්ට උත්සාහ ගතිමි. සියලු ගී නොව ඉන් කොටසක් වන මෙය ශෘංගාර රසය හා හාස්‍යයට ලක් කල කවි අයින් කර ගත් ඒවා පමණකි. මේ.

ඇත්තටම සොල්දදුවා රටට ආදරෙයි. ඒකයි දිවි පරදුවට තබා මලත් කම් නැහැ කියල සටන් කරන්නෙ. රට වෙනුවෙන් සෙහෙසනෙ සෙබලාගේ වටිනාකම දන්නෝ ඉතා අල්පය. ඉන්දියාව පාකිස්ථානය වැනි රටවල බස් රථයකට නිල ඇඳුමෙන් සෙබළෙකු නගිනවිට සීට් එකෙන් නැගිට ඉඩ දෙන බවක් පෙන්නුම් කලත්, අප ශ්‍රී ලංකාව තාම එම තත්ත්වයට පත්වී නැත. කෙටියෙන් පවසනවා නම් යුද සෙබලෙකුට දුවක් විවාහ කර දීමට පවා මැලිකමක් දක්වයි. එම නිසා. ඔහුගේ සිතෙහි ඇති වන සාධාරණ හැඟීම් ප්‍රකාශ කිරීමට බත්කරය උපකාරී කර ගත්තා විය හැකිය. කැලේ ජීවත් වන ගෙරි මදු බුදින කොටියාගේ දතක් රත්තරනේබැඳ ලස්සනට කරේ දමා ගෙන සතුටු වන අයෙක් යුදපිටියේ මුහුණට, මුහුණලා සටන් කර රට වෙනුවෙන් ජාතිය වෙනුවෙන් දිවි පිදූ වීරෝධාර රණවිරුවෙකුගේ දතක් නම් කවදා කරේ පලඳයිද, විරාමයක් පමණි. වීරෝධාර සෙබලුන්ට මගේ ප්‍රණාමය තව තවත්, ඉදිරියට යැමට උට්ඨාන වීර්යය, චිත්ත ධෛර්යය ලැබේවා

**කපිතන් ඞී හර්බට් යූඑස්පී**
රෙම ශ්‍රීලසාහ, සනාගොඩ කඳුරල හෝමාගම

# සිතන්නට කාලය ඇවිත්

කඳුල සුසුම රැඳි අඳුරු ආගාද තුළ අවිවේකීව අසහනකාරීව හා පීඩාකාරීත්වයෙන් ගෙවන සෙබල ජීවිතය අනන්ත වූ අත්දැකීම් වලින් පරිපූර්ණය. අප අපගේ ජීවිතයේ වටිනාකම තක්සේරු කළ යුතු ද? නැත. එසේ කරතොත් එය බොළඳ ක්‍රියාවකි. විෂම වූ සමාජය විසින් එම තීරණය දෙනු ඇත. එම අවස්ථාව යහපත් පරිද්දෙන් ලබන්නට නම්, සොයුරනි, අපට විශාල කැපවීමක් කරන්නට සිදුව ඇත. නැතහොත් එය ලබන්නට අපහට අවස්ථාවක් නැතිව යනවා සේම, මතු පරපුරට ද එහි පලවිපාක ගෙවීමට සිදුවෙනු ඒකාන්ත ය. එසේ වීමට කිසිසේත් ඉඩ දිය යුතු නොවේ. අපට තව යාමට දිගු ගමණක් ඇත. ඒ ගමන යහපත් චේතනාවන් මත අධිෂ්ඨාන පූර්වකව යාමට සිතා ගනිමු.

ප්‍රිය සොයුර, මේ විෂම සමාජය තුලම හැදී වැඩෙන මිනිසා, මිනිසාට වෛර කරගන්නා තරමටම පහත් තත්ත්වයකට ඇද වැටී ඇත. ජාති, ආගම්, කුල බේද කරපින්නා ගෙන බුද්ධිය හැඟීම් වලින් වසාගෙන දෑස අන්ද වුවත් මෙන් ක්‍රියා කිරීම කොතරම් බේදජනකද? උසස් මනසක් හෙබි මිනිසා මේ තරම් පහත් නීච තත්ත්වයකට ඇද වැටුනේ මක් නිසා ද? ඊට එකම හේතුව මිනිසා තුළ ගුණ දහම් පිරිහී යාම බව මා දකිමි. අප කුමන ආගම් වාදියෙක් වුවත් එහි ගැටලුවක් නැත. ගැටලුව ඇත්තේ ආගම තුල නොවේ.

මිනිසා වියරුවී, තිරිසනුන් මෙන් ක්‍රියා කිරීමෙන් සුන්දර වූ ස්වභාවධර්මයා පවා අපට එරෙහි වී ඇත. එහි පළ විපාක අනන්තවත් අප විඳ ඇත්තෙමු. විඳින්නෙමු. අද තුරු සෙවනක් ලබන්නට ගහක් කොළක් නැත. නිසි කලට වැසි ලැබෙන්නේ නැත. කිව නොහැකි දහසක් දෙයින් මිනිසා හට දඬුවම් ලබන්නට සිදුව ඇත්තේ ස්වභාව ධර්මයට විරුද්ධව ක්‍රියා කළ නිසා නොවේ ද? අපට ඉතාම සතුටින් සිහිකළ යුතු පුරාණයක් එද අපේ මුතුන් මිත්තන් ගෙඩ නැගූ නමුත්, ඉන් ප්‍රයෝජන ගන්න අද අපේ සමාජය අපොහොසත් වීම කණගාටුවට කරුණකි.

අපේ පැරැන්නන් ලේ දහඩිය හෙලමින් ආගම මුල් කරගෙන මහා විශ්වකම් පාමින් නිදහස් උන්නතිය වෙනුවෙන් අවංකව ක්‍රියා කළ බව මනසේ දනිමු. එදත් ඒ මිනිසුන් අතර පිරිහී ගිය මිනිසුන් නොසිටියා නොවේ. ඒ අතලොස්සකි. නමුත් අද මිනිසා යන උතුම් මනසක් ඇති මේ සතා, තිරිසන් කොටසටම ඇද වැටී ඇත. මෙය පෙල බඳින මාද, ඔබ වැනි සාමාන්‍ය අයෙකි. සියලු කෙලසුන් දුරු කළ අයකු ද නොවේ. නමුත් ඒකායන අධිෂ්ඨානය ගුණදම් මත ජීවත් වීමටයි. ඒ පරමාර්ථය මත තව දුරටත් පෙල බඳින්නට පෙළඹෙමි.

මාගේ සහෝදර සෙබලුනි. මේ මත අප වැන්නවුන් හට ඉටු කිරීමට විශාල වගකීමක් ඇත. අප දෙස උසස් මනසක් හෙබි ඉන් මනාසේ ප්‍රයෝජන ගන්නා සමහරෙක් බලා සිටී. ඒ මත ඔබ මගේ ආදරණීය දෙමාපියන් මෙන් සහෝදර සහෝදරියන් ද සිටිති. ඔවුන් වෙනුවෙන් තව දිගු කලක් ජීවත් වෙමින් යහපත්ව ගොඩ නැගිය යුතු නිදහස් සමාජයක් ඇත. ඒ මත අපගේ ලේ දහඩිය හෙලීමට සිදුවනු ඇත. සමහර විට ජීවිතය පවා කැප කිරීමට සිදුවේවි. ඒ සියල්ල ජය ගන්නට නම් යහපත් ගුණදමින් අපේ සිත් පුරවා ගත යුතුයි. අත්දැකීම් මත මා මෙය දැක ඇත. ඒකාකාරී වීමෙන් අසහනකාරී වීමෙන් අප සමග ඉන්නා වූ සමහරක් බොළඳව අපට හෙටක් නැතැයි කියා සිතමින්, හිතු මනාපේ ජීවිත ගෙන යන්නට හුරුව ඇත. එසේ කරතොත් ඒ අපටම වල කැපීමක් කරගන්න බව සිතනු. බෙලහීන නොවන්න. ඔබ කුමන ආගම් ගාමියෙක් වුවත් කම් නැත. ලැබෙන සුලු මොහොතක පවා දැහැමින් ඔබේ ආගම සිහි කරන්න. එවිට නිරායාසයෙන්ම සිතට සහනයක් උපදී. ඔබට ද? මට ද? කුසගින්න දැනේවි. ඒ වෙනුවට අහිංසක සතෙකු මරා මස් කලහොත් ගෙවන්නට බැරි පාපයකි. සෙබලෙක් වූ පමණින් එසේ කරන්නට අපේ සමහර දෙනා පුරුදුව සිටී. සෙබලෙක් වූ නිසාම එය පාපයක් නොවේවැයි කියා නොසිතනු. ඔබ කලත් මා කලත් වෙන කවුරු හෝ කලත් පාපය පාපයකි. ඔබ නසන්න, මානසන්න එන සතුරා විනාශ නොකළහොත් ඔබ මා මෙන් ම ඔවුන් අපේ විශ්ව සමාජයම බිලි ගනීවි. එසේ හෙයින් සතුරා විනාශ කිරීම අපගේ වගකීමයි. යුතුකමයි. හොඳහැටි එය තේරුම් ගන්න. ඒ වෙනුවෙන් මුළු යහපත් වූ මිනිසු සමූහයාගේ ද, සියළු සත්ත්වයාගේ ද කරුණා බැල්ම අප වෙත ලැබේවි. ආශිර්වාදය අප වෙත ලැබේවි... ඊට විරුද්ධව යමෙකු යාවි නම්, එවැන්නෝ අකලට මිලිනව යාවි.

අතීතයේ මිනිසුන් හා සතුන් බොහෝම සමීප ව විසූ බව අසා ඇත්තෙමු. ඒ තරමටම ඈත අතීතයේ මිනිසුන් අහිංසකත්වයට නැඹුරුව සිටියා වෙන්න ඇතිත එද දොළොස් මහේ මිහිරි නද පතුරපු දොළොස් කුරුල්ලන් අද ඈතට පලා ගොස් ඇත. ඒ වෙනුවට අද ඇසෙන්නේ මිනිසාගේ විලාපයයි. ඒ වෙනුවට පෙනෙන්නේ මිනිසාගේ අභාග්‍යයි. තිරිසන් සතුන් පවා මිනිසා යන සතා පිලිකුල් කරනවා විය හැකියි.

මිනිසාගෙන් දුරුව වනයේ කැලෑ    කොල
එහිසයි බුදින්නේ අසරණ රිලා    මොල

සිතන්නට කාලය ඇවිත් . එසේ නම් පොඩ්ඩක් නවතින්න. මේ මහා සසරේ ඉන් ගොඩ වන්නට මේ ලද අවස්ථාව ගුණ දහමින් යුතුව ප්‍රයෝජනයට ගෙන අවස්ථාවක් කොට ගනිමු. මේ ලද මනුෂ්‍ය ආත්මය හිවලුන් මැද නතිවූ කුකුල් පැටවකු ඉන් මිදී ගැලවී ආ සමානයි. එසේ නම් ඒ කුකුල් පැටවා නැවතත් කළවැද්දෙකුට බිළිවිය යුතු ද, නැත. පොඩ්ඩක් නවතින්න. සිතන්නට කාලය ඇවිත්. සිතමු හැම විට අප යන මග හරිද කියා. වැරදි ඉවතලන්න හරිදේ සිතට ගන්න. පොඩ්ඩක් නවතින්න. සිතන්නට කාලය ඇවිත්. එක වතාවක් නොව දෙවතාවක් සිතන්න. මා හරිද? වැරදිද කියා

විශ්ව සමාජය එය තීරණය කරාවි
සැමට යහපතක්ම වේවා

**සෙ/301137 සාසෙ ලීලානන්ද ඩබ්පී**
**6 ශ්‍රීලපාහ - බුද්ධි අංශය**

## රණවිරු සිතක සාමයේ පැතුම

අම්මා පෙව්ව කිරිවල බල    පෙන්වන්න
උතුරට ඇවිත් යුද්ධය ගැන    දැනගන්න
සතුරන් නසන්නට ඔබේ ශක්තිය    වැඩි වෙන්න
එලෙසින් ඇවිත් මගෙ මවුබිම    රැකගන්න

ගින්නේ දැවෙන සිතකට දිය බිඳ    වේවා
අඳුරෙන් පිරුණ හදකට පහනක්    වේවා
මේ ගිනි අවිය මගෙ දෑතට හුරු    වේවා
සතුරන් නසන්නට ශක්තිය වැඩිට    වේවා

ආසයි අම්මෙ මම අද උතුරට    යන්න
උතුරට ආවේ මම කොටියන්    පන්නන්න
කිසිද නොදෙමි මගෙ මව් බිම සතු    රන්ට
වීර පුතෙකු ලෙස ආවේ මගෙ මවුබිම    රැකගන්න

**සෙ/18707975 සාසෙ සෙනාරත්න**
**එල්එඩබ්එම්ඩී**
**15 ශ්‍රීලපාහ - සී කණ්ඩායම, පලෙයි - යාපනය**










1 07 වන බළඇණි දිනයේදී අනි විසින් භට පිරිස් අමතීම (6 ශ්‍රීලපාහ)

2 ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථාන අධිපති 2/අනි සහ නිඅ වරුන් අමතමින් (6 ශ්‍රීලපාහ)


3 කොට්ට පොර තරගය (12 ශ්‍රීලපාහ)

4 ලිස්සන ගසේ නැගීමේ තරගය (8 ශ්‍රීලපාහ)

5 බ්‍රිගේඩියර් ජයසුන්දර විසින් අවුරුදු කුමාරි සංකේත ප්‍රධානය (8 ශ්‍රීලපාහ)






1 10 ශ්‍රීලපාහ ඒකකය විසින් නොච්මොඩෙයි ප්‍රදේශය නැවත අත්පත් කර ගැනීමෙන් පසු ආරක්ෂක නියෝජ්‍ය ඇමති යුද්ධ හමුදාපති සහ ඒකාබද්ධ මෙහෙයුම් ආඥාපති ප්‍රදේශය පරීක්ෂා කිරීමට පැමිණි අවස්ථාව

2 රෙජිමේන්තු අධිපති 10 ශ්‍රීලපාහ ගටපිරිස් යුධපිට්ටියේදී ඇමතීම

3 වැලිකතරක මෙහෙයුම පිළිබඳ 8 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී විසින් නිලධාරී අණදෙන්නන්හට නියෝග ලබාදෙමින්

4 14 (සේවා) ශ්‍රීලපාහ ඒකකය නගාසිටුවීමේදී ඒකක අණදෙන නිලධාරී විසින් සුභ මොහොතින් පොල්තෙල් පහන දල්වන අවස්ථාව

5 ජයසිකුරු මෙහෙයුමට සහභාගීව සිටියදී 4 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී සහ 8 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී සුහද හමුවීමක්

6 14 (සේවා) ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරී හට 6 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරී විසින් සුභ පතන අවස්ථාව